# පොල් සංවර්ධන අධිකාරිය

## වාර්ෂික වාර්තාව

## 2016

# පොල් සංවර්ධන අධිකාරිය

## අපගේ දර්ශනය

"පොල් කර්මාන්තය දළ දේශීය

නිෂ්පාදනය සඳහා

වැඩිලි ක්ෂේත්‍රයන් ඉහළතම

දායකත්වය ලබා දෙන්නා වීම සහ

නිෂ්පාදන අළෙවි විවිධාංගීකරණයේදී

ගෝලීය නායකයා වීම."

## අපගේ මෙහෙවර

**ගෘහස්ථ පාරිභෝජනය සහ කර්මාන්තය සඳහා**

**පොල් සහ පොල් නිෂ්පාදන සැපයුම**

**තහවුරු කිරීම මගින්,**

**පොල් කර්මාන්තය දීර්ඝ කාලීන වාණිජමය**

**ඵලදායීතාවය,තිරසාරත්වය හා ජාතික ආර්ථිකය**

**සඳහා ඉහළ දායකත්වයක් කරා**

**ගෙන ඒම සඳහා පහසුකම් සැපයීම**

# හැඳින්වීම

සමස්ත පොල් කර්මාන්තයේ සංවර්ධනය සඳහා 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනතෙහි “ පොල් සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ(මෙහි මින්මතු “ අධිකාරිය” යනුවෙන් සඳහන් කරනු ලබන)අධිකාරියක් පිහිටවනු ලැබිය යුතුය ” යන 111 වන කොටසේ 24 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ප්‍රධානතම ව්‍යවස්ථාපිත ආයතනය පොල් සංවර්ධන අධිකාරිය වේ.

පොල් සංවර්ධන අධිකාරියේ කර්තව්‍යයන් පනතේ 30(1) වගන්තිය අනුව පහත පරිදිවේ.

(අ) පොල් කර්මාන්තය සහ පොල් වගාවන් සිදු කරනු ලබන ඉඩම් හා පොල් වගාවන් සඳහා ඉඩම් ආර්ථික වශයෙන් ප්‍රයෝජන ගැනීම සම්බන්ධයෙන් සංවර්ධන ප්‍රමුඛතා පිළිබඳව තීරණය කිරීම හා ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා අමාත්‍යවරයා වෙත සහය ලබා දීම.

(ආ) එසේ තීරණය කරනු ලබන සංවර්ධන ප්‍රමුඛතා වලට අනුකූලව ව්‍යාපෘති හා යෝජනා ක්‍රම සකස් කිරීම හෝ සකස් කිරීම සඳහා සහය වීම.

(ඇ) එසේ සකස් කරනු ලබන ව්‍යාපෘති හා යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා සහය ලබා දීම.

(ඈ) මේ පනත යටතේ අමාත්‍යවරයා විසින් පිහිටුවා ඇති මණ්ඩලවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.

(ඉ) මණ්ඩලවල වාර්ෂික අය වැය අනුමත කිරීම හා ඔවුන් වෙත අරමුදල් ලබා දීම.

(ඊ) නිසි කළමණාකරණ ගිණුම්කරණ පද්ධති සකස් කිරීම ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම සඳහා මණ්ඩල වෙත උපදෙස් ලබා දීම හා සහය ලබා දීම.

(උ) අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන සංවර්ධන ප්‍රමුඛතා හා ප්‍රතිපත්ති සම්බන්ධයෙන් මණ්ඩලවල ප්‍රගතිය ඇගයීම.

(ඌ) පොල් කර්මාන්තය හෝ එහි නිෂ්පාදන පිළිබඳ යම් අංශයක් හෝ පොල් වගාවන් සිදු කරනු ලබන ඉඩම් හා පොල් වගාවන් සඳහා ඉඩම් ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් විද්‍යාත්මක පර්යේෂණ සිදු කරනු ලබන යම් තැනැත්තෙකුට හෝ පුද්ගල මණ්ඩලයකට (සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ ) මූල්‍ය සහ වෙනත් යම් ආකාරයක සහය ලබා දීම හා එවැනි පර්යේෂණ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

(එ) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සමාන හිමිකම් හා කර්තව්‍ය ඉටු කරනු ලබන ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගීතාවන්ට එළඹීම.

(ඒ) පොල් කර්මාන්තය කෙරෙහි බලපාන හෝ අදාල සියළු කාරණා පිළිබඳව අමාත්‍යවරයා වෙත උපදෙස් ලබා දීම.

(ඔ) පොල් කර්මාන්තය සංවර්ධනය කිරීම හා යළි පණ ගැන්වීම සඳහා අවශ්‍ය යැයි අධිකාරියේ මතය වන යම් සියළු පියවර ගැනීම.

**අධිකාරියේ බලතල පනතේ 31 වන වගන්තිය ප්‍රකාරව පහත පරිදිවේ.**

31 (1)අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි හෝ උචිත හෝ අනුෂංගික වන්නා වූ යම් සියළු ක්‍රියා සිදු කිරීමට වහා පියවර ගැනීමට අධිකාරියට බලතල තිබිය යුතුය.

(2) (1) වන උප වගන්තිය මඟින් පවරා ඇති බලතල ව්‍යාපෘතියට අගතියක් නොමැතිව 22 (2) වන වගන්තිය මඟින් විධිවිධාන සලස්වා ඇති සියළු බලතල මණ්ඩලය හා සමානව අධිකාරිය වෙත තිබිය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් යෝග්‍ය යැයි සළකනු ලබන විට ඔහු විසින් ගැසට් පත්‍රයේ කරනු ලබන නියමයක් මගින් 23 වන වගන්තිය මගින් විධි විධාන සළස්වා ඇති විශේෂ බලතල වලින් එකක් හෝ කිහිපයක් හෝ ඉන් යම් කොටසක් මණ්ඩලය හා සමාන ආකාරයෙන් අධිකාරිය වෙත පවරනු ලැබිය හැකිය.

පොල් කර්මාන්ත ක්ෂේත්‍රයෙන් ශ්‍රී ලංකාව 2016 වසරේදී රුපියල් බිලියන 84.7 කට ආසන්න විදේශ විනිමය ප්‍රමාණයක් ලබා ඇති අතර, පොල් හා ඒ ආශ්‍රිත කර්මාන්ත වලින් දළ දේශීය නිෂ්පාදනයට වාර්ෂිකව විශාල දායකත්වයක් ලබා දේ.

අමාත්‍යාංශය විසින් පොල් කර්මාන්තය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රතිපත්ති හඳුනාගෙන සකස් කිරීමේදී ඒ සඳහා සහාය දැක්වීමේ කාර්යයන් ඉටු කිරීමට අමතරව පොල් කර්මාන්තයේ පිරිසැකසුම් සහ අලෙවිකරණ අංශයන් සංවර්ධනය කිරීමේදී, අධීක්ෂණය කිරීමේදී මෙහෙයුම් කාර්යභාරය ක්‍රියාත්මක කිරීම උදෙසා කාර්යමය වශයෙන් පොල් සංවර්ධන අධිකාරියේ සැකසුම් සංවර්ධන අංශය, තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය, අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය, මුදල් අංශය සහ පාලන යනුවෙන් ක්‍රියාකාරී අංශ 5 කින් සමන්විත වන අතර එක් එක් අංශය භාරව අධ්‍යක්ෂවරයෙක් කටයුතු කරයි. මෙම කාර්යයන් ඉටුකරගැනීමේදී ඉංජිනේරු අංශය සහ අභ්‍යන්තර විගණන අංශය ඉහත අංශවලට සහය වේ.

සභාපති ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් කටයුතු කරන අතර අධිකාරියේ වැඩකටයුතු මෙහෙයවීම, අධීක්ෂණය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස් කරනු ලබන ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා හරහා සැකසුම් සංවර්ධන අංශය,තත්ත්ව පාලනහා තත්ත්ව ආරක්ෂණ අංශය ,අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය,පාලන අංශය හා මුදල් අංශයයේ අධ්‍යක්ෂවරුන් හරහා ඉටුකරනු ලබයි. මෙම අධිකාරීයේ අනුමත සේවක සංඛ්‍යාව 258 කි.2016 වර්ෂයේදී සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව 195 වූ අතර එම සේවක සංඛ්‍යාවෙන් 34 දෙනෙකු කළමනාකරණ මට්ටමේ අය වූහ.

# සභාපතිතුමාගේ සමාලෝචනය - 2016

ලෝක පොල් වගාවේ සිව් වන හිමිකරුවා වන ශ්‍රී ලංකාවේ ඇති පොල් වගා බිම් ප්‍රමාණය අක්කර 10,883,77ක් පමණ වේ. ඉන් 84 % පමණ හෙක්ටාර් 08 ට අඩු සුළු පරිමාණ වගා කරුවන්ගේ වගාවන් නියෝජනය කරන අතර ඉතිරි 16% ක්වූ පොල් වගා බිම් ප්‍රමාණය හෙක්ටාර 08 වැඩි වතු අංශය නියෝජනය කරයි.මුළු පොල් වගා බිම් ප්‍රමාණයෙන් 50% කට ආසන්න ප්‍රමාණයක් කුරුණෑගල, පුත්තලම, ගම්පහ යන පොල් ත්‍රිකෝණයට අයත් දිස්ත්‍රික්කයන්හි ව්‍යාප්තව පවතින අතර පොල් හා ඒ ආශ්‍රිත නිෂ්පාදනය කර්මාන්තයන්ගේ ඍජු හා වක්‍ර රැකියාලාභීන් ගේ සංඛ්‍යාව අති විශාලය.මිනිසාගේ සමාජ ආර්ථිකය කෙරෙහි පොල් ගස විශාල සබැඳියාවක් ඇති අතරපොල් ගසේ නිෂ්පාදන මිනිසා විසින් විවිධ කාර්යයන් සඳහා යොදා ගනියි.පොල් ජනතාවගේ දෛනික ආහාර වේලෙහි ප්‍රමුඛතාවක් ගන්නා අතර පොල් පරිභෝජනයෙන් ජනතාවගේ ආහාරයට අවශ්‍ය කැලරි ප්‍රමාණයෙන් 15%ක්ද ප්‍රෝටීන් ප්‍රමාණයෙන් 5%ක් හා මේද ප්‍රමාණයෙන් 70%ක් ලබා ගනියි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පොල් ඵලදාව ගෙඩි මිලියන 2500-3000 අතර පරාසයක පවතියි.නමුත් 2015 හා 2016 වසරවල මෙරට පොල් ඵලදාව යහපත් මට්ටමක පැවතිනි.ගෙඩි මිලියන 3011 ක්වූ 2016 වසරේ මෙරට පොල් ඵලදාවෙන් 60%ක් පමණ වැය වූයේ ගෘහස්ත පරිභෝජනය වෙනුවෙනි.ඒ අනුව දිසිදි පොල් පොල් තෙල් නැවුම් පොල් තෙල් කොප්පරා ,පොල් කිරි ,පොල් කිරි පිටි ,පොල් ක්‍රීම් හා පොල් ගෙඩි අපනයනය සඳහා ඉතිරි 40%ක්වූ ගෙඩි පොල් ප්‍රමාණය වෙන් විය.නමුත් පරිභෝජන හා කර්මාන්ත අවශ්‍යතා තුළනාත්මකව පවත්වා ගැනීම සඳහා මෙවැනි ඵළදාවක් කිසිසේත් ප්‍රමාණවත් නැත.ශ්‍රී ලංකාවේ පොල් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන භාණ්ඩ 150 කට ආසන්න ප්‍රමාණයක් නිපදවන අතර ඉන් තෝරාගත් ප්‍රධාන නිෂ්පාදන භාණ්ඩ 37 කට ආසන්න ප්‍රමාණයක් වාර්ෂිකව ලොව පුරා පිහිටි රටවල් 100 කට වැඩි ප්‍රමාණයකට අපනයනය කරයි.

පොල් කර්මාන්ත ඉතිහාසයේ ලබාගත් ඉහළම අපනයන ආධායම 2016 වසරේදී ලබාගත් අතර එය රු. බිලියන 84.7 ක් විය.2015 වසරට සාපේක්ෂව 13% ක වර්ධනයක් පෙන්වූ පොල් කර්මාන්තයේ අපනයන ආධායම 2016 වසරේ කැපී පෙනෙන ලෙස වර්ධනය වීම පොල් කර්මාන්ත ක්ෂේත්‍රය ලැබූ සුවිශේෂජයග්‍රහණයකි.විශේෂයෙන් පොල් මද ආශ්‍රිත අපනයනයන්ගේ කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණු අතර සක්‍රීය කාබන් හා කොහු කෙදි ආශ්‍රිත නිමි භාණ්ඩ වන ටුවයින් කොහුබත් පොල් ලෙලි කැබලි හා උද්‍යාන වගාවන් සඳහා යොදා ගන්නා කොහු ආශ්‍රිත නිශ්පාදන අපනයනයන්ගේකැපී පෙනෙන වර්ධනයක් දක්නට ඇත.

වැවිලි කර්මාන්ත අතර දල දේශීය නිෂ්පාදන සඳහා ඉහළම දායකත්වයක් පොල් කර්මාන්තයෙන් ලබා දීම සහ නිෂ්පාදන අලෙවි විවිධාංගීකරණයේදී ගෝලීය නායකයා වීම යන පොල් සංවර්ධන අධිකාරියේ දර්ශනය අනුව යමින් පොල් කර්මාන්තයේ අපනයන ආදායම වසරින් වසර ඉහළ නැංවීම පොල් සංවර්ධන අධිකාරියේ ප්‍රධාන ඉලක්කයයි.වසර 2020 දී ශ්‍රී ලංකාවේ මුළු අපනයන ආදායම ඇ.ඩො.බිලියන 20 දක්වා ඉහළ නැංවීමට රජය බලාපොරොත්තු වන අතර ඒ සඳහා ඩො.බිලියන 01 ක දායකත්වයක් ලබා දීමට (එනම් 5% ක දායකත්වයක්)පොල් සංවර්ධන අධිකාරිය බලාපොරොත්තුවෙයි.එම ඉලක්කය කරා ගමන් කිරීමේදී පොල් සංවර්ධන අධිකාරිය මුහුන දෙන ප්‍රධාන ගැටළු සඳහා නිසි විසඳුම් සොයමින් ඉදිරි වසර කීපය තුළ අදාල ඉලක්ක කරා ගමන් කිරීමට හැකිවනු ඇතැයි බලාපොරොත්තු වන අතර මෙම කාර්යයේදී පොල් කර්මාන්තය සංවර්ධන ඉලක්ක කරා මෙහෙයවීමට නිරතුරුවම උපදෙස් ලබා දෙමින් ඒ සඳහා මග පෙන්වන වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු

නවීන් දිසානායක මැතිතුමාටත් අමාත්‍යාංශයේ ලේකම්තුමාටත් මෙම කාර්ය ඉටුකිරීමට කැපවන පොල් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුලු සියලුම කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තුතිය පුද කරමි.



උදය රූපසිංහ
සභාපති
පොල් සංවර්ධන අධිකාරිය

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය - 2016

ගැමි ජන ජීවිතයෙන් පරිභෝජනය ආරම්භ වූ පොල්, වර්තමානය වන විට සමස්ථ ශ්‍රී ලාංකීය ජනතාවගේ ජීවන රටාව හා බද්ධ වී ඇත. ඒ නිසාවෙන් වර්තමානය වන විට එය සමස්ථ රටේම කප්රුක බවට පත් වී ඇත.

ගෘහස්ථ පරිභෝජනයෙන් එපිට විශාල විදේශ විනිමයක් ඉපැයිය හැකි, විශාල වෙළඳ පොළ වටිනාකමක් ඇති විවිධ නිෂ්පාදනයන් නිෂ්පාදන කළ හැකි කර්මාන්තකරුවන් අතර තරඟකාරී මෙන්ම සුවිශේෂී ස්ථානයක් හිමිකර ගැනීමට පොල් ශාකය සමත්ව ඇත. සැබවින්ම පොල් යනු ගැමි ජන ජීවිතයෙන් පරිභෝජනය ආරම්භ කොට වර්තමානය වන විට ලෝකයේ රටවල් විශාල සංඛ්‍යාවක් පරිභෝජනය කරනු ලබන අංගයක් බවට පත් වී ඇත.

භූමි ප්‍රමාණයෙන්56%ක් පමණ කුරුණෑගල, පුත්තලම, හා ගම්පහ යන පොල් ත්‍රිකෝණයට අයත් දිස්ත්‍රික්ක වල ව්‍යාප්තව පවතින අතර, පොල් හා ඒ ආශ්‍රිත කර්මාන්ත වැඩි ප්‍රමාණයක් ද ඒ ආශ්‍රිතව කේන්ද්‍ර ගත වී ඇත.

ශ්‍රී ලංකාවේ වාර්ෂික පොල් ඵලදාව ගෙඩි මිලියන 2500-3000 ත් අතර ප්‍රමාණයකි. ඉන් 65%ක් පමණ වැය වන්නේ දේශීය ගෙඩි පොල් සඳහා වන අතර , ඉතිරිය පොල් මද ආශ්‍රිත අපනයන කර්මාන්තය (දිසිදි පොල්, කොප්පරා, පොල් කිරි, පොල් කිරි පිටි, පොල් ක්‍රීම් හා ගෙඩි පොල් අපනයනය) සඳහා  බෙදී යයි.

පොල්, ජනතාවගේ දෛනික ආහාර වේලෙහි ප්‍රමුඛතාවයක් ගන්නා අතර, පොල් පරිභෝජනයෙන් ජනතාවගේ ආහාරයට අවශ්‍ය කැලරි ප්‍රමාණයෙන් 15%ක් ද, ප්‍රෝටීන් ප්‍රමාණයෙන් 5%ක් හා මේද ප්‍රමාණයෙන් 70% ක් පමණ ලබා ගනී. මේ වන විට පොල් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන භාණ්ඩ 150 කට ආසන්න ප්‍රමාණයක් දේශීය වශයෙන් නිෂ්පාදනය කෙරෙන අතර , ඉන් ප්‍රධාන භාණ්ඩ 35 කට ආසන්න සංඛ්‍යාවක් වාර්ෂිකව ලොව පුරා පිහිටි රටවල් 125 කට පමණ අපනයනය කෙරේ.

ගෘහස්ථ පරිභෝජනයේදී සිදුවන පොල් නාස්තිය අවම කිරීමෙන් ඒ තුළින් ඉතිරිවන ගෙඩි පොල් දිසිදි පොල් කර්මාන්තය ඇතුළු පොල් මද ආශ්‍රිත කර්මාන්ත සඳහා යොදා ගැනීමටද, දැනට භාවිතයට නොගෙන අපතේ යන පොල් කටු හා පොල් ලෙලි ක්‍රමවත් පරිදි එක්රැස් කර ඒවා අදාළ කර්මාන්ත සඳහා නිසි පරිදි යොමු කිරීමටද දීප ව්‍යාප්ත වැඩ පිළිවෙලක් පොල් සංවර්ධන අධිකාරිය මේ වන විටත්  ආරම්භ කර ඇත.අගය එකතු කල භාණ්ඩ නිෂ්පාදනයට වැඩි නැඹුරුතාවක් මේ වන විට බිහිව ඇත. ජාත්‍යන්තර වෙළඳපොල අවශ්‍යතාව මනාව හඳුනා ගනිමින් ඊට ගැලපෙන ගුනාත්මක නිෂ්පාදන බිහිකිරිමේ පෙළඹවීමක් ඇත.

වඩාත් උසස් පොල් නිෂ්පාදන අපනයනය කිරීමට ශ්‍රී ලංකාවට හැකි වන අතර, විදේශ වෙළඳපල තුල ශ්‍රී ලංකාවේ කීර්ති නාමය තව දුරටත් ආරක්ෂා කර ගනිමින් මෙම නිෂ්පාදන සඳහා පවතින විදේශීය වෙළඳපල තව දුරටත් පුළුල් කර ගැනීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය නිරතුරුවම ක්‍රියාත්මක වෙයි.

පෙර වර්ෂවල මෙන් මෙම වසරේදී පොල් සංවර්ධන අධිකාරියේ කටයුතු සාක්ෂාත් කරගැනීම සඳහා ගරු නවීන් දිසානායක අමාත්‍යතුමන් හා ලේකම්තුමන් විසින් කරනා ලද මඟපෙන්වීම කෘතඥතා පූර්වකව

සිහිපත් කරනු කැමැත්තෙමි. ශ්‍රී ලංකාවේ දේශීය පොල් කර්මාන්තය නඟා සිටුවීම මෙන්ම, විදේශීය වෙළඳපොල අවස්ථා වැඩි දියුණු කරගනිමින් තරඟකාරී අපනයන ක්ෂේත්‍රය ජයගැනීම සඳහා පොල් කර්මාන්තයේ නව පිබිදීමක් ඇති කරලීමට කටයුතු කළ හැකි බව මා විශ්වාස කරන්නෙමි.

ආර්.ඒ.ඩී.එස් රණතුංග
අධ්‍යක්ෂ ජනරාල්
පොල් සංවර්ධන අධිකාරිය

**2016 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා අධ්‍යක්ෂ**

**මණ්ඩල සාමාජිකයින්**

1. එච්.කේ උදය රූපසිංහ මයා-සභාපති
2. ජයන්ත ජයවර්ධන මයා
3. කපිල යකන්දාවල මයා
4. ජී. සූරියප්පෙරුම මයා
5. ආර්.බී.අත්තනායක මයා
6. එෆ් දේවසිරිවතම් මයා
7. එස්.පී ජයරත්න මයා
8. ඩබ්.එම්.වයි.ටී ප්‍රනාන්දු මෙනවිය
9. එන්. එස් වනසිංහ මයා
10. ආර්.එම්.ඩී.කේ. නාමල් බණ්ඩාර මයා
11. චමින්ද ගමගේ මයා
12. එම්.සී.ඩී.වී අපොන්සො මයා

## සභාපති ඇතුළු අංශ ප්‍රධානීන්

| | | |
|---|---|---|
| 1 | .එච්.කේ.යූ.කේ රූපසිංහ මහතා | - සභාපති |
| 2. | ආර්.ඒ.ඩී.එස් රණතුංග මහතා | -අධ්‍යක්ෂ ජනරාල්(වැ.බ) |
| 3. | ඒ.ටී.රණසිංහ මහතා | -ඉංජිනේරු |
| 4. | එස්.එස්.පුරසිංහ මහත්මිය | -අධ්‍යක්ෂ(තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ) |
| 5. | එස්.එස්.රාජකරුණා මහත්මිය | -අධ්‍යක්ෂ(පරිපාලන) |
| 6. | එම්.පී.සන්ධ්‍යා කාන්ති මහත්මිය | - අධ්‍යක්ෂ(මුදල්) |
| 7. | එච්.වී.පී.විජේවර්ධන මහතා | - අධ්‍යක්ෂ(සැකසුම් සංවර්ධන) |
| 8. | එච්.එම් වාසුලා හේරත් | -අධ්‍යක්ෂ (අලෙවි සංවර්ධන හා පර්යේෂණ) (2015.10.07-2016.07.01 දක්වා වැඩ බැලීය) |
| 9. | පී.ඒ.එස්.කේ සම්පත් සමරවික්‍රම | (2016.07.01 දින සිට) |
| 10. | ඩබ්.එම්.ටී.එස්.වීරසූරිය මහතා | -අභ්‍යන්තර විගණක |

# 2016.12.31 දිනට සංවිධාන ව්‍යුහය




**කෙටි යෙදුම් :**

1. ජ්‍යෙෂ්ඨ කළ. - ජ්‍යෙෂ්ඨ කළමණාකරණ මට්ටම
2. ස/නිඅධ්‍යක්ෂ- සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ
3. කළ. මට්. - කළමණාකරණ මට්ටම
4. අභ්‍යන්තර වි.නිලධාරී- අභ්‍යන්තර විගණන නිලධාරී
5. පරි.නිලධාරී - පරිපාලන නිලධාරී
6. ආර්.පර්. නිලධාරී- ආර්ථික පර්යේෂණ නිලධාරී
7. සැ.සං.නිලධාරී - සැකසුම් සංවර්ධන නිලධාරී
8. තත්.පාලන නිලධාරී- තත්ත්ව පාලන නිලධාරී
9. කණි.කළ - කණිෂ්ඨ කළමණාකරණ මට්ටම
10. අලෙ.සං. හා.පර්. - අලෙවි සංවර්ධන හා පර්යේෂණ
11. තත්.පා.හා ආර. තත්ත්ව පාලන හා ආරක්ෂණ

# පටුන

පරිච්ඡේද අංක


| | |
|---|---|
| සැකසුම් සංවර්ධන අංශය | **01** |
| තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය | **02** |
| අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය | **03** |
| පරිපාලන අංශය | **04** |
| මුදල් අංශය | **05** |
| විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව | **06** |
| විගණකාධිපති වාර්තාව | **07** |

## 01.සැකසුම් සංවර්ධන අංශය

පොල් ආශ්‍රිත කර්මාන්ත නියාමනය කිරීම සඳහා ඍජුව කාර්යයේ නියුතු සැකසුම් සංවර්ධන අංශය ප්‍රධාන වශයෙන් පහත කාර්යයන් ඉටු කරනු ලබයි.

- පොල් ආශ්‍රිත කර්මාන්ත නියාමනය කිරීම
- පොල් ආශ්‍රිත කර්මාන්ත ඒකක ලියාපදිංචි කිරීම සහ දෛනික පරීක්ෂා කටයුතු සිදු කිරීම
- පොල් ආශ්‍රිත කර්මාන්ත සඳහා නවීකරණ වැඩසටහන් සඳහා සහය වීම
- පොල් මද ආශ්‍රිත කර්මාන්ත සඳහා ISO 22000 ආහාර සුරක්ෂිතාව පිලිබඳ තත්ව සහතික ක්‍රමවේදය අනිවාර්ය කිරීම සහ පොල් මද නොවන කර්මාන්ත සඳහා යහපත් නිෂ්පාදන පිළිවෙත්(Good Manufacturing Practices)තත්ව පද්ධති යන අන්තර්ජාතික තත්ව සහතික ලබා ගැනීම අනිවාර්ය කිරීම් තුලින් නිෂ්පාදන ක්‍රියාවලිය සහ නිම් නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම
- පොල් ආශ්‍රිත කර්මාන්ත ආයතන, ගබඩා උපකරණ සහ යන්ත්‍රසූත්‍ර පරීක්ෂා කිරීම, නියාමනය කිරීම
- පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය මූල්‍යමය සහය සඳහා මඟ පෙන්වීම යටතේ බැංකු ණය පහසුකම් ලබා ගැනීම සඳහා මඟ පෙන්වීම, පොලී සහන ලබා දීම
- දිසිදි පොල් කර්මාන්ත සඳහා මෝල් සංවර්ධන අරමුදල යටතේ නවීකරණ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම
- නිෂ්පාදනයේ නොයෙදෙන කාල වලදී සේවකයන්ගේ වැටුප් සහන සඳහා මූල්‍ය ප්‍රතිපූරණ සිදු කිරීම

ඉහත කාර්යන් තුලින් පොල් ආශ්‍රිත කර්මාන්ත නියාමනය කිරීම ඔස්සේ නිෂ්පාදනයන්හි ගුණාත්මක බාවය වර්ධනය කිරීම තුලින් ඉලක්කගත අපනයන ආදායම් වර්ධනය කර ගැනීම අපේක්ෂිතය.

2016 වර්ෂයේ සැකසුම් සංවර්ධන අංශය විසින් ක්‍රියාත්මක ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

1. පොල් ආශ්‍රිත කර්මාන්ත ලියාපදිංචි කිරීම සහ පරීක්ෂා කිරීම
2. පොල් නිෂ්පාදන සඳහා ක්ෂුද්‍රජීවී සහ භෞතික තත්ව සහතික නිකුත් කිරීම
3. පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන් සඳහා මහජන බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා එක්ව ක්‍රියාත්මක කරනු ලබන සහන පොළී ණය යෝජනා ක්‍රමය
4. දිසිදි පොල් නිෂ්පාදන ආයතන සඳහා මෝල් සංවර්ධන අරමුදල යටතේ නවීකරණ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම
5. පොල් මද ආශ්‍රිත කර්මාන්ත සඳහා ISO 22000 ආහාර සුරක්ෂිතාව පිලිබඳ තත්ව සහතික ක්‍රමවේදය සහ පොල් මද නොවන කර්මාන්ත සඳහා යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) තත්ව පද්ධති යන අන්තර්ජාතික තත්ව සහතික ලබා ගැනීමේ ක්‍රමවේදයන්හි විගණන කටයුතු සඳහා දායකත්වය ලබා දීම




රූපය 1. පොල් මද ආශ්‍රිත නිෂ්පාදන අයදුම් කිරීම්




රූපය 2 : පොල් කොහු කෙඳි, උපස්ථර හා පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන සඳහා අයදුම් කිරීම්

පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනවල තත්වය උසස් කිරීමත් එමගින් විදේශ වෙළඳපොළ ඉලක්ක කරමින් සිදුවන නිෂ්පාදන සඳහා වැඩි අපනයන ආදායමක් උත්පාදනයත් අරමුණු කරගනිමින් වාර්ෂික ලියාපදිංචිය සඳහා පද්ධති සහතිකකරණය අවශ්‍යතාවක් ලෙස හඳුන්වා දෙන ලදී ඒ අනුව .සාම්ප්‍රදායික පොල් තෙල් , කොප්පරා හා පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත හැරෙන්නට සියලුම පොල් මද ආශ්‍රිත නිෂ්පාදන සඳහා, පසුගිය වර්ෂයේ හඳුන්වාදෙන ලද ISO 22000:2005 ආහාර ආරක්ෂණ කළමනාකරණ පද්ධති සහතිකයත් කොහුබත් උපස්තර හා කොහු කෙඳි නිෂ්පාදකයන් සඳහා හඳුන්වාදෙන ලද යහපත් නිෂ්පාදන භාවිතාවන් පිළිබඳ සහතිකයත් ලියාපදිංචි කිරීමේදී අවශ්‍යතාවක් බවට පත් කරලීමේ මූලික පියවර තබන ලදී.ඒ අනුව ලියාපදිංචි ආයතන නිෂ්පාදකයන් 65%ක් ISO 22000:2005 පද්ධති සහතික ලබාගත් ආයතන වන අතර කොහු කෙඳි ආශ්‍රිත නිෂ්පාදකයන් හා කොහු බත් උපස්තර ආශ්‍රිත නිෂ්පාදකයන් 12%ක් යහපත් නිෂ්පාදන භාවිතාවන් පිළිබඳ සහතිකලාභීන් වේ.

වර්ජින් පොල් තෙල්(Vergin Oil) ක විශාල කර්මාන්ත ප්‍රමාණයක්පොල් තෙල් නිෂ්පාදන ක්ෂේත්‍රය තුළ ඇති කරමින් ඉතා ඉක්මනින් වර්ධනය වූ කර්මාන්තයකි.එවැනි කර්මාන්ත 108ක් 2016 වර්ෂයේ ලියාපදිංචිය සඳහා අයදුම් කර තිබුණි.ඉන් ආයතන 80ක් 2016 වර්ෂයේ ලියාපදිංචිය සහතිකය ලබාගන්නා ලදී.ඒ සඳහා විවිධ පොල් තෙල් ප්‍රමිති වර්ග වල පිරිවිතර අනුව වෙන වෙනම අයදුම්පත් කැඳවන ලදී .එමගින් ලැබෙන දත්ත එකී කර්මාන්ත වල වෙළඳපොළ නිරීක්ෂණය කිරීමටත් නියාමන කාර්යයයේ දිෂානතිය තීරණය කිරීමටත් යොදාගත හැකි විය.වෙළඳපොළ ඉල්ලුම අනුව නව කර්මාන්ත ලෙස මේරූ පොල් මද වියළීමෙන් නිස්සාරණය කර ගන්නා සුදු පොල් තෙල් නිෂ්පාදනය සඳහා සැලකිය යුතු කර්මාන්තකරුවන් පිරිසක් අවතීර්ණ වී ඇති බව නිරීක්ෂණය කළ හැකි විය.




රූපය 3 : විවිධ පොල් තෙල් කර්මාන්ත වල ලියාපදිංචි කිරීම

අගය වැඩි කළ පොල් මද නිෂ්පාදන කර්මාන්ත අතර පොල් කිරි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත සඳහා හා ඒ සඳහා විශාල වශයෙන් ආයෝජනය කරමින් කර්මාන්ත ආරම්භ කිරීමට සැලසුම් කරන බවත් ආරම්භ කරන බවත් ලැබුණු අයදුම් පත් හා ඉල්ලීම් වලින් තහවුරු විය .පොල් කිරි,පිටිකළ පොල් කිරි, පොල් ක්‍රීම් හා පොල් තලප සඳහා සාපේක්ෂව වැඩි අයදුම් පත් සංඛ්‍යාවක් ලැබී තිබුණි. සාපේක්ෂ වර්ධනයක් පෙන්නුම් කර ඇත එහි

විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ඉපයිය හැකි කර්මාන්තයක් බවට පොල් වතුර කර්මාන්තය පත් වෙමින් පවතී.ඒ සඳහා අයදුම්පත් 28ක් ලැබී තිබුණු අතර ඉන් 20ක් සඳහා ලියාපදිංචි සහතික නිකුත්කර ඇත.පොල් මද කර්මාන්ත වල අපද්‍රව්‍යයක් ලෙස ඉවතලමින් පවතී.පොල් වතුර වෙළඳපොල වටිනාකමක් සහිත නිෂ්පාදනයක් බවට පත්කිරීම අනිවාර්ය බව සියළු පොල් මද ආශ්‍රිත කර්මාන්තකරුවන් වෙත දන්වන ලදී.එමගින් එකී කර්මාන්තය සඳහා වැඩිපෙළඹීමක් ඇතිකිරීමට පොල් සංවර්ධන අධිකාරිය සමත් විය.ඒ අනුව පොල් මද ආශ්‍රිත කර්මාන්ත වල එක්රැස් වන පොල් වතුර ආකාරයෙන් සැපයීමට කර්මාන්තය තුව්‍යාතටාංග ස්ථාපනය කර වෙනත් පොල් වතුර කර්මාන්ත වෙත අමුද්‍රව්‍ය සැකසුම්කරනයටත් පොල් කර්මාන්තකරුවන් බොහොමයක් පෙළඹී තිබේ.සියළුම කර්මාන්ත ලියාපදිංචියේදී පරීක්ෂාවක් සිදුකල අතර අදාල ලේඛන භාරදීම සම්පූර්ණ කල හා පරීක්ෂාවන් මගින් යෝග්‍යතාව නිර්දේශ වූ කර්මාන්ත 857ක් සඳහා ලියාපදිංචි සහතිකය නිකුත් කරන ලදී.

| **Product Type** | **2015** | **2016** |
|---|---|---|
| Desiccated coconut | 52 | 50 |
| Virgin coconut Oil | 91 | 80 |
| White Coconut Oil/coconut Oil | 84 | 80 |

| | | |
|---|---|---|
| Paring coconut Oil | * | 16 |
| Industrial Coconut Oil | * | 4 |
| Coconut Milk Related Products | * | 4 |
| Coconut Cream | 5 | 10 |
| Coconut Water | 10 | 20 |
| Coconut milk Powder | 1 | 3 |
| Creamed Coconut | 6 | 12 |
| Coconut Milk | 9 | 16 |
| Coconut Vinegar | 1 | 1 |
| Refined Bleached Deodorized cocon | * | 4 |
| Coconut Sugar | 1 | 2 |
| Coconut Amino | * | 1 |
| Coconut Butter | * | 2 |
| Frozen Grated Coconut | * | 1 |
| Coconut Spread | * | 4 |
| Coconut Syrup | * | 1 |
| Copra | 13 | 20 |
| Coconut Jam | * | 1 |
| Coconut Treacle | * | 2 |
| Coir Fibre | 158 | 203 |
| Coir Fibre Pith Substrate | 118 | 138 |
| Fibre Based Finish Products | 92 | 131 |
| Fibre Intermediate Products | * | 8 |
| Activated carbon | 8 | 8 |
| Charcoal | 30 | 19 |
| Charcoal Briquettes | * | 3 |
| Fresh Nuts | * | 13 |
| **Total** | **679** | **857** |
| * 2016 වර්ෂයේදී නව අයදුම්පත් ලෙස කැඳවන ලදී | | |

වගුව1:  2015 සහ 2016 වර්ෂ සඳහා නිෂ්පාදන ආයතන ලියාපදිංචි වීම




රූපය 4: පො.ස.අ ලියාපදිංචි නිෂ්පාදන ආයතන ව්‍යාප්තිය

## 2. පොල් නිෂ්පාදන සඳහා ක්ෂුද්‍රජීවී සහ භෞතික තත්ව සහතික නිකුත් කිරීම

2016 වර්ෂය තුල දිසිදි පොල් මෙට්‍රික් ටොන් 51,219.42 ක් නිෂ්පාදන වී ඇති අතර ඉන් ක්ෂුද්‍රජීවී සහ භෞතික පරාමිතී විශ්ලේෂණය කිරීම සඳහා දෛනික දිසිදි ආදර්ශ 11,314 ක් සැකසුම් සවර්ධන අංශය වෙත ලැබී ඇත. තත්ව සහතික1689 ක් නිකුත් කර ඇති අතර 2015 වර්ෂය හා සසඳන කල එය 33.2% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

| | නිකුත් කල සහතිකපත් ගණන | |
|---|---|---|
| **සහතික වර්ගය** | **2015** | **2016** |
| සැල්මොනෙල්ලා රහිත බවට | | 655 |
| භෞතික තත්ව විශ්ලේෂණ | | 655 |
| ඇෆ්ලටොක්සින් රහිත බවට | | 197 |
| සල්ෆර් ඩයොක්සයිඩ් රහිත බවට | | 182 |
| **මුළු ගණන** | **1268** | **1689** |

වගුව 2 : සැල්මොනෙල්ලා රහිත බවට, ඇෆ්ලටොක්සින් රහිත බවට , සල්ෆර් ඩයොක්සයිඩ් රහිත බවට හා භෞතික තත්ව විශ්ලේෂණ සහතික පත් නිකුත් කිරීම

අපනයනකරුවන් සහ නිෂ්පාදකයින් විසින් ස්වේච්ඡාවෙන් ගෙනවිත් භාරදෙනු ලබන කොහු, පොල්තෙල්, පුන්නක්කු, කොප්පරා, දිසිදි පොල්, මේදය තරමක් ඉවත් කළ දිසිදි පොල් සහ පොල් කිරි ආදර්ශ, විශ්ලේෂණ කටයුතු සඳහා රසායනාගාරය වෙත යොමු කිරීමෙන් අනතුරුව ලද ප්‍රතිපල ලේඛණ අනුව පහත පරිදි විශ්ලේෂණ වාර්තා සහතික නිකුත් කර ඇත.

| | නිකුත් කල වාර්තා ගණන | |
|---|---|---|
| **නිෂ්පාදන වර්ගය** | **2015** | **2016** |
| කොහු | 120 | 135 |
| පොල්තෙල් | 112 | 191 |
| පුන්නක්කු | 10 | 2 |
| කොප්පරා | 03 | 1 |
| දිසිදි පොල් | 35 | 58 |
| මේදය තරමක් ඉවත් කල දිසිදි පොල් | 105 | 112 |
| පොල් කිරි | 11 | 4 |
| පූර්ණ සනාවාස ගණන | 392 | 257 |

වගුව 3: ස්වේච්ඡාවෙන් ගෙනවිත් භාරදෙනු ලබන ආදර්ශ සඳහා ප්‍රතිපල වාර්තා නිකුත් කිරීම

## 2016 වාර්ෂික දිසිදි පොල් නිෂ්පාදනය

2016 වර්ෂයේ වාර්ෂික දිසිදි පොල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 50,000 ඉක්මවා ඇති අතර මාසික නිෂ්පාදනයන් පහත වගුවේ පරිදි වේ.

| **මාසය** | **දිසිදි පොල් නිෂ්පාදනය (ග්‍රෑම්.කි)** |
|---|---|
| ජනවාරි | 2,885,225.04 |
| පෙබරවාරි | 3,901,762.33 |
| මාර්තු | 4,939,468.06 |
| අප්‍රේල් | 3,195,136.00 |

| | |
|---|---|
| මැයි | 4,646,913.59 |
| ජුනි | 4,899,968.79 |
| ජුලි | 4,658,767.84 |
| අගෝස්තු | 5,319,210.12 |
| සැප්තැම්බර් | 4,581,607.84 |
| ඔක්තෝබර් | 4,294,649.33 |
| නොවැම්බර් | 4,746,372.54 |
| දෙසැම්බර් | 3,150,337.91 |
| **මුළු** | **51,219,419.39** |

වගුව 4 : 2016 වර්ෂයේ මාසික දිසිදි පොල් නිෂ්පාදනය

2015 වර්ෂයේ දිසිදි පොල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 41,795 ක් වූ අතර ඒ අනුව 2016 වර්ෂයේ දිසිදි පොල් 18.4% වර්ධනයක් පෙන්නුම් කර ඇත.

2015 සහ 2016 වර්ෂවල දිසිදි පොල් නිෂ්පාදන අගයන්හි මාසික සංසන්දනාත්මක සටහනක් පහත රූපයෙහි වේ.




රූපය 5: 2015 සහ 2016 වර්ෂයන්හි දිසිදි පොල් නිෂ්පාදන අගයන්

## 3. පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන් සඳහා මහජන බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව එක්ව ක්‍රියාත්මක කරනු ලබන සහන පොළී ණය යෝජනා ක්‍රමය

මහජන බැංකුව කප්රුක නිපැයුම් දිරිය හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි කප්රුක ජය ඉසුරු ණය යෝජනා ක්‍රම ද්විත්වය යටතේ ණය ලබා දුන් කර්මාන්තකරුවන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

මහජන බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන කප්රුක නිපැයුම් දිරිය ණය යෝජනා ක්‍රමය යටතේ ඉල්ලුම් කරන ලද හා පොල් සංවර්ධන අධිකාරිය විසින් නිර්දේශ කරන ලද පොළී සහන පිලිබඳ සටහනක් පහතින් දැක්වා ඇත.

ඒ අනුව මේ වන විට 2016 වර්ෂයට අදාළව ගෙවා ඇති මුළු පොළී ප්‍රමාණය රු.4,026,428.28වේ.

| ණය ලබා දුන් මුළු ගණන | පොළී සහන ලබා දුන් ගණන | පොළී සහන ලබා දුන් ණය මුදල | වර්ෂයට අදාලව ගෙවූ සහන පොළිය |
|---|---|---|---|
| 162 | 90 | 88,465,000.00 | 4,026,428.28 |

වගුව 5 : 2016 වර්ෂයට අදාලව ගෙවීම්

කප්රුක නිපැයුම් දිරිය යටතේ ණය ලබා දීම ආරම්භයේ සිට 2016.09.30 දක්වා එකී කාල පරිච්ඡේදය තුල සක්‍රියව පවතින ණය පිලිබඳ සවිස්තර සටහනක් පහතින් දක්වා ඇත.

| කාර්තුව | බැංකුව නිර්දේශිත පොළී සහන ගණන | ණය මුදල | පොළී සහන මුදල | අධිකාරිය ගෙවූ පොළී සහන ගණන | අධිකාරිය ගෙවූ පොළී සහන මුදල |
|---|---|---|---|---|---|
| 15.12.31 | 172 | 132,204,000 | 1,880,104.37 | 103 | 1,367,699.53 |
| 16.03.31 | 167 | 128,469,000 | 1,039,762.47 | 67 | 575,729.21 |
| 16.06.30 | 161 | 81,645,000 | 1,949,084.77 | 83 | 1,269,699.17 |
| 16.09.30 | 160 | 88,465,000 | 1,008,457.65 | 90 | 813,300.37 |

වගුව 6 : 2016 වර්ෂය දක්වා එක් එක් කාර්තුවට අනුව ණය ලබා දීම

2016.09.30 වැනි දිනට මහජන බැංකුවේ සක්‍රිය මට්ටමින් ණය ලබා ගත් කර්මාන්තකරුවන් 160 ක් වන අතර වැඩිම සක්‍රිය මට්ටමින් ණය ලබා දී ඇති කර්මාන්ත ක්ෂේත්‍ර "කොහු කර්මාන්තය" වන අතර එය ගණනින් 52 ක් වේ.ඒ පිලිබඳ විස්තර රූප අංක01 මඟින් දැක්වේ.




රූපය 6: සක්‍රිය මට්ටමින් ණය ලබා දී ඇති කර්මාන්ත ක්ෂේත්‍ර

එක් එක් ක්ෂේත්‍රයට අදාළව ලබා ගත් ණය ගැනුම්කරුවන් කෙසේ වුවද පරීක්ෂක මහතුන් විසින් පොළී සහන නිර්දේශ කල මුළු ප්‍රමාණය 26.4% ක් වන අතර නිර්දේශ නොකළ ප්‍රමාණය 70.8% වේ . එයින් කර්මාන්තකරුවන් දෙදෙනෙකුගේ ලිපි ගොනු වසා දමා ඇත.




රූපය 7: පොළී සහන නිර්දේශ කිරීම්

2016 වර්ෂයේ සක්‍රියව පවතින ණය ලබා ගත් කර්මාන්තකරුවන් අතරින් අධිකාරියෙහි ලියාපදිංචි වී ඇති ප්‍රමාණය 56.3% ක් වන අතර 11.9% ක් 2016 වර්ෂය සඳහා ලියාපදිංචි වී නොමැති අතර 31.9% සඳහා ණය ප්‍රතිපාදන නිර්දේශ කර නොමැත.




රූපය 8 : 2016 වර්ෂයේ සක්‍රියව පවතින ණය ලබා ගත් කර්මාන්තකරුවන්

## වර්තමාන සාරාංශය

2016.09.30 වන විට සක්‍රිය මට්ටමේ ණය ගැනුම්කරුවන් 160 ක් සිටින අතර එයින් ණය ගැනුම්කරුවන් 90 ක් සඳහා පොළී සහනය ලබා දී ඇති අතර පොල් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි නොවී පොළී සහන ලබා දීමට සුදුසු තත්වයක සිටින ගැනුම්කරුවන් 19 දෙනෙකු සිටී .ගැනුම්කරුවන් 51 දෙනෙකු පොළී සහනය ලබා ගැනීමට නුසුදුසු මටටමක සිටි. ඒ පිළිබඳ විස්තර පහත වගුවෙහි දැක්වේ.

| | ණය ගැනුම්කරුවන් සංඛ්‍යාව |
|---|---|
| පරීක්ෂක නිර්දේශ කළ හා ලියාපදිංචි වූ | 90 |
| පරීක්ෂක නිර්දේශ කළ නමුත් ලියාපදිංචි නොවූ | 19 |
| පරීක්ෂක නිර්දේශ නොකළ | 51 |
| වසා දැමූ ලිපි ගොනු | 01 |
| **එකතුව** | **160** |

වගුව 7: ණය ගැනුම්කරුවන්

## 4. දිසිදි පොල් නිෂ්පාදන ආයතන සඳහා මෝල් සංවර්ධන අරමුදල යටතේ නවීකරණ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම

සෑම දිසිදි පොල් නිෂ්පාදන කි.ග්‍රෑ 01ක් සඳහා සත 20ක මුදලක් එකී දිසිදි පොල් නිෂ්පාදන ආයතනය නමින් පිහිටුවා ඇති දිසිදි පොල් අරමුදල වෙත බැර කරනු ලබයි.අදාල ආයතනයේ නවීකරන කටයුතු සඳහා එම අරමුදලින් අවශ්‍ය අවස්ථාවලදී මුදල් වෙන් කරනු ලැබේ.ඒ අනුව 2016 වර්ෂය සඳහා නිෂ්පාදන කටයුතු වල නියැලී සිටි ආයතන 49ක් සඳහා රු 10,243,833.88ක මුදලක් මෝල් සංවර්ධන අරමුදල සඳහා බැර කරන ලදී.

| **මාසය** | රු |
|---|---|
| ජනවාරි | 577,045.01 |
| පෙබරවාරි | 780,352.47 |
| මාර්තු | 987,893.61 |
| අප්‍රේල් | 639,027.20 |
| මැයි | 929,382.72 |
| ජුනි | 979,993.76 |
| ජුලි | 931,753.57 |
| අගෝස්තු | 1,063,842.02 |
| සැප්තැම්බර් | 916,321.57 |
| ඔක්තෝම්බර් | 858,929.87 |
| නොවැම්බර් | 949,274.51 |
| දෙසැම්බර් | 630,067.58 |
| **මුළු** | **10,243,883.88** |

වගුව 8 : 2016 වර්ෂය සඳහා මෝල් සංවර්ධන අරමුදල සඳහා දායකත්වය




රූපය 9 : 2016 වර්ෂය සඳහා මෝල් සංවර්ධන අරමුදල සඳහා දායකත්වය

## ව්‍යාපෘති අංශයේ කාර්යයභාරය

### 1. පොල්කටුඑක්රැස්කරකර්මාන්තසඳහා යොදා ගැනීම

පොල් ආශ්‍රිත නාස්ති වන අමු ද්‍රව්‍ය පොල් කටු හා පොල් ලෙලි එක්රැස් කර කර්මාන්ත වෙත යොමු කිරීම ඒ ආශ්‍රිත කර්මාන්ත සිදුකිරීම ව්‍යවසායකයින් දිරිමත් කිරීමට කටයුතු කරන ලදී.

මේ අනුව පොල් කටු එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන 09 කින් පොල් කටු කි.ග්‍රෑ 32,3910 එක්රැස් කරන ලදී.තවද පොල් ලෙලි එකතු කිරීමේ මධ්‍යස්ථාන 11 කින් පොල් ලෙලි 675,200 එක්රැස් කරන ලදී.

තවද පොල් කටු හා පොල් ලෙලි එක් රැස් කිරීම සම්බන්ධයෙන් ගාල්ල, මාතර, හම්බන්තොට, රත්නපුර, ගම්පහ, නුවර හා පොලොන්නරුව යන ප්‍රදේශයන්හි කර්මාන්තයේ නියලි හා කර්මාන්තයට කැමැත්තක් දක්වන අය එකතු කර දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.එම වැඩසටහන සඳහා නියෝජිතයින් 182 දෙනෙකු සහභාගී විය.තම ප්‍රදේෂ වල පොල් කටු එකතු කිරීම සඳහා ඔවුන් හට පොලි සැක්ස් මලු බෙදා දෙන ලදී.

පොල් ආශ්‍රිත අමුද්‍රව්‍ය බහුලව පවතින ප්‍රදේශයන් හඳුනාගනිමින් ගැමි ආර්ථිකය නංවාලීම සඳහා ගෘහස්ත කර්මාන්ත ඇරඹීමට අවශ්‍ය තාක්ෂණික පුහුණුව හා සහය ලබාදීම.

(අ) පුහුණු වැඩසටහන්

පොල් ආශ්‍රිත සුළු පරිමාණ,ගෘහස්ත කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා සම්පත් බහුල ප්‍රදේෂ ප්‍රමුඛ කරගනිමින් තාක්ෂණික පුහුණු වැඩමුළු පවත්වා ගුණාත්මක නිෂ්පාදන සිදුකිරීම දිරිමත් කිරීම සඳහා උපකරණ හා මෙවලම් ලබා දීමට කටයුතු කරන ලදී. මෙම වැඩසටහන් පැවැත්වීමේදී අඩු ආදායම්ලාභී ජනතාව සඳහා ස්වයං රැකියා අවස්තා ලබා දීමටත් අතිරේක ආදායම් මාර්ග ඇති කිරීම කෙරෙහි මූලික අවදානය යොමු කරන ලදී.

| අංකය | පුහුණු වැඩසටහන | පැවැත්වූ දිනය | පැවැත්වූ ප්‍රදේශය හා දිස්ත්‍රික්කය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | කොහු ආශ්‍රිත නිෂ්පාදන(තවාශි බුරුසු හා වෙනත් බුරුසු) | 17/02/2016 | ගිණිගත්හේන,නුවරඑළිය | 20 |
| | | 12/02/2016 | රස්නායකපුර,කුරුණෑගල | 20 |
| | | 16/03/2016 | අඹගමුව, නුවරඑළිය | 20 |
| | | 07/07/2016 | සිරිපුර, පොලොන්නරුව | 20 |
| | | 23/07/2016 | තමන්කඩුව, පොලොන්නරුව | 20 |
| | | 31/07/2016 | ලක්ෂඋයන,පොලොන්නරුව | 20 |
| | | 14/08/2016 | ඇතුගල, මහනුවර | 18 |
| | | 06/09/2016 | ගලගෙදර,මහනුවර | 32 |
| | | 2016/09/09 | ගිණිගත්හේන,නුවරඑළිය | 25 |
| | | 2016/10/13 | හගුරක්කෙත, නුවරඑළිය | 40 |
| | | 04/11/2016 | හතරලියද්ද, මහනුවර | 38 |
| | | 10/11/2016 | කොහොට්ටල, හගුරක්කෙත | 31 |
| | | 19/11/2016 | මුවගල,මාතලේ | 26 |
| | | 18/11/2016 | කුරුලුබැද්ද,පොළොන්නරුව | 28 |
| | | 07/12/2016 | ගාමිණීපුර, නුවරඑළිය | 25 |
| | | 09/12/2016 | බගවන්තලාව, නුවරඑළිය | 25 |
| 2 | පොල් කටු ආශ්‍රිත විසිතුරු භාණ්ඩ නිෂ්පාදන | 07/03/2016 | පුනරුත්ථාපනය මධ්‍යස්තානය වවුනියාව | 57 |
| 3 | ඉදල් හා මුසුන් සැකසීම | 06/05/2016 | අඹන්පොල, කුරුණෑගල | 40 |
| 4 | කොහු ලණු නිෂ්පාදන | 29/07/2016 | ලක්ෂඋයන,පොළොන්නරුව | 15 |
| 5 | පාපිසි නිෂ්පාදන | 14/10/2016 | ලක්ෂඋයන,පොළොන්නරුව | 35 |
| 6 | ඉදල් සැකසීම | 27/08/2016 | වාවකච්ඡේරි | 30 |
| 7 | බුරුසු නිෂ්පාදන | 23/09/2016 | හඳපානාගල,මොණරාගල | 20 |
| 8 | කොහු ලණු නිෂ්පාදන | 30/09/2016 | හඳපානාගල, මොණරාගල | 20 |
| 9 | පොල් කටු ආශ්‍රිත විසිතුරු භාන්ඩ නිස්පාදන | 30/09/2016 | හඳපානාගල,මොණරාගල | 20 |
| 10 | පොල් කටු ආශ්‍රිත විසිතුරු භාන්ඩ නිෂ්පාදන | 29/12/2016 | මහනුවර | 15 |

මුළු ගණන 660

## ආ) උපකරණ කට්ටල බෙදාදීම

සාර්ථකව පුහුණුව අවසන් කරන ලද පුහුණුලාභීන් අදාළ කර්මාන්තය අඛණ්ඩව සිදු කිරීම සඳහා උපකරණ/ මෙවලම් ලබාදීමට කටයුතු කරනලදී. අදාළ තොරතුරු පහත දැක්වේ.

| අංකය | උපකරණ කට්ටලයේ නම | ප්‍රදේශය හා දිස්ත්‍රික්කය | ලබාදුන් ගණන |
|---|---|---|---|
| 1 | බුරුසු දඟ දමන උපකරණ | අඹතැන්න/නුවරඑළිය | 15 |
| | | ලක්ෂඋයන/පොළොන්නරුව | 25 |
| | | මැදිරිගිරිය /පොළොන්නරුව | 35 |
| | | සිරිපුර/පොළොන්නරුව | 10 |
| | | කුරුළුබැද්ද/පොළොන්නරුව | 10 |
| | | බැදිවැව /පොළොන්නරුව | 05 |
| | | අඹගමුව/නුවරඑළිය | 25 |
| | | අඹගමුව 2 කණ්ඩායම/නුවරඑළිය | 30 |
| | | ගිණිගත්හේන/නුවරඑළිය | 40 |
| | | කොත්මලේ/නුවරඑළිය | 25 |
| | | මාතලේ | 25 |
| | | රත්නායකපුර/කුරුණෑගල | |
| | බුරුසු දඟ දමන උපකරණ<br>කොහු කපන උපකරණ<br>කම්බි කපන උපකරණ | හඳපානාගල/මොණරාගල | 20<br>01<br>01 |
| | | යටිනුවර/මහනුවර | 25 |
| | | හගුරක්කෙත/නුවරඑළිය | 25 |
| | | වාවකච්චේරි/යාපනය | 10 |
| 2 | ලණු අඹරන උපකරණ කට්ටල | ලක්ෂඋයන/පොළොන්නරුව | 07 |
| | | හඳපානාගල/මොණරාගල | 05 |
| | | වාවකච්චේරි/යාපනය | 10 |
| | ඉදල් සෑදීමේ උපකරණ කට්ටල | අඹන්පොල/කුරුණෑගල | 40 |

මුළු ගණන 399

මෙම පුහුණු වැඩසටහන් වලින් අනතුරුව තම නිෂ්පාදන අලෙවි කිරීම සඳහා වෙළඳපොල සම්බන්ධතා ගොඩනගන ලදී.

(ඇ) දැනුවත් කිරීමේ වැඩසටහන්

| දිනය | වැඩසටහන | ස්ථානය | සහභාගීවූ ගණන |
|---|---|---|---|
| /02/2016 12 | කප්රුකට අරුණලු පොල් වගා දින වැඩසටහන | රස්නායකපුර/කුරුණෑගල | |
| /06/2016 06 | කොහු ආශ්‍රිත නිෂ්පාදකයින් සංවිධානගත කිරීමේ වැඩමුළුව | බැදිවැව/පොළොන්නරුව | 70 |
| /08/2016 17 | කොහු ආශ්‍රිත නිෂ්පාදකයින් සංවිධානගත කිරීමේ වැඩමුළුව | වීරකැටිය/හම්බන්තොට | 71 |
| /08/2016 27 | උතුරු පළාත් පොල් සංවර්ධන වැඩසටහන | වාවකච්චේරි/යාපනය | 92 |
| /11/2016 14 | කොහු ආශ්‍රිත නිෂ්පාදකයින් සංවිධිනගත කිරීමේ වැඩමුළුව | මාතලේ | 25 |
| /03/2016 26 | පොල්කටු අඟුරු නිෂ්පාදකයින් සංවිධානගත කිරීමේ වැඩමුළුව | පන්නල | 31 |
| /06/2016 06 | පොල්කටු අඟුරු නිෂ්පාදකයින් සංවිධානගත කිරීමේ වැඩමුළුව | පොළොන්නරුව | 28 |

| | | | |
|---|---|---|---|
| /07/2016 09 | පොල්දිනය | යාපනය | |
| /07/2016 30 | නිළමෙහෙවරජංගමසේවය | පොළොන්නරුව | |
| /11/2016 15 | පොල්කටුඅගුරුනිෂ්පාදනයපිළිබඳදැනුවත්කිරීමේවැඩසටහන සහක්ෂේත්‍ර චාරිකාව | හලාවත,ආඩගම | 24 |
| /12/2016 03 | වැව්ළි සවියගමින්ගමටවැඩසටහන | හොරොව්පතාන | |

මුළු ගණන 341

පොල්කටු ආශ්‍රිත කර්මාන්ත සඳහා කප්රුක සමිති පිහිටුවීම

තාක්ෂණ හුවමාරු වැඩසටහන් හා ජාතික වැඩසටහන් පැවැත්වීම

කොහු ආශ්‍රිත කර්මාන්ත සඳහා කප්රුක සමිති පිහිටුවීම හා තාක්ෂණික හුවමාරු වැඩසටහන් පැවැත්වීම

## 02. තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය

තත්ත්ව පාලන කටයුතු පිළිබඳ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම මගින් අපනයන තොග වල ගුණාත්මකභාවය සහතික කිරීම, විවිධ ඉල්ලුම්කරුවන්ගේ අවශ්‍යතා පරිදි පරික්ෂණ පහසුකම් සැපයීම, පොල් නිෂ්පාදන දේශිය වෙළඳ පොලට යොමු වීමේදි පරික්ෂා කොට සහතික නිකුත් කිරීම සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන උසස් මට්ටමක පවත්වා ගැනීම සඳහා උපදේශකත්වය සැපයීම තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශයේ ප්‍රධාන වගකීමයි.
ඒ අනුව
අංශයේ කාර්යයන්;

- **අපනයනය සඳහා යොමු වන දිසිදි පොල් නිෂ්පාදනයන් පරික්ෂා කිරිම හා තත්වය සහතික කිරීම**
    - දිසිදි පොල් වල ක්ෂුද්‍රජීවි හා භෞතික රසායනික පරික්ෂා සිදුකිරීම

පොල් නිෂ්පාදනක් ෂේත්‍රයේ ප්‍රමුඛතම මද ආශ්‍රිත නිෂ්පාදනය වන දිසිදි පොල් කර්මාන්තය ප්‍රධාන වශයෙන් මනා තත්ව පාලනයකට යොමු කරන අතර දෛනික දිසිදි පොල් නිෂ්පාදන සියල්ල තත්ව පාලන හාතත්ව ආරක්ෂණ අංශයේදී දිනපතා පරික්ෂාවට භාජනය කෙරේ.අපනයනය සඳහා යොමුවන මෙම නිෂ්පාදන සඳහා තත්ව සහතික නිකුත් කිරීම පිණිස මෙම පරික්ෂණ ප්‍රතිඵල දායක වේ.

- *කොහුබත්* ආශ්‍රිත නිෂ්පාදන - පරික්ෂා කිරීම
- **පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ යෙදෙන්නන්, අපනයනකරුවන් හා පාරිභෝගික ජනතාව වෙනුවෙන් ඉටු කරනු ලබන සේවාවක් ලෙසට රසායනාගාර පරික්ෂණ සේවා, සහන ගාස්තු ක්‍රමයක් යටතේ සිදුකිරිම**

    ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වන ප්‍රමිතින් හි දැක්වෙන ක්ෂුද්‍රජීවි හා භෞත රසායනික පරික්ෂා සිදුකිරිමේ හැකියාව පොල් සංවර්ධන අධිකාරියේ තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශය සතු වන අතර පොල් කර්මාන්තයේ නියැළි ව්‍යවසායකයන්ගේ අභිවෘද්ධිය සඳහා කඩිනම් පරික්ෂණ සේවාවන් ලබාදීමට සෑම විටම කටයුතු කරනු ලැබේ.

- **දිසිදි පොල් නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා ක්ෂුද්‍රජීවි, භෞත රසායනික පරික්ෂා සිදුකිරීම**
    අධිකාරියේ රසායනාගාරයේ සිදුකරන පරික්ෂා හැරුණු කොට දිසිදි පොල් නිෂ්පාදනාගාර ආශ්‍රිත දිසිදි හා ජල ආදර්ශ රැස්කොට පරික්ෂා කර ප්‍රතිඵල සපයා පොල් නිෂ්පාදන ක්‍රියාවලීය වැඩි දියුණු කිරීම හා නිෂ්පාදනයන්හි උසස් ප්‍රමිතියක් පවත්වා ගැනීම සඳහා දායකවේ.

- **තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශයේ රසායනික හා ක්ෂුද්‍රජීවි රසායනාගාර සඳහා ISO 17025 තත්වය පවත්වා ගැනිමේකටයුතු සිදුකිරීම**

- පොල් තෙල් කර්මාන්තය සෞඛ්‍යාරක්ෂිතව පවත්වා ගැනීම හා නගාසිටුවීම අරමුණු කරගනිමින් අදාල පරික්ෂණ සිදුකිරිමට පොල් තෙල් නිෂ්පාදනාගාරයන් හි සෞඛ්‍යාරක්ෂිත භාවය පරික්ෂා කිරිම හා පොල් තෙල් නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන අමුද්‍රව්‍ය වන කොප්පරා, නිෂ්පාදිතය වන පොල් තෙල් හා එහි අතුරුඵලය වන පුන්නක්කු ශ්‍රී ලංකා ප්‍රමිතින්ට අනුකුල වන්නේදැයි පරික්ෂා කිරීම

- දේශිය වෙළඳ පොලෙහි පවතින මිශ්‍ර පොල් තෙල් හඳුනාගැනිමේ පරික්ෂා සිදුකිරිමේ සහ අපගමනය විම පරිභෝගික අධිකාරියට සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලන ඒකකය වෙත දැනුම් දීම. පොල් තෙල් නිෂ්පාදනයන්හි තත්වය පරික්ෂා කිරිම සිදුකරන අතර හඳුනාගත් මිශ්‍ර පොල් තෙල් විකුණුම්කරුවන් පිළිබඳ විස්තර පාරිභෝගික කටයුතු පිළිබඳ අදාළ ආයතනය වන පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය සහ ආහාරමය ද්‍රව්‍ය සඳහා පාලනමය බලතල ඇති ආයතනය වන සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලන ඒකකය වෙත සපයා එකී ආයතන සමඟ එක්ව කටයුතු කර මිශ්‍ර පොල් තෙල් අනුභවයෙන් පාරිභෝගික ජනතාව රැකගැනීම සඳහා සේවාවන් සැපයීම

- පොල් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධව පැන නැගෙන දේශිය හා විදේශිය පැමිණිලි හමුවේ නිෂ්පාදන පරික්ෂණ සිදුකිරිම
- පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්හි වැදගත් කම පිළිබඳ දැනුවත් කිරිමේ වැඩ සටහන් සහප්‍රදර්ශණ සඳහා සහභාගී වීම
- ආහාරමය වෙනත් නිෂ්පාදන පරික්ෂා කිරිමේ සේවාවන් පවත්වා ගෙන යාම
- වර්තමානයේ පවතින ශ්‍රී ලංකා ප්‍රමිතින් යාවත්කාලීන කිරිම සහ දැනට ප්‍රමිතින් නොමැති පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ප්‍රමිති සැකසීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමඟ සම්බන්ධවී වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම
- පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ පවතින රසායනාගාරයන්හි සේවයේ නියුතු කාර්යය මණ්ඩලය උදෙසා පුහුණු වැඩ සටහන් පැවැත්වීම

මේ අනුව ගුණාත්මක පොල් නිෂ්පාදන බිහිකිරිමත්, ඒ අනුව දේශීය හා විදේශිය වෙළඳපල වර්ධනය වීමත් අපේක්ෂා කරමින් පොල් නිෂ්පාදන පරික්ෂා කිරිම තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශය විසින් සිදුකර ඇත. මෙකී සියළු කාර්යයන්, වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මකට අනුව සිදුකරනු ලබන අතර 2016 වාර්ෂික ප්‍රගතිය පහත පරිදි වේ.

## Q1 අපනයනය සහ දේශිය පරිභෝජනය සඳහා යොමු වන පොල් නිෂ්පාදනයන්හි තත්වය සහතික කිරිම

### A පොල් නිෂ්පාදනයන්හි පූර්ව අපනයන ක්ෂුද්‍රජීවී විශ්ලේෂණ සිදුකිරීම සහ සහතික කිරිම

පොල් මද ආශ්‍රිත නිෂ්පාදනවල පරික්ෂණ කටයුතු ලෙස ප්‍රධාන වශයෙන් සිදුවන්නේ දිසිදි පොල් සඳහා වේ. දිසිදි පොල් නිෂ්පාදනාගාරයන්හි සිදුවන දෛනික නිෂ්පාදන, සැල්මොනෙල්ලා පරික්ෂාවට භාජනය කිරිම, තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශයේ ක්ෂුද්‍රජීවී රසායනාගාරයේදී සිදුකෙරේ. මේ අනුව අපනයනය සඳහා යොමුවන දිසිදි පොල් නිෂ්පාදනයන් සියල්ල පරික්ෂාවට භාජනය කෙරේ.

2016වසර සඳහා දෛනික දිසිදි නිෂ්පාදන ආදර්ශ 9500ක ඉලක්කයක් තිරණය කරන ලදි.ආදර්ශ 11265ක් සැල්මොනෙල්ලා සඳහා පරික්ෂා කර 2016 වසරේදි මෙම පරික්ෂණ වෙනුවෙන් 119% ක ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

දිසිදි ආදර්ශ පරික්ෂා කිරීමට, යොමුවීම එම නිෂ්පාදන ධාරිතාවය මත රඳා පවති.




2015 වසරේදි පරීක්ෂාවට භාජනය කල දිසිදි පොල් නිෂ්පාදන අතුරින් ආදර්ශ 26ක් සැල්මොනෙල්ලා විෂගතවීම වාර්තා විය. ප්‍රතිශතයක් ලෙස විෂගතවීම් 0.27%කි. 2016 වසරේදි විෂගතවීම ආදර්ශ 40ක් වන අතර 2016 වසරේදි පරීක්ෂාවට භාජනය කල ආදර්ශයන්හි ප්‍රතිශතයක් ලෙස ගත්කල මෙය 0.4% වේ. ඒ අනුව විශගතවීම සැලකිය යුතු පරිදි වැඩිවී ඇත. දිසිදි පොල් නිෂ්පාදනාගාරයන්හි තත්වය පිළිබඳව සැලකිලිමත්වීම වැදගත් වේ.




| වසර | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
| --- | --- | --- | --- | --- | --- | --- | --- | --- | --- | --- |
| විෂගතවීම් ප්‍රතිශතය | 0.50% | 0.10% | 0.12% | 0.12% | 0.2% | 0.08% | 0.14% | 0.15% | 0.27% | 0.4% |

පූර්ව අපනයන ක්ෂුද්‍රජීවී විශ්ලේෂණය සිදුකිරීම සඳහා මද නොවන නිෂ්පාදන අතුරින් ප්‍රමුඛත්වය ගනු ලබන්නේ කොහු බත් ආශ්‍රිත නිෂ්පාදනයි. 2015 වසරේදි ආදර්ශ 596ක් පරික්ෂා කර ඇති අතර 2016 වසරේදි ආදර්ශ 647ක් පරික්ෂා කර ඇත. මෙම ආදර්ශ 647 හි පරික්ෂණ 781ක් සිදුකර ඇත. මෙම ආදර්ශ පරික්ෂා කිරීම සිදුකරනු ලබන්නේ ඉල්ලුම්කරුවන්ගේ අවශ්‍යතාව අනුව වේ. 2016 වර්ෂයේදි කොහු බත් ආශ්‍රිත නිෂ්පාදන වාර්ෂික ඉලක්කයට සාපේක්ෂව, අඩු ප්‍රමාණයක් පරික්ෂා සඳහා භාජනය වී ඇත. ප්‍රගතිය 86%කි. මෙම අදාර්ශයන්හි සැල්මොනෙල්ලා සහ ඊකොලි පරික්ෂාවන් සිදුකරනු ලැබේ. පරික්ෂා කල ආදර්ශ අතුරින් 0.8% ක් සැල්මොනෙල්ලා විශගතවීම් වාර්තා වි ඇති අතර කිසිදු ආදර්ශයක් ඊකෝලයි බැක්ටිරියාව සඳහා වන ප්‍රමිති සිමාවන් ඉක්මවා නැත.




| | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආදර්ශ ප්‍රමාණය | 687 | 831 | 615 | 900 | 640 | 645 | 800 | 840 | 596 | 647 |
| ඉලක්කය | 750 | 750 | 800 | 600 | 900 | 600 | 650 | 800 | 700 | 750 |

## B දිසිදි පොල් නිෂ්පාදනයන්හි පූර්ව අපනයන භෞත රසායනික පරික්ෂා සිදුකිරිම සහ සහතික කිරිම.

**භෞතික හා සංවේදි පරික්ෂා ලෙස,**

දිසිදි පොල් හි වර්ණය, කැටිති ප්‍රමාණය, තෙතමනය, රස, සුවඳ, අපද්‍රව්‍ය, කුරුටු, තෙල් බේරි ඇත්ද යන පරික්ෂා ප්‍රධානව සිදුකර ඇත. මේ අනුව 2015 වසරේදි ආදර්ශ 9643ක් පරික්ෂා කර ඇති අතර 2016 වසරේදි ආදර්ශ 11343 ක් පරික්ෂා කර ඇත. මෙම ආදර්ශ 11343 හි සිදුකර ඇති සම්පූර්ණ පරික්ෂණ ගණන 90744 කි. 2016 වසරේ ඉලක්කයට සාපේක්ෂව ප්‍රගතිය 119%කි.




2015 වර්ෂය තුල පරික්ෂණයට භාජනය කල දිසිදි ආදර්ශ 9,643 අතුරින් ආදර්ශ 372ක් එනම් 3.6%ක් භෞතික ලක්ෂණයන්හි අඩුපාඩු පෙන්නුම් කරන ලද අතර 2016 වර්ෂයේදී පරික්ෂා කල ආදර්ශ 11,343න් ආදර්ශ 1054 එනම් 9.3%ක් එම අඩුපාඩු පෙන්වා ඇත. මේ අනුව භෞතික ලක්ෂණයන්හි ප්‍රමිතියානුකූල නොවීම 2016 වර්ෂයේදි සැලකිය යුතු පරිදි ඉහල ගොස් ඇත. මෙලෙස ශ්‍රී ලංකා ප්‍රමිතිය හා එකඟ නොවූ ආදර්ශ අතුරින් වැඩිම ප්‍රතිශතය වන 54% ක් වර්ග කිරීම සඳහා ප්‍රමිතියට නොගැලපීමකි. තත්ව දෝශ පහත පරිදි වේ.

| පරාමිතිය | එකඟ නොවූ ආදර්ශ | |
|---|---|---|
| | ගණන | % |
| වර්ග කිරීම | 573 | 54 |
| වර්ණය | 307 | 29 |
| මුඩු බව | 20 | 2 |
| තෙතමනය | 106 | 10 |
| දැවුනු කැබලි | 236 | 22 |
| කර ගඳ | 209 | 20 |
| දුම් ගඳ | 50 | 5 |
| බාහිර අපද්‍රව්‍ය | 48 | 5 |
| කුරුටු | 44 | 4 |
| තෙල් බේරීම | 11 | 1 |
| අප්‍රසන්න ගඳ | 13 | 1 |
| තෙල් සහිතවීම | 9 | 1 |

(ඇතැම් ආදර්ශ පරාමිතීන් කිහිපයකින් ප්‍රමිතිය හා එකඟ නොවී ඇත.)

## Q2. පොල් ආශ්‍රිත නිෂ්පාදන පරික්ෂා කිරිමේ සේවා පවත්වා ගැනීම

දේශීය නිෂ්පාදකයන්ගේ විවිධ පොල් නිෂ්පාදන විශ්ලේෂණය කිරිමේ සේවාව පවත්වා ගැනීම තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශය විසින් සිදුකරයි. ක්ෂුද්‍රජීවි පරික්ෂාවන්, රසායනික පරික්ෂාවන්, භෞතික පරික්ෂාවන් සහ සංවේදි පරික්ෂාවන් මේ යටතේ සිදු කෙරේ. මෙම සේවාව සාධාරණ මිලකට, සිදුකරන අතර ඉල්ලුම් කරුගේ අවශ්‍ය පරාමිතින්ට අදාලව පරික්ෂා කර වාර්තා නිකුත් කරනු ලැබේ. පොල් ආශ්‍රිත නිෂ්පාදනකරුවන්, පාරිභෝගික ජනතාව, සුළු, මධ්‍යම හා මහා පරිමාණ වෙළඳ මහතුන් සහ අපනයන කරුවන් ආදී වු ඕනෑම කාණ්ඩයක් සඳහා පොල් ආශ්‍රිත නිෂ්පාදන පරික්ෂා කිරිමේ සේවාව ලබා දෙනු ලැබේ.

මද වශයෙන් මේදය ඉවත් කල දිසිදි පොල්, කොප්පරා, පොල් කෙඳි, පොල් තෙල්, පුන්නක්කු, කොහු බත් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සහ පොල් කිරි හා කිරි ආශ්‍රිත පොල් පිටි වෙනත් නිෂ්පාදන ආදි වු විවිධ පොල් නිෂ්පාදන ද්‍රව්‍යයන් ශ්‍රී ලංකා ප්‍රමිතියට අදාලව පරික්ෂා කිරිමේ සේවාව පවත්වා ගෙන යනු ලැබේ. මේ සඳහා අවශ්‍ය වන නවීන රසායනාගාර උපකරණ, තත්ව පාලන අංශය සතු වන අතර කඩිනම් ප්‍රතිඵල ලබාදීම තත්ව පාලන අංශයෙන් සිදුකරනු ලැබේ.

ප්‍රමිතියානුකුල ලෙස පොල් ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම හා පරික්ෂා කර එහි තත්වයන් පිළිබඳව අවබෝධය ලබා ගැනිම උදෙසා නිෂ්පාදකයින් දිරිගැන්වීම සඳහාත්, ශ්‍රී ලාංකික භාවය රැකෙන පරිදි තත්වයෙන් උසස් පොල් නිෂ්පාදන නිරතුරුව විදේශීය වෙළඳපල කරා යොමු කරවීම පිණිස අපනයන කරුවන් දිරිගැන්වීම සඳහාත්, පොල් සංවර්ධන අධිකාරියෙහි ඉහත කී ලියාපදිංචි කාණ්ඩ සඳහා 15%ක වට්ටම් ගාස්තුවක් ලබාදේ.

පරික්ෂා කර ගැනීම සඳහා පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ප්‍රධාන වශයෙන් යොමුවන අතර 2015 වසරේදි ආදර්ශ 539ක් පරික්ෂා කර ඇත. 2016 වසර තුල ආදර්ශ 742ක් විශ්ලේෂණයකර ඇත. ඉලක්කය වන ආදර්ශ 600ට සාපේක්ෂ ප්‍රගතිය 124% වේ. මෙම ආදර්ශ 742 හි සිදුකර ඇති සම්පුර්ණ පරික්ෂණ ගණන 1702 කි. 2016 වසරේදි පොල් මද ආශ්‍රිත නිෂ්පාදන අතුරින් සල්ෆඩයොක්සයිඩ් හා ඇෆ්ලටොක්සින් පරික්ෂණ සඳහා පමණක් දිසිදි ආදර්ශ 374ක් විශ්ලේෂණය කර ඇත. පොල් තෙල් ආදර්ශ පරික්ෂාවද 2015ට සාපේක්ෂව සැලකිය යුතු පරිදි ඉහල ගොස් ඇත. මෙය පරික්ෂා කල මුළු ආදර්ශ ප්‍රමානයෙන් 50%කි. මේ යටතේ පරික්ෂා කල සියළුම ආදර්ශ වර්ග පහත දැක්වේ.




| වර්ෂය | දිසිදි පොල් ආදර්ශ) ( | පුන්නක්කු (ආදර්ශ) | පොල් තෙල් ආදර්ශ) ( | කොප්පරා (ආදර්ශ) | මද වශයෙන් මේදය ඉවත් කරන ලදි දිසිදි පොල් (ආදර්ශ) | Coconut spread (ආදර්ශ) | පොල් ක්‍රීම් / කිරම (ආදර්ශ) | පිටි කල පොල් ආදර්ශ) ( | පොල් නොවන ආදර්ශ | දිසිදි පොල් ආදර්ශ ) ඇෆ්ල ටොක්සින් හා සල්ෆර් ඩයොක්සයිඩ් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2014 | 122 | 5 | 161 | 4 | 81 | -- | 11 | -- | 05 | 710 |
| 2015 | 35 | 10 | 158 | 3 | 105 | 01 | 11 | 01 | 01 | 214 |
| 2016 | 58 | 2 | 191 | 1 | 112 | -- | 4 | -- | -- | 374 |

## Q3.A) ISO තත්ව සහතිකය ලබා ගැනිමේ කාර්යයන්

පොල් සංවර්ධන අධිකාරියේ තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශය මගින් නිකුත් කරනු ලබන පරික්ෂණ සඳහා ජාත්‍යන්තර පිළිගැනීමක් ලැබෙන පරිදි හා පරික්ෂණ කටයුතු නිවැරදිව, විධිමත්ව හා ක්‍රමානුකූලව සිදුකිරිම සඳහා, ISO 17025 ප්‍රතිතන තත්වයට අදාල කාර්යයන් පවත්වා ගෙන යනු ලැබේ. ඒ අනුව වර්ශිකව උපකරණ ක්‍රමාංකනය කිරීම ජාත්‍යන්තර හා දේශියව inter laboratory සහ inter laboratory වෘත්තිමය කුසලතා ඇගයිමේ පරික්ෂණ සඳහා පෙනී සිට ඇති අතර සතුටුදායක මට්ටමේ පවති.

පොල් තෙල් පරික්ෂණ ක්‍රමවේදයන් සඳහා තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශයේ රසායනික විශ්ලේෂණ අංශය විසින් ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය විසින් පිරිනමනු ලබන  ISO 17025 තත්ව සහතිකය, 2012 වසරේදි අත්කර ගනු ලැබූ අතර එය 2016 වසරේදි පැවති සුපරික්ෂණ පරික්ෂාවෙන් සමත්ව 2015 – 2018 වසර තෙක් ප්‍රතිතන තත්වය දිර්ඝ කරන ලදි.


SLAB
SRI LANKA ACCREDITATION BOARD

Certificate of Accreditation

Sri Lanka Accreditation Board for Conformity Assessment
hereby declares that

Chemical Laboratory of Quality Control and
Quality Assurance Division
Coconut Development Authority

having being found to comply with the accreditation criteria for testing/calibration laboratories as described in ISO / IEC 17025 :2005 has been accredited as a testing laboratory under the field of

Chemical Testing

and has been assigned the accreditation number
TL 030-01

This certificate is issued on 12 June 2015 and is valid until

11 June 2018

The accreditation was granted for the first time on 12 June 2012

The scope and conditions of accreditation are specified in the Schedule of Accreditation bearing the accreditation number appearing in this certificate.

Director / CEO
Sri Lanka Accreditation Board for Conformity Assessment
Colombo, Sri Lanka

දිසිදි පොල් හි ක්ෂුද්‍රජීවී පරික්ෂණ වන සැල්මොනෙල්ලා, සම්පූර්ණ ඝණාවාස සංඛ්‍යාව, දිලීර හා පුස් සංඛ්‍යාව, කොලිෆෝම් සංඛ්‍යාව, ඊ. කෝලයි සංඛ්‍යාව සඳහා ක්ෂුද්‍රජීවී රසායනාගාරය විසින් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් පිරිනමනුISO 17025ප්‍රතිතනතත්වය 2016 ජනවාරි මස පැවති සුපරික්ෂණ පරික්ෂණයෙන් සමත්ව 2018 ඔක්තෝම්බර් මස 27 දින දක්වා දීර්ඝ කරන ලදි.


SLAB
SRI LANKA ACCREDITATION BOARD

Certificate of Accreditation

Sri Lanka Accreditation Board for Conformity Assessment
hereby declares that

Microbiology Laboratory
Quality Control and Quality Assurance Division
Coconut Development Authority

having being found to comply with the accreditation criteria for testing/calibration laboratories as described in ISO / IEC 17025 : 2005 has been accredited as a testing laboratory under the field of

Biological Testing

and has been assigned the accreditation number
TL 030-02

This certificate is issued on 28 October 2015 and is valid until

27 October 2018

The accreditation was granted for the first time on 28 October 2015

The scope and conditions of accreditation are specified in the Schedule of Accreditation bearing the accreditation number appearing in this certificate.

Director / CEO
Sri Lanka Accreditation Board for Conformity Assessment
Colombo, Sri Lanka

**B පුහුණු වැඩ සටහන් පැවැත්වීම**

තත්ව පාලන අංශයේ ආරම්භ කර ඇති ISO ප්‍රතිතන තත්වයට අදාල කටයුතු සඳහා සහ කාලීනව සංශෝධනය කර ඇති පොල් නිෂ්පාදන පරික්ෂා කිරීමේ ක්‍රමවේද සඳහා අවශ්‍ය වන පුහුණුව රසායනාගාරයේ සේවක පිරිස වෙනුවෙන් ලබාදී ඇති අතර වෙනත් බාහිර රසායනාගාරයන්හි සේවක පිරිස වෙනුවෙන් තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශය විසින් පුහුණු වැඩ සටහන් පවත්වා ඇත. වාර්ෂික සැලැස්මට අනුව ප්‍රගතිය ලබා ඇත.

| | පුහුණු වැඩසටහන | සහභාගී වූ සේවක සංඛ්‍යාව | පුහුණුව පැවැත්වූ ආයතනය |
|---|---|---|---|
| .1 | බෝතල් කල පානීය ජලය පිළිබඳ සෞඛ්‍ය ආරක්ෂිතභාවය | 2 | ශ්‍රී ලංකා ප්‍රමිතිආයතනය |
| .2 | තත්ත්ව පාලනය පිළිබඳ පාඨමාලාව | 3 | ශ්‍රී ලංකා ප්‍රමිතිආයතනය |
| .3 | Good laboratory practices and safety handling | සියළුම රසායනාගාර කාර්යය මණ්ඩලය වෙත | Institute of Chemistry |
| .4 | Commercial sterility | 3 | ශ්‍රී ලංකා ප්‍රමිතිආයතනය |
| .5 | Statistical process control | 3 | ශ්‍රී ලංකා ප්‍රමිතිආයතනය |
| .6 | Waste water and water testing | 4 | ශ්‍රී ලංකා ප්‍රමිතිආයතනය |
| 7 | Quality Assurance calibration & uncertitnity measurements | 2 | හෙක්ටර් කොබ්බෑ කඩුව |
| 8 | Workshop on water microbiology | 1 | කාර්මික තාක්ෂණික ආයතනය |

## Q4 අපනයනය සඳහා නිෂ්පාදනය වන පොල් නිෂ්පාදන කර්මාන්තයන්හි තත්වය සුරක්ෂිත කිරිම

දිසිදි පොල් නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා ක්ෂුද්‍රජීවි හා භෞත රසායනික පරික්ෂා සිදුකිරිම, කර්මාන්ත ශාලා පරික්ෂා කිරිම සහ උපදේශක දායකත්වය සැපයීම. මේ යටතේ සිදුකරනු ලබන කාර්යයන් වේ.

දිසිදි පොල් නිෂ්පාදනාගාරයන්හි තත්ව ආරක්ෂණ කටයුතු නිසි පරිදි පවත්වා ගැනීම සඳහා, මාසයක කාලයක් තුල සියළුම දිසිදි පොල් මෝල් ආවරණය වන පරිදි, සකස් කර ගත් පූර්ව වැඩ සටහන් සැලැස්මකට අනුව ජංගම රසායනාගාරය යොදවා ඉහත කී සේවාවන් ක්‍රියාවට නැංවීම මීටපෙර සිදුකර ඇත. ජංගම රසායනාගරයෙහි පවති දෝශ සහගත තත්වය හේතුවෙන් එය භාවිතා කිරීමට අපහසු වීම මත නව රථයක් ඉල්ලුම් කරන ලදි. නව රථය මිලදිගත් පසුව යලිත් මෙම කාර්යයන් ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර ක්‍රියාකාරි සැලැස්ම සකස් විය. එහෙත් ප්‍රායෝගික ගැටළු කිහිපයක් හේතුවෙන් නව රථය මිලදි ගැනීම ප්‍රමාදවීය. එසේ වුවද ජංගම රසායනාගාර කාර්යයන් ඉටු නොකලද දිසිදි මෝල් කරුවන්ගේ ඉල්ලීම මත ආදර්ශ රැස්කිරිම පමණක් සිදුකර ප්‍රතිඵල නිකුත් කර ඇත. ඒ අනුව වසරේ දෙවන අර්ධයේදි මෙකී කාර්යයන් සිදු කරන ලදි. අර්ධ වාර්ශිකව ඉලක්ක සපයා ඇත.
2015 වර්ෂය සඳහා ක්ෂේත්‍ර පරික්ෂා 500ක් සිදුකර ඇති අතර 2016 වර්ෂය තුල ක්ෂේත්‍ර පරික්ෂා 290ක් පැවැත්වීමට හැකියාව ලැබී ඇත. නිෂ්පාදන කරුවන්ගේ ඉල්ලීම මත පරික්ෂා කිරීම් වැඩිවී ඇති හෙයින් 2016 වසරේ ඉලක්කයට සාපේක්ෂ ප්‍රගතිය 145%කි.

දිසිදි පොල් නිෂ්පාදන තත්වය වැඩි දියුණු කිරිම සඳහා ක්ෂුද්‍රජීවි පරික්ෂා සිදුකිරිම 2015 වර්ෂය සඳහා ආදර්ශ 392ක් වන අතර 2016 වර්ෂය සඳහා ආදර්ශ 257කි. මෙම ආදර්ශ 257 හි සිදුකර ඇති සම්පූර්ණ පරික්ෂණ සංඛ්‍යාව 771 කි. දිසිදි පොල් නිෂ්පාදනාගාරයන්හි විශේෂ ඉල්ලීම මත ගමන් වාර 02කදී ආදර්ශ 06ක් රැස්කර පරීක්ෂණ 42ක් සිදුකර ඇත. 2016 වසරේදි ඉලක්කයට සාපේක්ෂව ප්‍රගතිය 129%කි.

තවද දිසිදි පොල් නිෂ්පාදනයේදී භාවිතා කරනු ලබන ජලය නිසි ප්‍රමිතියෙහි පවතින්නේද යන්න පරික්ෂා කිරිම සඳහා එම ජලයේ ක්ෂුද්‍රජීවී හා රසායනික විශ්ලේෂණය සිදුකරනු ලැබේ. ක්ෂුද්‍රජීවී හා රසායනික විශ්ලේෂණ ආදර්ශ 106ක් පරික්ෂා කර ඇත. 2016 වසරේ අර්ධ වාර්ෂික ඉලක්කයට සාපේක්ෂ ප්‍රගතිය 88%කි.

## Q5.පොල් තෙල් කර්මාන්තය නඟාසිටුවීම

### A මිශ්‍ර පොල් තෙල් පිළිබඳ වෙළඳ පොල අධීක්ෂණ කටයුතු

ආහාරයක් වශයෙන් පොල් තෙල් වල ඇති සෞඛ්‍යාරක්ෂිත ගුණය පිළිබඳව හා එම නිෂ්පාදන ප්‍රමිතියානුකූලව නිපදවීම සඳහා යොදා ගනු ලබන අමුද්‍රව්‍ය මෙන්ම, තත්වය බාලවීමකින් තොරව වෙළඳපලට යොමු වීම, අරමුණුකර ගනිමින් තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශය විසින් පරික්ෂණ හා සමීක්ෂණ කාර්යයන් සිදුකර ඇත.

මිශ්‍ර පොල් තෙල් පිළිබඳ ලැබී ඇති විශ්ලේෂණ ප්‍රතිඵල සෞඛ්‍ය අමාත්‍යාංශය සහ පාරිභෝගික අධිකාරිය වෙත ලබාදී නීතිමය ක්‍රියාදාමයන් මගින්, පිරිසිදු පොල් තෙල් ලෙස මිශ්‍ර පොල් තෙල් වෙළඳාම සිදුකරන වෙළඳසැල් යම් පාලනයකට යටත් කිරිමට දායකවී ඇත.

දිවයිනේ දිස්ත්‍රික්කමය වශයෙන් වෙළඳපොලෙහි පවතින පොල් තෙල් ආදර්ශ රැස්කොට ඒවා මිශ්‍ර පොල් තෙල් වේ දැයි විමර්ශනය කිරිම සඳහා විශ්ලේෂණයන් නොකඩවා පැවැත්වීම 2016 වසරේද සිදුකර ඇති අතර කුඩා, මධ්‍යම හා මහා පරිමාණ වෙළඳසැල් සියල්ල ආවරණය වන පරිදි විධිමත්ව මෙම අධීක්ෂණ කටයුතු සිදුකර ඇත. 2016 වසරේදි ආදර්ශ 100ක් පරික්ෂා කර, මිශ්‍ර පොල් තෙල් වාර්තාවීමේ ප්‍රතිශතය 47 % ක් ලෙස පැවති අතර 2015 වසරේදි සිදුකරනු ලැබු මෙවැනි ආදර්ශප්‍රමාණයෙන් 76%කප්‍රතිශතයක් මිශ්‍ර පොල් තෙල් ලෙස වාර්තාවී ඇත. ඒ අනුව 2016 වසර තුල පොල් තෙල් මිශ්‍ර කිරිමෙහි අඩු නැඹුරුවීමක් පෙනී යයි. පොල් තෙල් මිශ්‍ර කිරිමක් සිදු නොකලද, ප්‍රමිතිය හා එකඟ නොවු පොල් තෙල් වෙළඳ සැල් ආශ්‍රිතව පවතින බව ප්‍රතිඵල අනුව වාර්තා වී ඇත.ඒ අනුව නිදහස් මේද අම්ල ප්‍රමාණය ප්‍රමිතිය හා එකඟ නොවීම මත 38% ක් ද, අයඩින් අගය එකඟ නොවීම මත කුරුටු මිශ්‍ර පොල් තෙල් ලෙස හඳුනාගත් තෙල් 15%ක් වර්තා වී ඇත.

### B පොල් තෙල් කර්මාන්තයේ තත්වය වැඩි දියුණු කිරිම

පොල් තෙල් නිෂ්පාදනය ප්‍රමිතියානුකූල තත්වයට පත්කිරීම සඳහා පොල් තෙල් මෝල් ආශ්‍රිතව තත්ව පාලන වැඩ සටහන් ක්‍රියාවට නංවන ලදී. මේ අනුව පොල් තෙල් නිෂ්පාදනයේ අමුද්‍රව්‍යය වන කොප්පරා නිසි ප්‍රමිතියෙන් පවතිද යන්නත්, නිෂ්පාදනය කරනු ලබන පොල් තෙල් ගුණාත්මක තත්වයේ පවතිද යන්නත්, පොල් තෙල් නිස්සාරණය කාර්යක්ෂමව සිදුවේද යන්නත් අධ්‍යයනය කිරිම සඳහා පිළිවෙලින් කොප්පරා, පොල් තෙල් හා පුන්නක්කු ආදර්ශයන් පොල් තෙල් නිෂ්පාදනාගාර ආශ්‍රිතව රැස්කර පරික්ෂණ ප්‍රතිඵල නිකුත් කර ඇත. මේ අනුව 2016 වර්ෂය සඳහා පොල් තෙල් ආදර්ශ 75ක්ද, කොප්පරා ආදර්ශ 50ක්ද , පුන්නක්කු ආදර්ශ 50ක්ද පරික්ෂා කර ඇති අතර 2016 ඉලක්කයට සාපේක්ෂව මෙකී සියළු පරික්ෂණයන්හි ප්‍රගතිය 100%ක් ලෙස ලබා ඇත. ගාල්ල, මාතර, පුත්තලම, කුරුණෑගල, ගම්පහ, කොළඹ යන දිස්ත්‍රික්කයන් හි පිහිටිපොල් තෙල් නිෂ්පාදනාගාරයන් මේ අනුව පරික්ෂා කර ඇති අතර, ප්‍රමිතිය හා එකඟ නොවු පොල් තෙල් නිෂ්පාදනය 60%, කොප්පරා 70% ක් හා පුන්නක්කු 90% ක් වාර්තා වී ඇත. ප්‍රමිතිය හා එකඟ නොවීම සම්බන්ධව සැකසුම් සංවර්ධන අංශය හරහා නිෂ්පාදන කරුවන් දැනුවත් කිරිමට ප්‍රතිඵල ලබාදී ඇත.

පොල් තෙල් ආදර්ශ - 75 ක් පරික්ෂා කර ඇත.මෙම ආදර්ශ ශ්‍රීලංකා ප්‍රමිතිය හා එකඟ නොවීම පහත පරිදි වේ.

| පරාමිතිය | ප්‍රමිතිය හා එකඟ නොවූ % | ප්‍රමිතියානුකූල නොවූ ප්‍රතිඵල පරාසය | පොල් තෙල් සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රමිතිය |
|---|---|---|---|
| වර්ණය | 7 | 6-13 | අවම 5 |
| අයඩින් අගය | 27 | 11.1 – 17.2 | 11.0 – 7.5 |
| නිදහස් මේද අම්ල ප්‍රමාණය | 44 | 0.9 -4.9 | උපරිම 0.8 |

කොප්පරා ආදර්ශ 50 ක් පරික්ෂා කර ඇත.

| පරාමිතිය | ප්‍රමිතිය හා එකඟ නොවූ % | ප්‍රමිතියානුකූල නොවූ ප්‍රතිඵල පරාසය | කොප්පරා සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රමිතිය |
|---|---|---|---|
| තෙල් ප්‍රමාණය | 70 | 67.3-62.5 | %68අවම |

පුන්නක්කු ආදර්ශ 50 ක් පරික්ෂා කර ඇත.

| පරාමිතිය | ප්‍රමිතිය හා එකඟ නොවූ % | ප්‍රමිතියානුකූල නොවූ ප්‍රතිඵල පරාසය | පුන්නක්කු සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රමිතිය |
|---|---|---|---|
| තෙල් ප්‍රමාණය | 90 | 18.5-6.2 | %8.0 – 6.0 |

## නව ප්‍රමිතින් ඇති කිරීම හා ප්‍රමිති සංශෝධනය කිරීම

පොල් කර්මාන්තයට අදාල නව ප්‍රමිතින් සංශෝධනය කිරීමට තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශය විසින් ප්‍රමිති ආයතනය සමඟ එක්ව කටයුතු කරනු ලැබේ.

2016 වසරේදි පොල් තෙල් ප්‍රමිතිය සංශෝධනය කිරීම සඳහා අවශ්‍යවන පරික්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමට කටයුතු කර ඇති අතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් පවත්වා ඇති ක්‍රියාකාරි කමිටු සඳහා සහකාර අධ්‍යක්ෂ (තත්ව පාලන හා තත්ව ආරක්ෂණ) සහභාගීවී ඇත.

## වෙනත් බාහිර ක්‍රියාකාරම්

1. දැනුවත් කිරිමේ වැඩ සටහන් සඳහා දායකවීම

| වැඩ සටහන | පැවැත්වූ ආයතනය ස්ථානය | දිනය |
|---|---|---|
| 1. පොල් කෙඳි නිෂ්පාදන කර්මාන්තය සඳහා GMP සහතික පත් හඳුන්වාදිමේ වැඩසටහන | පොල් පර්යේෂණ ආයතනය | 28/01/2016 |

| | | |
|---|---|---|
| 2. යන වැඩ සටහන "වැව්ලි සවිය ගමට " යටතේ දැනුවත් කිරීමේ වැඩ සටහන | කුරුනෑගල හා පුත්තලම දිස්ත්‍රික්ක | 13-12/02/2016 |
| 3. වැවක් සම"හ ගමක් වැඩ සටහන " | ජලජීවී වගා සංවර්ධන අධිකාරිය , බත්තරමුල්ල | 06/06/2016 |
| 4. උතුරු පලාත් විශේෂ පොල් වගා කිරීමේ ව්‍යාපෘතිය | වාවකච්චේරිය සංස්කෘතික මධ්‍යස්ථානය | 09/07/2016 |
| 5. පිරිසිදු පොල් තෙල් භාවිතය හා එහි සෞඛ්‍යාරක්ෂිත බව පිළිබඳ දේශනය | අම්පාර දිස්ත්‍රික්කයේ ගොවිජන සමුළුව | 11/07/2016 |
| 6. පිරිසිදු පොල් තෙල් භාවිතය හා එහි සෞඛ්‍යාරක්ෂිත බව පිළිබඳ දේශනය | ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය | ,09 ,08/09/2016 10 |

2. අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය සහභාගිවන දේශිය හා විදේශිය ප්‍රදර්ශණ සඳහා නිදර්ශක පිලියෙල කර ලබාදීම.

## 03.අලෙවි සංවර්ධන සහ පර්යේෂණ අංශය

අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය, 2016 වසරේදී සිය සේවාදායකයින් වන පොල් අලෙවිකරුවන්/අපනයනකරුවන්, කර්මාන්තකරුවන් සහ අනෙකුත් සේවා අවශ්‍යතා සපුරාගන්නවුන් සඳහා පොල් සංවර්ධන අධිකාරියේ ප්‍රධාන මෙහෙයුම් අංශයක් ලෙස විශේෂ කාර්යයන් හා සේවාවන් රැසක් ඉටු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ පොල් හා පොල් ආශ්‍රිත අපනයන ආදායම 2016 වසරේදී රුපියල් බිලියන 84.7 ක් ලෙස වාර්තා වූ අතර, එය පොල් කර්මාන්ත ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ ඉහලම අපනයන ආදායම විය. පොල් අලෙවිකරුවන්/අපනයනකරුවන්ගේ අපනයන වර්ධනය සඳහා බෙහෙවින් ඉවහල් වන නිවැරදි අලෙවිකරණ දත්ත, තොරතුරු වාර්තා හා සේවාවන් නිවැරදිව හා කාර්යක්ෂමව ඉටු කිරීමෙහිලා අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය 2016 වසරේදීද සුවිශේෂ කාර්යයක් ඉටු කරන ලදී.

### 2016 වර්ෂය තුල ක්‍රියාත්මක සැලැස්මට අනුව ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන්

- පොල් නිෂ්පාදන මිළදී ගැනීම සඳහා ජාත්‍යන්තරයේ නව ගැණුම්කරුවන් හඳුනාගැනීමෙන් පොල් කර්මාන්තයේ අපනයන ආදායම වර්ධනය කර ගැනීමේ අරමුණින් කොහු හා වගා මාධ්‍ය පිළිබඳව ජර්මනියේ පැවති IPM - 2016 ප්‍රදර්ශනයට හා ඩුබායිහිදී පැවති IPM- 2016 උද්‍යාන වගා ප්‍රදර්ශනයට අපනයන ආයතන සහභාගි කරවීම, පොල් මද ආශ්‍රිතව ජපානයේ පැවති IFIA වෙළඳ ප්‍රදර්ශනයට සහප්‍රංශයේ පැරිස් නුවර පැවතිආහාර හා පාන වර්ග පිළිබඳ SIAL වෙළඳ ප්‍රදර්ශනයට අපනයනකරුවන් සහභාගි කරවීම හා ජපානයේ පැවති TOKYO INTERNATIONAL GIFT SHOW -2016 පොල් ආශ්‍රිත විසිතුරු භාණ්ඩ නිෂ්පාදන ඇතුලත් වෙළඳ ප්‍රදර්ශනය සඳහා අපනයනකරුවන්/කර්මාන්තකරුවන්ට අනුග්‍රාහකත්වය ලබාදෙමින් ඔවුන් සමඟ පොල් සංවර්ධන අධිකාරිය සහභාගි වීම.
- පොල් කර්මාන්ත ක්ෂේත්‍රය අධීක්ෂණය කිරීම සහ පහසුකම් සැපයීම - අපනයනකරුවන්, වෙළඳුන්, පොල් වතු හා අතරමැදියන් ලියාපදිංචි කිරීම
- පොල් හා තැඹිලි අපනයනය සඳහා අවසරපත් නිකුත් කිරීම හා තාවකාලික අපනයනයන් සඳහා අවසරපත් නිකුත් කිරීම
- පොල් ආශ්‍රිත අපනයන හා ආනයන අධීක්ෂණ කටයුතු
- වෙළඳ ආරවුල් නිරාකරණය කිරීම
- ගෙඩි පොල් හා කොප්පරා වෙන්දේසි පැවැත්වීම
- දිනපතා පොල් හා පොල් ආශ්‍රිත වෙළඳපල මිල ගණන් පුවත්පත් සඳහා ලබාදීම
- පොල් ආශ්‍රිත නිෂ්පාදන, අපනයන/ආනයන ප්‍රමාණ, වෙන්දේසි මිල ගණන්, ලෝක වෙළඳපලේ පොල් ආශ්‍රිත මිල ගණන් ඇතුලත් සති වාර්තා, මාසික වාර්තා සහ 2015වසර සඳහා ශ්‍රී ලංකා පොල් සංඛ්‍යාති වාර්තාව නිකුත් කිරීම.
- දේශීය අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශන26කට සහභාගීවීමෙන් පරිසර හිතකාමී පොල් ආශ්‍රිත කර්මාන්ත පිළිබඳව මහජනතාව හා පාසැල් සිසුන් දැනුවත් කිරීම.

- අගය එකතු කළ පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය හා ඉහල අපනයන ආදායමක් ලබා ගැනීම සඳහා දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල පිළිබඳව ව්‍යවසායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන්ට සහය වීම සඳහා අතුරු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ රාජ්‍ය ආයතන වලට අවශ්‍යවන පොල් ආශ්‍රිත නිෂ්පාදන පොල් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලබාදීමට කටයුතු සකස් කිරීම.
- වාණිජ දෙපාර්තමේන්තුව සමඟ චීනයට අදාලව වෙළඳ ගිවිසුම් සඳහා සාකච්ඡාවලට සහභාගි වීම හා අවශ්‍ය තොරතුරු ලබා දීම.
- පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයන කරුවන් සඳහා විදේශීය වෙළඳ විමසුම් ලබාදීම.
- ගෙඩි පොල් සඳහා ආදේශකයක් වන පොල් කිරි හා පොල් කිරි පිටි භාවිතය පිළිබඳ සමීක්ෂණ කටයුතු පැවැත්වීම හා පුත්තලම දිස්ත්‍රික්කයේ පොල් තෙල් නිෂ්පාදන කර්මාන්ත හඳුනාගැනීමේ සමීක්ෂණ පැවැත්වීම.

## 2016 වසර තුල අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා සේවාවන් හා ඉන් ලබා ගත් ප්‍රගතිය පහත දැක්වේ.

### 3.1ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගි වීම

පොල් හා ඒ ආශ්‍රිත අගය එකතු කරන ලද නිෂ්පාදන අපනයනය කිරීමේදී නව ගැණුම්කරුවන් හා නව වෙළඳපල අත්පත් කර ගැනීම තුලින් පොල් කර්මාන්තයේ අපනයන ආදායම වර්ධනය කර ගැනීමේ අභිලාශයෙන් විදේශීය වෙළඳ ප්‍රදර්ශන වලට සහභාගී වීම සහ අපනයන/කර්මාන්ත කරුවන් රැසක් ඒ සඳහා සහභාගී කරවීම පොල් සංවර්ධන අධිකාරිය විසින් සෑම වසරකම සිදු කරනු ලබයි. එම රටවල තානාපති කාර්යාල හා සම්බන්ධ වෙමින් ශ්‍රී ලාංකික පොල් නිෂ්පාදන සඳහා නව ගැණුම්කරුවන් හඳුනා ගැනීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය ක්‍රියා කරන අතර, අදාල රටවල වාණිජ මණ්ඩල හා සම්බන්ධ වෙමින් එකී අවස්ථා තවදුරටත් පුළුල් කර ගැනීමට මූලික සාකච්ඡා 2016 වසරේ ආරම්භ කිරීමට හැකියාව ලැබුණි.

මෙවැනි ප්‍රදර්ශන සඳහා අපනයන/කර්මාන්ත කරුවන් සමඟ සහභාගි වීමෙන් විදේශ ඇණවුම් වැඩි වශයෙන් ලබා ගැනීමටත්, නව ගැණුම්කරුවන් හඳුනා ගැනීමටත්, ලෝකයේ භාවිතා වන හා ඉදිරි වෙළඳපල අත්පත් කර ගන්නා තරගකාරී භාණ්ඩයන් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමටත්, ජාත්‍යන්තර ප්‍රමිතීන් හා ජාත්‍යන්තර ප්‍රජාව බලාපොරොත්තු වන මට්ටමේ නිෂ්පාදන හා ප්‍රමිතීන් හා ගුණාත්මක භාවය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමටත් හැකියාව ලැබේ.මෙසේජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා අපනයනකරුවන් සහභාගි කරවීමේදී ලබා ගන්නා නව ඇණවුම් මගින් පොල් කර්මාන්තයේ අපනයන ආදායම වර්ධනය කිරීමට මහඟු රුකුලක් වේ.

**2016 වසරේදී පහත සඳහන් ජාත්‍යන්තර ප්‍රදර්ශන සඳහාපොල් සංවර්ධන අධිකාරිය සහභාගී විය.**

i. පොල් කෙඳි ආශ්‍රිත අගය වැඩිකල නිෂ්පාදනයන් වශයෙන් සැළකෙන වගාමළු, කොහු මල් පෝච්චි, මිහිසළු, බුරුසු, කොහු බත් කැට යන නිෂ්පාදන ඉලක්ක කර ගනිමින් උද්‍යාන සහ ගෙවතු අලංකරණය සඳහා වන ජර්මනියේ පැවැත්වූ IPM -2016 ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය සඳහා අපනයනකරුවන් 04 දෙනෙකු සහභාගී කරවූ අතර, ලබා ගත් ඇණවුම්






මගින් අදාළ ද්විපාර්ශවික සාකච්ඡා මේ වන විටත් සිදු කරමින් හා අදාල භාණ්ඩවල මිළ ගණන් හුවමාරු කර ගනිමින් පවතින බවත්, සහභාගි වූ අපනයනකරුවන් සඳහා ඇණවුම් තොග තහවුරු වී ඇති බවත් ඔවුහු පොල් සංවර්ධන අධිකාරිය වෙත වාර්තා කර ඇත.

ii. ජපානයේ ටෝකියෝ නගරයේදී වෙළඳ හා පාරිභෝගික ප්‍රජාව ඉලක්ක කර ගනිමින් පැවති ප්‍රධාන පෙලේ වෙළඳ ප්‍රදර්ශනයක් වන IFIA ප්‍රදර්ශනය සඳහා තෙවන වතාවට පොල් සංවර්ධන අධිකාරිය විසින්කර්මාන්තකරුවන්/අපනයනකරුවන් 06 දෙනෙකු2016 වසරේදී සහභාගී කරවීමට කටයුතු යොදන ලදි.




පොල් මද ආශ්‍රිත නිෂ්පාදනවන නැවුම් පොල් තෙල්, පොල් කිරි, පොල් කිරි පිටි, පොල් වතුර හා තැඹිලි යන නිෂ්පාදන සඳහා ජපානයේ නව ගැණුම්කරුවන් සොයා ගැනීමෙන්, දැනට අපනයනය කරනු ලබන ගැණුම්කරුවන් හා පවතින සම්බන්ධතා තවදුරට වර්ධනය කර ගැනීමටත්, ගණුදෙනු සඳහා සාකච්ඡා මට්ටමේ පවතින ගැණුම්කරුවන් තවදුරටත් හමුවී සාකච්ඡා පැවැත්වීමටත් මෙහිදී

හැකියාව ලැබුණි. මෙම නිෂ්පාදන සඳහා ජපාන ගැණුම්කරුවන් ඉතාමත් ඉහල ප්‍රමිතියක් බලාපොරොත්තු වන බවත්, උසස් තත්ත්වයේ නිෂ්පාදන ජපානය වෙත සපයන ලෙසත් අවධාරණය කළ ගැණුම්කරුවන් ඒ සඳහා ඉහල මිළක් ගෙවීමට ඔවුන් සූදානම් බවද පවසන ලදී.

iii. ජපානයේ පැවති පොල් ආශ්‍රිත විසිතුරු භාණ්ඩ සඳහා වූ වෙළඳ ප්‍රදර්ශනය (TOKYO INTERNATIONAL GIFT SHOW - 2016, JAPAN) සඳහා ප්‍රථම වරට පොල් සංවර්ධන අධිකාරිය නිෂ්පාදකයින් හතරදෙනෙකු සහභාගි කරවීමට කටයුතු කරන ලදී. පොල් ආශ්‍රිත විසිතුරු භාණ්ඩ (පොල් කටු ආශ්‍රිත, පොල් ලී ආශ්‍රිත, පොල් කෙඳි ආශ්‍රිත) අපනයනය තවමත් ඉතා දුර්වල මට්ටමක පවතින බැවින් හා එම නිෂ්පාදකයින් තරමක් සුළු පරිමාණයේ ව්‍යවසායකයින් බැවින් ඔවුන් සඳහා වැඩි අවධානයක් ලබා දීමෙන් ඔවුන්ගේ නිෂ්පාදන ජපාන වෙළඳපල තුල ප්‍රචලිත කිරීමේ අරමුණින් පොල් සංවර්ධන අධිකාරිය මෙම ප්‍රදර්ශනය සඳහා සහභාගි වූ අතර, සහභාගි වූ අපනයනකරුවන් මේ වන විට අදාල සාම්පල හා මිල ගණන් හුවමාරු කර ගනිමින් අපනයන කටයුතු සඳහා සූදානමින් සිටින බව පොල් සංවර්ධන අධිකාරිය වෙත වාර්තා කර ඇත.







iv. ආහාර හා පාන වර්ග පිළිබඳ පවත්වන ලොව ප්‍රමුඛතම වෙළඳ ප්‍රදර්ශනයක් වන ප්‍රංශයේ පැරිස්නුවර පැවති“SIAL” වෙළඳ ප්‍රදර්ශනය සඳහා 2016 වසරේදී සහභාගි වූ අතර, ඒ සඳහා අපනයන/කර්මාන්ත කරුවන් 05 දෙනෙකු සහභාගි කරවීය. නැවුම් පොල් තෙල්, පොල්



කිරි, දියිදි පොල්, පොල් ක්‍රීම්, තැඹිලි, පොල් වතුර යන නිෂ්පාදන සඳහා එහිදී යුරෝපා ගැණුම්කරුවන්ගෙන් වැඩි අවධානයක් යොමු කළ අතර, නැවුම් පොල් තෙල් සඳහා ඔවුන්ගේ ඇති කැමැත්ත එහිදී කැපීපෙනුනි.

සහභාගි වූ ප්‍රදර්ශනයන්හිදී මුණගැසුනු ගැණුම්කරුවන් විශේෂයෙන් පොල් මද ආශ්‍රිත භාණ්ඩ ආනයනය පිළිබඳව අපනයනකරුවන් හා සාකච්ඡා පවත්වමින් සිටින අතර ඉදිරියේදී නැවුම් පොල් තෙල් සඳහා වැඩි ඉල්ලුමක් ඇති වන බවත්, එවැනි තත්ත්වයක් තුල වැඩි නැවුම් පොල් තෙල් ප්‍රමාණයක් අපනයනය කිරීමට අවස්ථාව හිමි වන බවත් අපනයනකරුවෝ පවසති.

v. උද්‍යාන හා ගෙවතු අලංකරණය සඳහා පැවති IPM - DUBAI, 2016වෙළඳ ප්‍රදර්ශනය සඳහා අපනයනකරුවන් සිව්දෙනෙකු සමඟ පොල් සංවර්ධන අධිකාරිය ප්‍රථම වරට සහභාගි විය. විශේෂයෙන් මැද පෙරදිග කලාපයේ ගැණුම්කරුවන් මේ සඳහා සහභාගි වූ අතර, සහභාගි වූ ශ්‍රී ලාංකික අපනයනකරුවන් සියළුදෙනා සමගම නව ගැණුම්කරුවන් රැසක් සාකච්ඡා පැවැත්වූ අතර, තවදුරටත් පවත්වනු ලබන සාකච්ඡා ඉදිරියේදී ඵලදරනු ඇති බවත් අපයනයකරුවන් පොල් සංවර්ධන අධිකාරිය වෙත දැනුම් දී ඇත.






## 3.2 නිෂ්පාදකයින් හා අනාගත ගැණුම්කරුවන්ගේ ජාලයක් ඇති කිරීම

### 3.2.1 පොල් හා පොල් ආශ්‍රිත නිමි භාණ්ඩ අලෙවිකරණ සම්බන්ධ සියල්ලන් හා පොල් වතු ලියාපදිංචිය

පොල් කර්මාන්ත ක්ෂේත්‍රයෙහි අපනයනයන්හි නියැලෙන අපනයනකරුවන්ගේ ලියාපදිංචිය 2015 වසරට සාපේක්ෂව 2016 වසරේදී 7% ක පමණ සුළු වැඩිවීමක් දක්නට ලැබෙන අතර, පොල් වතු ලියාපදිංචිය 2015 වසරට සාපේක්ෂව සුළු අඩුවීමක් පෙන්නුම් කරයි.

| ලියාපදිංචි කිරීම | 2015 | 2016 |
|---|---|---|
| අපනයන කරුවන් | 550 | 590 |
| බ්‍රෝකර්වරුන් | 17 | 14 |
| වෙළඳුන් | 67 | 55 |
| පොල් වතු | 276 | 265 |

**ලියාපදිංචි කටයුතු - 2015/2016**

## 3.3 පොල් හා කොප්පරා වෙන්දේසි පැවැත්වීම

### 3.3.1 කොළඹ ගෙඩි පොල් වෙන්දේසිය

පොල් වගාකරුවන් සඳහා ඔවුන්ගේ පොල් තොග සාධාරණ මිලට අලෙවි කර ගැනීම සඳහාත්, උසස් තත්ත්වයේ පොල් තොග ගැණුම්කරුවන් සඳහා සාධාරණ මිළකට ලබා ගැනීම සඳහාත් 1994 වසරේදී ආරම්භ කරන ලද පොල් වෙන්දේසිය 2016 වසරේදීද පොල් වෙන්දේසි 50ක් පැවැත්වීමට අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශයට හැකි විය.

වගාකරුවා හා ගැණුම්කරුවා යන දෙපාර්ශවයටම අවාසියක් නොවන ආකාරයට පොල් වෙන්දේසියතුලින් නිරන්තරයෙන් මිළ ගණන් තීරණය වන තත්ත්වයක් තුල රටේ සමස්ථ පොල් මිළ තීරණය කරන තීරණ සාධකය කොළඹ පොල් වෙන්දේසිය බවට පත්ව ඇත.

2016 වසරේදී වෙන්දේසිය සඳහා පොල් ගෙඩි 87,379,350 ක ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබුණි.

| වර්ෂය | ගෙඩි ප්‍රමාණය | | සාමාන්‍ය මිල රු. (ගෙඩි 1000 කට) |
|---|---|---|---|
| | ඉදිරිපත් කල ප්‍රමාණය | විකුණූ ප්‍රමාණය | |
| 2015 | 62,136,935 | 44,994,090 | 33,639.82 |
| 2016 | 87,379,350 | 52,038,756 | 27,264.31 |

පොල් වෙන්දේසිය 2016 වසරේ අග භාගයේ සිට අන්තර්ජාලය හරහා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අත්හදා බලමින් සිටින අතර 2017 වසරේද එය අන්තර්ජාලය හරහා ක්‍රියාත්මක කිරීමට හැකිවේයැයි අපේක්ෂා කරන අතර අවශ්‍ය ඕනෑම අයෙකුට ගෙඩි පොල් වෙන්දේසියට ඒ හරහා සහභාගි වීමේ අවස්ථාව උදාවේ.

### 3.3.2 ප්‍රාදේශීය ගෙඩි පොල් වෙන්දේසිය

2016 වසරේදීද මසකට වරක් බැගින් අවස්ථා 12කදී කුලියාපිටිය ප්‍රාදේශීය පොල් වෙන්දේසිය පවත්වන ලද අතර කුඩා හා මධ්‍යමපරිමාණයේ පොල් වගාකරුවන්ට ඔවුන්ගේ පොල් තොග සඳහා සාධාරණ මිළක් ලබා ගැනීමට හැකිවන පරිදි වෙන්දේසිය ක්‍රියාත්මක කරනු ලබන අතර එහි ප්‍රගතිය පහත දැක්වේ.

| වර්ෂය | ගෙඩි ප්‍රමාණය | | සාමාන්‍ය මිල රු. (ගෙඩි 1000 කට) |
|---|---|---|---|
| | ඉදිරිපත් කල ප්‍රමාණය | විකුණූ ප්‍රමාණය | |
| 2015 | 1,834,570 | 1,434,842 | 36,622.35 |
| 2016 | 3,345,936 | 2,519,009 | 27,754.00 |

2015 වසරට සාපේක්ෂව 2016 වසරේදී කුලියාපිටිය ප්‍රාදේශීය පොල් වෙන්දේසිය සඳහා ඉදිරිපත් වූ පොල් ගෙඩි ප්‍රමාණයේ 82% ක වැඩිවීමක් දක්නට ලැබුණි.

ප්‍රාදේශීය පොල් වෙන්දේසි තවදුරටත් ව්‍යාප්ත කිරීමේ අරමුණින් කෑගල්ල හා පුත්තලම ප්‍රදේශයේ තවත් ප්‍රාදේශීය පොල් වෙන්දේසි ආරම්භ කිරීමේ මූලික සැලසුම 2016 වසරේ අග භාගයේ ආරම්භ විය.

### 3.3.3 කොප්පරා වෙන්දේසිය

2016 වසරේදී අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් කොප්පරා වෙන්දේසි 24 ක් පවත්වන ලදී.

| වර්ෂය | ඉදිරිපත් කළ ප්‍රමාණය (කි.ග්‍රෑ.) | විකුණූ ප්‍රමාණය (කි.ග්‍රෑ.) | සාමාන්‍ය මිළ ගණන් (රු.කි.ග්‍රෑ 250 පාරමක් සඳහා) | |
|---|---|---|---|---|
| | | | විශිෂ්ඨ අංක 1 | විශිෂ්ඨ අංක 2 සහ 3 |
| 2015 | 293,085 | 260,292 | 41,035 | 37,516 |
| 2016 | 211,394 | 209,666 | 38,088 | 37,060 |

### 3.3.4 වෙළඳ ආරවුල් සම්බන්ධ කටයුතු

පොල් වෙන්දේසියේදී හා කොප්පරා වෙන්දේසියේදී අලෙවිකරුවන් හා ගැණුම්කරුවන් අතර ඇතිවන යම් යම් වෙළඳ ආරවුල් සමථයකට පත්කිරීම සඳහා මැදිහත්කරු ලෙස 2016 වසරේදීද අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය සුවිශේෂ කාර්යය භාරයක් ඉටු කළ අතර පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයන අවස්ථාවලදී ඇති වූ වෙළඳ ආරවුල් නිරාකරණය කිරීම සඳහා ද අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය වැඩි දායකත්වයක් ලබා දෙන ලදී.

## 3.4 පෞද්ගලික අංශයේ සහභාගීත්වයෙන් අලෙවි මාර්ග සංවිධානය කිරිම

### 3.4.1 දේශීය වෙළඳ ප්‍රදර්ශන

දිවයින පුරා පැවති වෙළඳ, කෘෂිකර්ම හා අධ්‍යාපන ප්‍රදර්ශන 26 කට 2016 වසරේදී අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය සහභාගි වු අතර එහිදී ප්‍රදර්ශන නැරඹීමට පැමිණි මහජනතාව හා පාසැල් සිසුන් සඳහා පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ අවශ්‍ය විස්තර, තොරතුරු, දත්ත හා උපදෙස් ලබා දෙන ලදී.






පහත දැක්වෙන දේශීය ප්‍රදර්ශන සඳහා අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය සහභාගි විය.

| ප්‍රදර්ශනයේ නම | ස්ථානය | සංවිධානය |
|---|---|---|
| පළාත් බලශක්තිඅධ්‍යාපන සංවර්ධන වැඩ සටහන | පොළොන්නරුව රාජකීය විද්‍යාලය, මඩකළපුව වෙන්කලාඩි මධ්‍ය මහා විද්‍යාලය, වවුනියාව දෙමළ ජාතික පාසැල, ගුරුදෙනිය ප්‍රජා මධ්‍යස්ථානය, ගාල්ල සුදර්මා මධ්‍ය මහා විද්‍යාලය, කෑගල්ල ස්වර්ණ ජයන්ති මධ්‍ය මහා විද්‍යාලය, බොරැල්ල සී.ඩබ්.ඩබ්.කන්නන්ගර විද්‍යාලය, ශ්‍රීමත් ජෝන් කොතලාවල මහා විද්‍යාලය, හාලිඇල මධ්‍ය මහා විද්‍යාලය | විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය |
| යාපනය ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය | යාපනය නගර සභා ක්‍රිඩාංගනය | ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානය |
| වස විස නැති රටක් | සිරිමාවෝ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව | කෘෂිකර්ම අමාත්‍යාංශය |

| ප්‍රදර්ශනයේ නම | ස්ථානය | සංවිධානය |
|---|---|---|
| ළිය වරුණ -2016 | නිදහස් චතුරශ්‍රය | ස්වාධීන රූපවාහිනී ආයතනය |
| අම්පාර දිස්ත්‍රික් ගොවිජන සමුළුව | අම්පාර මහජන ක්‍රීඩාංගනය | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව |
| වැවිලි සවිය | රස්නායකපුර | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| ප්‍රෝෆුඩ් ප්‍රෝපැක් හා ඇග්බිස් | සිරිමාවෝ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව | ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානය |
| ජනපති ජංගම සේවය | පොලොන්නරුව රාජකීය විද්‍යාලය | |
| දසවස් සැමරුම් ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය | ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය, බදුල්ල | ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය |
| මඩකළපුව ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය | මඩකළපුව | ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානය |
| උතුරු පලාත් පොල් සංවර්ධන වැඩසටහන | චාවකච්චේරිය, යාපනය | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| වැවිලි සවිය | හොරවිපතාන | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| සංජනනි මාධ්‍ය උලෙල 2016 | කැළණිය | කැළණිය විශ්ව විද්‍යාලය |
| EMINENCE 75 | කළුතර බාලිකා විද්‍යාලය | කළුතර බාලිකා විද්‍යාලය |
| ප්‍රාදේශීය කෘෂිකර්ම ප්‍රදර්ශනය -2016 | මන්නාරම | උතුරු පළාත් සභාව |
| මැදගොඩ කෘෂි නවෝදය-2016 | මහවැව | මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| වැවිලි සවිය ගමින් ගමට | මොණරාගල | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |

### 3.4.2 ප්‍රදර්ශනාත්මක වැඩසටහන් පැවැත්වීම

සහභාගී වූ දේශීය ප්‍රදර්ශන වලට සමගාමීව, පරිභෝජනයේදී සිදුවන පොල් නාස්තිය අවම කිරීමේ අරමුණෙන් පොල් මද ආශ්‍රිත නිෂ්පාදනයන්ගෙන් සකසා ගන්නා ආහාර පිළිබඳව මහජනතාව දැනුවත් කිරිමේ ප්‍රදර්ශනාත්මක වැඩසටහන් පැවැත්වීමද 2016 වර්ෂයේදී සිදුකරන ලදී. මේ සඳහා නෙස්ලේ ලංකා සමාගම, රේණුකා ඇග්‍රි ෆුඩ්ස් ආයතනය, සිලෝන් බිස්කට්ස් සමාගම වැනි පෞද්ගලික

ව්‍යවසායකයින්ගේ සහය ලැබුණු අතර ඇඩම්ජී ලුක්මන්ජී ආයතනයේ සහය ඇතිව පොල්තෙල් ආශ්‍රිත ප්‍රදර්ශනාත්මක වැඩසටහන්ද පවත්වන ලදී.

## 3.5 දේශීය හා විදේශීය පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන භාවිතයන් හඳුනාගැනීම සඳහා අලෙවි සමීක්ෂණ පැවැත්වීම

2016 වසරේදී අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් ,

- පොල් කිරි පිටි භාවිතය පිළිබඳ දේශීය පාරිභෝගිකයන්ගේ නැඹුරුව පිළිබඳ සොයා බැලීමට හා
- පුත්තලම දිස්ත්‍රික්කයේ පොල් තෙල් නිෂ්පාදකයන් හා අලෙවිකරුවන් හඳුනා ගැනීම සඳහා සමීක්ෂණ සිදු කරන ලදී.

ඉහත සමීක්ෂණ තුළින් පහත අරමුණු ඉටුකර ගැනීම අපේක්ෂා කෙරිනි.

- ගෙඩි පොල් වෙනුවට අගය එකතු කළ නිෂ්පාදනයන් වන පොල් කිරි පිටි භාවිතය සඳහා පාරිභෝගිකයන් අතර ඇති කැමැත්ත හඳුනා ගැනීම.
- පොල් කිරි පිටි භාවිතා නොකිරීමට බලපා ඇති හේතු සාධක හඳුනා ගැනීම.
- දේශීය පොල් තෙල් නිෂ්පාදනය ගණනය කිරීම සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ පොල් තෙල් නිෂ්පාදන ආයතනවල නිවැරදි දත්ත හා තොරතුරු ලබා ගැනීම.
- පොල් තෙල් නිෂ්පාදකයන් හා අලෙවිකරුවන් මුහුණදෙන ගැටළු පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම හා පොල් තෙල් කර්මාන්තයේ නිෂ්පාදන පිරිවැය හඳුනා ගැනීම.

## 3.6 පොල් හා පොල් ආශ්‍රිත භාණ්ඩ පිළිබඳ නිෂ්පාදනයන්, වෙළඳාම සහ අපනයන සඳහා තොරතුරු සන්නිවේදනය කිරීම

පොල් හා ඒ ආශ්‍රිත කර්මාන්තකරුවන්ට මෙන්ම අපනයනකරුවන් සඳහා සිය නිෂ්පාදන වෙළඳ හා අපනයන තීරණ ගැනීමේදී පොල් කර්මාන්ත හා අපනයනනයට අදාල නිවැරදි වෙළඳ තොරතුරු හා දත්ත ලබා ගෙන නිවැරදි විශ්ලේෂණයක් තුළින් සිය කර්මාන්ත හා වෙළඳ රටාව තීරණය කිරීම සඳහාත්,ඔවුන්ගේ තීරණ ගැනීමේ හැකියාව පහසු කරලීම සඳහාත් 2016 වසරේදී අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශයේ තොරතුරු සේවාව පහත දක්වා ඇති ක්‍රියාවලින් තුළින් විශේෂ කාර්යයභාරයක් ඉටුකරන ලදි.

- පොල් කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන තොරතුරු, අපනයන සහ ආනයන තොරතුරු හා දත්ත ලබා ගෙන අදාල පාර්ශවකරුවන් වෙත බෙදා හැරීම

- පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනවල දෛනික මිළ ගණන් ලබා ගනිමින් ඉංග්‍රීසි සහ සිංහල මාධ්‍යයෙන් දිනපතා පුවත්පත් මඟින් 2016 වසරේදීද ප්‍රකාශයට පත් කිරීම.

- ප්‍රකාශන 48 කින් සමන්විත "Coco Market Focus" සති වාර්තා ප්‍රකාශනය 2016 වසරේදීද ප්‍රකාශයට පත් කළ අතර, එහි පොල් හා කොප්පරා වෙන්දේසි මිළ ගණන්,දේශීය පොල් ආශ්‍රිත භාණ්ඩ සඳහා වන ගොවිපල මිළ ගණන්, තොග මිළ ගණන් හා ජාත්‍යන්තර මිළ ගණන් ඇතුලත් විය.




- ප්‍රකාශන 12 කින් සමන්විත "Coco Market Focus" මාසික සඟරාව 2016 වසර තුළදීද ප්‍රකාශයට පත් කරන ලදී. සියලුම පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්ගේ අපනයන ප්‍රමාණයන්, මිළගණන්, අපනයනය කරන ලබනු රටවල් සහ ආනයනය කරනු ලබන බාද්‍ය තෙල්, පොල් තෙල් ආනයන ප්‍රමාණයන් හා මිළ ගණන් ඒවායේ ඇතුලත් වූ අතර, පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ හා අපනයන ක්ෂේත්‍රයේ නියැලි පාර්ශවකරුවන් සඳහා මෙම ප්‍රකාශය බෙහෙවින් සිය වෙළඳ තීරණ ගැනීම සඳහා බෙහෙවින් ඉවහල් විය.




- පොල් හා ඒ ආශ්‍රිත සියලුම අපනයන හා ආනයන ආශ්‍රිත මිළ ගණන්, අපනයනනය කරනු ලබන රටවල්, ආනයනික බාද්‍ය තෙල්, ජාත්‍යන්තර පොල් ඵලදා දත්ත, නිෂ්පාදන හා අපනයන තොරතුරු, පොල් සංවර්ධන අධිකාරියේ පොල් වෙන්දේසිය හා සම්බන්ධ පාර්ශවකරුවන්ගේ තොරතුරු, අපනයනකරුවන්ගේ තොරතුරු ඇතුලත් අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මගින් ප්‍රකාශයට පත් කරන Sri Lanka Coconut Statistics- 2015 ප්‍රකාශනය2016 වසරේදී ඉදිරිපත් කළ අතර මෙම ප්‍රකාශනය දේශීය හා විදේශීය වශයෙන් ඉහළ ඉල්ලුමක් ඇති පොල් කර්මාන්ත හා අපනයන ක්ෂේත්‍රයේ දත්ත, තොරතුරු හා විස්තර ඇතුලත් පරිපූර්ණ වාර්ෂික ප්‍රකාශනයකි.



- **වර්තමාන හා අපේක්ෂිත පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් පිළිබඳව තොරතුරු විධිමත්ව රැස්කිරීම, සටහන් කිරීම හා ප්‍රචාරණය කිරීම**

  දේශීය හා විදේශීය වශයෙන් පොල් හා ඒ ආශ්‍රිත කර්මාන්ත ආශ්‍රිතව මිළ ගණන් මත තීරණ ගැනීම සඳහා පහත සඳහන් ආයතන වෙත අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය 2016 වසරේදී දත්ත ලබා දීම සිදු කරන ලදී.

  - ශ්‍රී ලංකා මහ බැංකුව
  - ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව
  - අපනයන සංවර්ධන මණ්ඩලය
  - කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සහ අනෙකුත් රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතන
  - එමෙන්ම, ආසියානු පැසිපික් පොල් ප්‍රජාව, විදේශ සඟරා (Cocommunity, Oil World, UCAP, Indian Coconut Journal) ආදී විදේශීය ආයතන හා සම්බන්ධ වෙමින් ලබා ගන්නා තොරතුරු හා දත්ත නිරන්තරයෙන් ලාංකීය පොල් ප්‍රජාවට ලබා දීමෙන් විශේෂ කාර්යය භාරයක් 2016 වසරේදීද අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් ඉටු කරන ලදී.

### 3.6.1 පොල් කර්මාන්තයේ අපනයන ආදායම

පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්තයේ අපනයන ආදායම (2006 - 2016)

| වසර | වටිනාකම | |
|---|---|---|
| | (රු. මිලියන) | (ඇ. ඩො. මිලියන) |
| 2006 | 19,661 | 189.12 |
| 2007 | 24,097 | 217.83 |
| 2008 | 28,094 | 259.33 |
| 2009 | 29,081 | 253.00 |
| 2010 | 32,433 | 286.86 |
| 2011 | 47,306 | 427.85 |
| 2012 | 46,667 | 365.72 |
| 2013 | 47,952 | 371.40 |
| 2014 | 72,880 | 558.21 |
| 2015 | 75,259 | 553.63 |
| 2016 | 84,702 | 581.74 |




පොල් කර්මාන්ත ඉතිහාසයේ පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීමෙන් මෙතෙක් ලබා ඇති ඉහළම වාර්තාගත අපනයන ආදායම 2016 වසරේදී ලබා ගත් අතර, එය රුපියල් බිලියන 84.70 ක් වූ අතර, එය 2015 වසරට සාපේක්ෂව 13% ක වර්ධනයකි.

2016 වසරේදී පොල් මද ආශ්‍රිත අපනයන ආදායමේ 11% ක වර්ධනයක් පෙන්වූ අතර, පොල් කෙඳි ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන අපනයන ආදායමේ 24% ක වර්ධනයක් වාර්තා කර ඇත.

එමෙන්ම, පොල් කටු ආශ්‍රිත අපනයන ආදායම 5% ක පමණ වර්ධනයක් පෙන්නුම් කළ අතර, 2017 වසරේ පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්තයෙහි අපනයන ආදායම රු. බිලියන 95ඉක්මවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 3.7 නව නිෂ්පාදන, අගය එකතු කිරීම්, වෙළඳපල ප්‍රවර්ධනය හඳුන්වාදීම සහ වෙළඳපල ප්‍රවිෂ්ඨය වැඩිකිරීම

**3.7.1** 2015 වසරට සාපේක්ෂව 2016 වසරේදී නව ගැණුම්කරුවන් හඳුනා ගැනීම හේතුවෙන් තැඹිලි අපනයනයේ පැහැදිලි වර්ධනයක් දැකිය හැකි විය. පොල් වතුර අපනයනයේද 2016 වසරේ වර්ධනයක් දක්නට ලැබෙන අතර නැවුම් පොල් තෙල් අපනයනය සඳහා ද අපනයනකරුවන් වැඩි නැඹුරුවක් පෙන්නුම් කර ඇත. 2017 වසරේද මෙම නිෂ්පාදනයන්ගේ ඉහළ ඉල්ලුමක් ජාත්‍යන්තර වෙළඳපලෙන් අපේක්ෂා කෙරේ.

**3.7.2** පොල් ආශ්‍රිත භාණ්ඩ අපනයනයේදී ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ජාත්‍යන්තර වෙළඳපල තුළ තහවුරු කිරීම සඳහා "Ceylon Coconut"යන සන්නාම නාමය යොදාගැනීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු ශ්‍රීලංකාවේ ජාතික බුද්ධිමය දේපළ ආයතනය සමඟ සම්බන්ධවී තවදුරටත් සිදු කිරීම.

**3.7.3** පොල් සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය මගින් වඩාත් විධිමත් ලෙස දත්ත හුවමාරු කර ගැනීමේ කටයුතු 2016 වසරේදීද සිදු කරන ලදී.

**3.7.4** දේශීය සුළු පරිමාණ කර්මාන්තකරුවන්ට සහය වීම සඳහා අතුරු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ රාජ්‍ය ආයතන වලට අවශ්‍ය කරන පොල් ආශ්‍රිත භාණ්ඩ පොල් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති කර්මාන්තකරුවන් ගෙන් මිළදී ගෙන අවශ්‍ය ආයතන වෙත ලබා දීමට අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය කටයුතු කිරීම.

**3.7.5**අගය එකතු කළ පරිසර හිතකාමී පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන භාවිතය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ප්‍රවර්ධන සේවාවක් 2016 වසරේදීද සිදු කිරීම.

## 3.8 අලෙවි සංවර්ධන සහාය සේවා

- නිෂ්පාදන / වෙළඳපොලවල් හා විවිධ සේවාවන් පිළිබඳව උපදේශක සේවාවන් ලබාදීමදේශීය හාජාත්‍යන්තර වෙළඳ ඇණවුම් පිළිබඳ තොරතුරු කර්මාන්තකරුවන්ට/ අපනයනකරුවන්ට/ගැණුම්කරුවන්ට ලබා දීම.
- පොල් කර්මාන්ත ක්ෂේත්‍රයට අදාල නිෂ්පාදනයන් සඳහා පුරෝකථනයන් සැකසීම, වෙළඳ ප්‍රතිපත්ති සැකසීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට සහාය වීම.

## පොල් නිෂ්පාදිත අපනයන - 2015 /2016
## සංසන්දනාත්මක සංඛ්‍යාලේඛණ

| නිෂ්පාදන වර්ගය | ප්‍රමාණය (මෙ.ටො.) | | | වටිනාකම (රු.මිලියන) | | |
|---|---|---|---|---|---|---|
| | 2015 | 2016 | % වෙනස | 2015 | 2016 | % වෙනස |
| **1.පොල් මද නිෂ්පාදිතයන්** | | | | | | |
| 1) පොල් තෙල් | 8,679 | 7,094 | -18 | 6,299.02 | 3,797.86 | -40 |
| 2) නැවුම්පොල්තෙල් | 13,353 | 15,585 | 17 | 10,110.25 | 9,891.86 | -2 |
| 3) දිසිදි පොල් | 36,131 | 49,200 | 36 | 12,604.19 | 15,378.30 | 22 |
| 4) කොප්පරා | 489 | 1,184 | 142 | 103.98 | 250.93 | 141 |
| 5) ගෙඩි පොල් (1000 ගෙඩි) | 13,204 | 30,433 | - | 1,024.77 | 2,158.82 | - |
| 6) බීජ පොල් (ගෙඩි) | - | 5,394 | - | - | 6.37 | - |
| 7) තැඹිලි පොල් (ගෙඩි) | 3,198,907 | 4,057,002 | 27 | 288.23 | 439.24 | 52 |
| 8) පුන්නක්කු | 4,184 | 17,122 | 309 | 251.49 | 688.54 | 174 |
| 9) පොල් කිරම | 2,874 | 3,652 | 27 | 1,216.75 | 1,375.35 | 13 |
| 10) පොල් කිරි | 21,957 | 30,497 | 39 | 4,641.74 | 6,451.75 | 39 |
| 11) පොල් කිරිපිටි | 5,642 | 6,793 | 20 | 3,530.16 | 4,165.13 | 18 |
| 12) මේදය ඉවත් කල පොල් | 3,999 | 5,730 | 43 | 843.99 | 1,029.52 | 22 |
| 13) පොල් වතුර | 2,954 | 3,078 | 4 | 444.82 | 409.76 | -8 |
| 14) පොල් අරක්කු (ලීටර්) | 7,496 | 25,680 | 243 | 6.53 | 15.65 | 140 |
| 15) විනාකිරි (ලීටර්) | 33,505 | 50,892 | 52 | 11.78 | 16.14 | 37 |
| 16) පොල් බටර් | 19 | 51 | 168 | 29.89 | 32.51 | 9 |
| 17) පොල් පිටි | 256 | 722 | 182 | 49.75 | 96.28 | 94 |
| *උප එකතුව - පොල් මද නිෂ්පාදිතයන්* | | | | **41,457.35** | **46,204.01** | **11** |
| **2.කෙඳි නිෂ්පාදිතයන්** | | | | | | |
| 18) ගුදිරි කෙඳි | 18,090 | 18,647 | 3 | 994.65 | 936.73 | -6 |
| 19) බ්‍රිස්ටල් කෙඳි | 11,612 | 15,525 | 34 | 686.23 | 770.72 | 12 |
| 20) අඹරන ලද කෙඳි | 62,584 | 60,698 | -3 | 2,993.74 | 2770.94 | -7 |
| *උප එකතුව - කෙඳි නිෂ්පාදිතයන්* | **92,287** | **94,870** | 3 | **4,674.62** | **4,478.39** | -4 |
| **3.පොල් කටු නිෂ්පාදිතයන්** | | | | | | |
| 21) පොල් කටු අඟුරු | 8,853 | 5,142 | -42 | 650.17 | 380.02 | -42 |
| 22) පොල් කටු හා පොල් කටු කුඩු | 369 | 418 | 13 | 23.83 | 24.18 | 1 |
| 23) පොල් කටු සක්‍රීය කල කාබන් | 31,747 | 34,987 | 10 | 9,562.46 | 10,352.99 | 8 |
| **උප එකතුව - පොල්කටු නිෂ්පාදිතයන්** | **40,968** | **40,547** | -1 | **10,236.46** | **10,757.19** | **5** |
| **4.නිමි භාණ්ඩ නිෂ්පාදිතයන් (කොහු කෙඳිආශ්‍රිත)** | | | | | | |
| 24) කොහු ලණු | 2,617 | 1,169 | -55 | 255.61 | 141.23 | -45 |
| 25) කොහු කඹ | 5,960 | 7,349 | 23 | 908.32 | 1,171.78 | 29 |
| 26) තවාෂි බුරුසු (සංඛ්‍යාව) | 24,195,093 | 25,206,957 | 4 | 566.71 | 600.21 | 6 |
| 27) කොසු හා බුරුසු (සංඛ්‍යාව) (තවාෂි බුරුසු හැර) | 23,145,713 | 23,754,924 | 3 | 2,943.39 | 3,164.95 | 8 |
| 28) රබර් මිශ්‍ර කොහු පැඩ් හා ඇඳන් මෙට්ට (සංඛ්‍යාව) | 4,324,408 | 247,234 | -94 | 204.32 | 152.16 | -26 |
| 29) කොහු ලණු පැදුරු භාබුමුතුරුණු (වර්ග මීටර) | 675,885 | 475,777 | -30 | 686.62 | 504.04 | -27 |
| 30) කොහු කලාල (වර්ග මීටර) | 17,217 | 16,832 | -2 | 7.07 | 13.02 | 84 |
| 31) කොහු බත් | 169,544 | 186,820 | 10 | 7,259.58 | 9,407.48 | 30 |
| 32) පොල් ලෙලි කැබලි | 16,887 | 21,471 | 27 | 1,036.45 | 1,467.45 | 42 |
| 33) මිහිසළු | 3,355 | 3,865 | 15 | 492.30 | 644.08 | 31 |
| 34) උද්‍යාන වගා සඳහා යොදා ගන්නාකොහු නිෂ්පාදිතයන් | 49,448 | 69,412 | 40 | 4,153.49 | 5,779.18 | 39 |
| **උප එකතුව - කොහු ආශ්‍රිත නිෂ්පාදිතයන්** | | | | **18,513.86** | **23,045.58** | **24** |
| **5.වෙනත් නිෂ්පාදිතයන්** | | | | | | |
| 35) පොල් ඉරටු | 6,257 | 6,136 | -2 | 166.68 | 201.34 | 21 |
| 36) පොල් ලී | 0.826 | - | - | 0.30 | - | - |
| 37) ෆැටි ඇසිඩ් | 2,872 | 125 | -96 | 210.02 | 15.23 | -93 |
| **උප එකතුව - වෙනත් නිෂ්පාදිතයන්** | **9,130** | **6,261** | **-31** | **377.01** | **216.57** | **-43** |
| **මුළු අපනයන ආදායම** | | | | **75,259.30** | **84,701.74** | **13** |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව*

*සටහන - 2015 වසරේ ගෙඩි පොල් අපනයනය කිරීම ආරම්භ කර ඇත්තේ මැයි මාසයේය.*

# 4. පරිපාලන අංශය

පරිපාලන අංශයේ මූලික පරමාර්ථය වනුයේ ආයතනයේ සියළු අංශයන් සඳහා සහාය සේවාවන් ලබාදීම හා පහසුකම් සැපයීම,අධිකාරියේ මනා පැවැත්ම හා ප්‍රවර්ධනය වෙනුවෙන් අදාළ වන සියලුම ආයතනික කටයුතු,මානව සම්පත් සංවර්ධනය හා පරිපාලන කටයුතු මෙහෙයවීම ද එමඟින් ආයතනයේ අනෙකුත් ක්‍රියාකාරී අංශවලට ස්වකීය කාර්යයභාරය ඉටු කිරීමේදී සහාය වීම මෙන්ම සමස්ත ආයතනයේ සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක වීමයි.

## 4.1 සේවක සංඛ්‍යාව

මෙම අධිකාරීයේ අනුමත සේවක සංඛ්‍යව 258 කි.2016 වර්ෂයේදී සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යව195 වූ අතර එම සේවක සංඛ්‍යාව 34 දෙනෙකු කළමනාකරණ මට්ටමේ අය වූහ.සේවක සංඛ්‍යාව පහත සේවා ගණයන්ගෙන් සමන්විත විය.

1. ජ්‍යේෂ්ඨ කළමනාකාර සේවා ගණය
2. කළමනාකාර සේවා ගණය
3. කනිෂ්ඨ කළමනාකාර සේවා ගණය
4. ආශ්‍රිත නිලධාරී සේවා ගණය
5. කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණය
6. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන ) සේවා ගණය
7. ප්‍රාථමික ශිල්පීය සේවා ගණය
8. ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය
9. ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය

- මෙම අධිකාරිය සඳහා අනුමත කාර්යය මණ්ඩලයේ පවතින පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම සහ බඳවා ගැනීමේ සිට විශ්‍රාම යාම දක්වා කාර්ය මණ්ඩල පරිපාලනයට අදාල සියළුම කටයුතු සිදු කිරීම.

2016 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද පුරප්පාඩු

<table>
<tr><th>තනතුර</th><th>පැවැති පුරප්පාඩු සංඛ්‍යාව</th><th>සම්පූර්ණ කරන ලද පුරප්පාඩු සංඛ්‍යාව</th><th>පුරප්පාඩු සම්පූර්ණ කිරීමෙන් ලැබෙන සමාජ ප්‍රතිලාභය</th></tr>
<tr><td>අධ්‍යක්ෂ (අලෙවි සංවර්ධන හා පර්යේෂණ.)</td><td>01</td><td>01</td><td rowspan="5">1971 පොල් සංවර්ධන පනත යටතේ පොල් සංවර්ධන අධිකාරිය වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම තුළින් ගෘහස්ත පරිභෝජනය සහ කර්මාන්තය සඳහා පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන සැපයුම තහවුරු කිරීම මඟින් පොල් කර්මාන්තය දීර්ඝ කාලීන වාණිජ්‍යමය ඵලදායීතාවය, තිරසාරත්වය හා ජාතික ආර්ථිකය සඳහා ඉහළ දායකත්වයක් කරා ගෙන ඒම පොල් සංවර්ධන අධිකාරියේකාර්ය භාරය වේ.</td></tr>
<tr><td>සහකාර අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන)</td><td>01</td><td>01</td></tr>
<tr><td>ඉංජිනේරු (සිවිල්)</td><td>01</td><td>-</td></tr>
<tr><td>නීති නිලධාරි</td><td>01</td><td>-</td></tr>
<tr><td>ජ්‍යෂ්ඨ පරීක්ෂක</td><td>08</td><td>04</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| ආර්ථික පර්යේෂණ නිලධාරි | 01 | - | මෙහිදී පොල් ආශ්‍රිත නිෂ්පාදන හා නිෂ්පාදන ක්‍රම විධිමත් කිරීමේ සහ ප්‍රවර්ධනයේදී සහාය වීම,පොල් ආශ්‍රිත කර්මාන්ත නවීකරණය සඳහා තාක්ෂණික සේවාවන් සැපයීම හා මග පෙන්වීම, සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, යෝග්‍ය තාක්ෂණය හඳුන්වාදීම තුළින් පිරිවැය අවම කරලීමට සහාය වීම, මූල්‍ය සහනාධාර ලබාදීම, කර්මාන්ත ව්‍යාප්තිය හා රැකියා උත්පාදනයන් සිදු කිරීම, ගෘහ ආශ්‍රිත කර්මාන්ත නංවාලීම/ ස්වයං රැකියා උත්පාදනය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම, අපනයනය සඳහා යොමු වන දිසිදි පොල් නිෂ්පාදනයන් පරීක්ෂා කිරීම හා තත්ත්ව සහතික නිකුත් කිරීම, රසායනාගාර පරීක්ෂණ සේවාවන් පවත්වාගෙන යාම, අගය එකතු කළ පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් දේශීය හා ජාත්‍යන්තරව ප්‍රවර්ධනය කිරීම, පොල් භාවිතයේදී සිදුවන නාස්තිය අවම කිරීම , දේශීය හා විදේශීය පාරිභෝගිකයින් අතර පරිසර හිතකාමී පොල් නිෂ්පාදනයන් භාවිතය ප්‍රචලිත කිරීම සහ පරිභෝජනයට ජනතාව යොමු කිරීම , පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ උන්නතියට අදාළ අලෙවි සංවර්ධන හා පර්යේෂණ ක්‍රියාවලීන් සිදු කිරීම ආදී වශයෙන් වූ කාර්යයන් ඉටු කරවා ගැනීම මෙම පුරප්පාඩු සම්පූර්ණ කරලීම මගින් සිදු කරනු ලැබේ. |
| සැකසුම් සංවර්ධන නිලධාරි | 05 | 05 | |
| මූල්‍ය නිලධාරි | 01 | 01 | |
| සභාපති ලේකම් | 01 | - | |
| වැඩසටහන් සහකාර (තත්ත්ව පාලන) | 05 | 03 | |
| වැඩසටහන් සහකාර (අලෙවි සංවර්ධන හා පර්යෙෂණ) | 01 | - | |
| වැඩසටහන් සහකාර (තාක්ෂණික සේවා) | 25 | - | |
| පොත් තබන්නා | 01 | 01 | |
| පරීක්ෂක | 17 | 04 | |
| රසායනාගාර කාර්මික ශිල්පී | 06 | 05 | |
| කළමනාකරණ සහකාර | 07 | 07 | |
| රියදුරු | 02 | 02 | |
| රසායනාගාර සහායක | 03 | - | |
| කාර්යාල සහායක | 01 | 01 | |
| ක්ෂේත්‍ර සහායක | 04 | 03 | |

2016 වර්ෂය තුළ සේවකයින් 07 දෙනෙකු සේවයෙන් විශ්‍රාම ලබා ඇති අතර සේවකයින් 04 දෙනෙකු ඉල්ලා අස්වී ඇත.

## 4.2 මානව සම්පත් සංවර්ධන වැඩසටහන්

මානව සම්පත අධිකාරියේ මෙහෙවර හා අරමුණු ලඟා කර ගැනීම සඳහා වඩා ඵලදායිව හා සඵලදායිව යොදා ගැනීමට හැකිවන පරිදි මෙම අධිකාරියේ සේවක මහත්ම මහත්මීන්ගේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා 2016 වර්ෂයේ දේශීය පුහුණු සංවර්ධන පාඨමාලා විවිධ විෂයන් ඔස්සේ සංවිධානය කිරීමට කටයුතු කරන ලදී. මෙහිදී පුහුණු සංවර්ධන පාඨමාලා මෙහෙයවනු ලබන රාජ්‍ය ආයතන සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින් පාඨමාලා සංවිධානය කිරීමට කටයුතු කර ඇත. 2016 වර්ෂයේ දී අධිකාරියේ කාර්යය මණ්ඩලය වෙත පසුගිය වර්ෂයන් වලදී ලබා දීමට නොහැකි වූ හා අත්‍යවශයෙන්ම ලබා දිය යුතු පුහුණු පාඨමාලා සඳහා සහභාගී කරවීම පාලන අංශයේ අරමුණ විය.



පුද්ගල ආකල්ප හා කුසලතා වර්ධනය, නවක කාර්යය මණ්ඩලය සඳහා රාජ්‍ය සේවය පිළිබඳ අවබෝධය ලබා දීම, කණ්ඩායම් හැඟීම වර්ධනය, රැකියා පරිසරයේ ඇති වී තිබෙන නව්‍යතා හඳුන්වා දීම හා ආයතනික පරිසරය කෙරෙහි හැඩගැස්වීම අරමුණ විය.

ඒ අනුව කාර්යය මණ්ඩලය වෙනුවෙන් පුහුණු හා සංවර්ධන කටයුතු සඳහා වැය කරන මුදල් අනාගත ආයෝජනයක් සේ සලකා පුහුණු අවශ්‍යතා හඳුනාගෙන අදාල පුහුණු කටයුතු සඳහා යොමු කිරීම සිදු කරන ලදී.

| | පාඨමාලාවේ නම | පවත්වන ලද ආයතනය | සහභාගී වූ ගණන | පැවති දින ගණන |
|---|---|---|---|---|
| 01 | උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව | කැළණි විශ්වවිද්‍යාලය | 02 | වසර 01 |
| 02 | වෘත්තිකයන් සඳහා වන ඉංග්‍රීසි පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 01 | මාස 03 |
| 03 | Edible Oil Industry- Coconut Oil Training programme | Industrial Development Board of Ceylon | 02 | දින 01 |
| 04 | විදුලි ජනක යන්ත්‍ර භාවිතය හා නඩත්තුව | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | 01 | දින 02 |
| 05 | Duties & Responsibilities of leave Clerk | Skills Development Authority | 01 | දින 02 |
| 06 | Salary Conversion – Board & Statutory Bodies | Skills Development Authority | 01 | දින 02 |

| | | | | |
|---|---|---|---|---|
| 07 | රාජ්‍ය වත්කම් කළමණාකරණය | ප්‍රාග් ආයතනය | 01 | දින 01 |
| 08 | Workshop on Quality Control | Sri Lanka Standard Institution | 03 | දින 02 |
| 09 | Quality Assurance Practices Manufacturing of Bottle Drinking Water | Sri Lanka Standard Institution | 02 | දින 01 |
| 10 | SPC, Sampling Technique & Inspection for ISO 9001 Quality Management System | Sri Lanka Standard Institution | 03 | දින 02 |
| 11 | Evaluation of Environment at Aspect & Legal recruitments in environmental Management | Sri Lanka Standard Institution | 01 | දින 01 |
| 12 | Occupational Health & Safety Management System | Sri Lanka Standard Institution | 01 | දින 01 |
| 13 | Internal Auditing as per OHSAS 18001:2007 Occupational Health & Safety Management System | Occupational Health & Safety Management System | 01 | දින 02 |
| 14 | Short Course on GIS and Application | Post Graduate Institute of Science | 01 | දින 05 |
| 15 | Office Management and Office Producer | නිපුණතා සංවර්ධන පදනම | 01 | |
| 16 | Tranning on ISO/IEC 17025:2005 | අනුකූලතා තක්සේරුව පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතණ මණ්ඩලය | 02 | දින 02 |
| 17 | 5S Application in Productivity and Quality Improvement | අනුකූලතා තක්සේරුව පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතණ මණ්ඩලය | 01 | දින 01 |
| 18 | Energy Management System as per ISO/IEC 50001:2011 | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | 01 | දින 03 |
| 19 | Food Safty Management | Sri lanka Accredition Board | 03 | දින 02 |

2016 පුහුණු සංවර්ධන පාඨමාලා

- ආයතනයේ ස්ථාවර වත්කම් සම්බන්ධ වත්කම් ලේඛන පවත්වාගෙන යාම,වාර්ෂික තොග සමීක්ෂණ සම්බන්ධ සියලු කටයුතු ඉටු කිරීම.

- සියළුම දේශීය මිළදී ගැනිම් වලට අමතරව ත්ත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයෙහි ස්ථාපිත කර ඇති ක්ෂුද්‍ර ජීවී විශ්ලේෂණ අංශය ,රසායනික විශ්ලේෂණ අංශය හා සංවේදී රසායනාගාරය යන මූලික රසායනාගාර හා ඊට අනුබද්ධව පවතින මාධ්‍ය සැකසුම් ඒකකය සංවේදී උපකරණ අංශය හා සේදුම් ඒකකය වැනි තත්ත්ව පාලන ඒකක සඳහා අවශ්‍ය රසායනාගාර උපකරණ ,රසායනික ද්‍රව්‍ය ආනයනය කිරීම් සම්බන්ධ සියලු කටයුතු සිදු කිරීම.

- තත්ත්ව පාලන අංශය පුළුල් කිරීම මත ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන පොල් නිෂ්පාදන වල ගුණාත්මක ප්‍රමිති නියම කිරීම හා පවත්වාගෙන යාම සඳහා රසායනාගාරයට අවශ්‍ය රසායනික ද්‍රව්‍ය හා රසායනාගාර උපකරණ ආනයනය කිරීමේ දී ,ඊට අදාල මිළ ගණන් කැඳවීම තාක්ෂණික කමිටු ප්‍රසම්පාදන ලේඛන සැකසීම ,ඊට අදාල අනුමැතීන් ලබා ගැනීම , ඇණවුම් කිරීමට අදාල ලිපි ලේඛන සැකසීම, බැංකු අණකර ,ආනයනික බලපත්‍ර ලබා ගැනීම හා භාණ්ඩ /ද්‍රව්‍ය නිෂ්කාශන කටයුතු කිරීම.

- සේවකයින් ආයතනික පරිපාලනමය නීති රීති වලට අවනත නොවීම යන කරුණු කාරණා වලදීත් ආයතනයේ විනය පාලනයට අවශ්‍ය සියළුම ක්‍රියා පරිපාටි සහ කම්කරු විනිශ්චය සභා කාර්මික අධිකරණයේ නීති කටයුතු සිදු කිරීම.





## 4.3 සුභ සාධන වැඩ කටයුතු

අධිකාරියේ සේවකයින් සඳහා පසුගිය වර්ෂවලදී ලබා දුන් පහත සඳහන් සුභ සාධන පහසුකම් සහ මූලාධාර 2016 වර්ෂය තුළදී ද ලබා දීමට කටයුතු කර ගෙන යන ලදී.

- ණය පහසුකම්,දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර, දුම්රිය වාර්ෂික අනුග්‍රාහ බලපත්‍ර හා සියලුම සේවකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ආවරණය වන වෛද්‍ය රක්ෂණ ක්‍රමය
- සුභ සාධන සමිතිය විසින් සංවිධාන කරනු ලබන වාර්ෂික අධ්‍යාපන චාරිකා සහ ක්‍රීඩා කටයුතු
- වැඩ කරන දිනවල කොළඹ කොටුව / මරදාන සහ වැල්ලවත්ත දුම්රිය ස්ථානවල සිට සහ කොහුවල මංසන්ධියේ සිට නාරාහේන්පිට කාර්යාලය වෙත පැමිණීමට සහ කාර්යාලයේ සිට ආපසු යාමට ප්‍රවාහන පහසුකම් සලසා දීම
- කාර්යය මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාසල් යන දරුවන් සඳහා පාසල් පොත් ලබා ගැනීමට තිළිණපත් ලබා දීම.
- වැඩ කරන දිනවල සේවකයන්ට තේපැන් සැපයීම.
- 2016 වර්ෂයේ ආරම්භක දිනය නිමිතිකොට ගෙන විශේෂ ධර්මදේශනයක් පැවැත්වීමට කටයුතුකිරීම.





## 05. මුදල් අංශය

පොල් සංවර්ධන අධිකාරියේ මුදල් අංශය මගින් විවිධ අංශවලට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැලසීමේ වගකීම දරයි. ඒ අනුව, අයවැය සහ මූල්‍ය කාර්ය සැලසුම්වලට අනුකූල වූ අනුමත වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා මූල්‍ය පහසුකම් සැලසීම සම්බන්ධයෙන් මුදල් අංශය වගකීම දරයි. වරින් වර මූල්‍ය වාර්තා සහ ප්‍රගති වාර්තා පිළියෙළ කිරීම ඇතුළුව මූල්‍ය වාර්තා පවත්වාගෙන යාම වැනි කටයුතු ඉටු කිරීම සම්බන්ධයෙන් ද මුදල් අංශය වගකීම උසුලයි. පොල් සංවර්ධන අධිකාරියේ ආයෝජන කළමනාකරණය ඇතුලුව එහි අරමුදල් භාරව කටයුතු කරන්නේ ද මුදල් අංශයයි.

2016 වර්ෂයේ රජයේ ප්‍රධාන ලෙස ලැබී ඇති රු. මිලියන 124.5 ඇතුළුව රු.මිලියන 357.56 ක් වන මුළු ආදායම සහ රු.මිලියන 1231 ක් වන මුළු වත්කම් පාලනය කිරීම හා සම්බන්ධයෙන් වාර්තා තබා ගැනීම මුදල් අංශයේ වගකීම වේ. ආයතනයේ සෑම අංශයකම කාර්යසාධනය සාක්ෂාත් කර ගැනිම සම්බන්ධයෙන් අවශ්‍ය වන කටයුතුවලදී මූල්‍ය පහසුකම් සැපයීම ද මුදල් අංශය මගින් සිදු කෙරේ.

### 5.1 සාමාන්‍ය මෙහෙයුම් කටයුතු

- සාමාන්‍ය මෙහෙයුම් කටයුතු සඳහා පුනරාවර්තන වියදම රු. මිලියන 179.5ක් සහ ප්‍රාග්ධන වියදම් රු. මිලියන 71.08 ක් ලෙස වියදම් දරා ඇත.
- කළමනාකරණ අවශ්‍යතා සඳහා විවිධ මූල්‍ය වාර්තා පිළියෙල කිරීම ද, මාසික, ත්‍රෛමාසික , අර්ධ වාර්ෂික සහ වාර්ෂික වාර්තා පිළියෙල කිරීම ද සිදුකෙරේ.

### 5.2 ප්‍රාග්ධන සංවර්ධන වැඩසටහන

පොල් සංවර්ධන අධිකාරියේ ඍජු ආදායමක් ලෙස පැවති සෙස් බදු ආදායම අංක එෆ්පී/06/77/07/04 දරණ 2007 අප්‍රේල් 24 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය මගින් 2007.01.01 දින සිට බල පැවැත්වෙන පරිදි රජයේ ආදායමක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

2016 වර්ෂයේ ප්‍රාග්ධන සංවර්ධන / ප්‍රාග්ධන වැඩසටහන යටතේ රජයේ මුළු ප්‍රදානය/ආදායම -
රු.මිලියන 89.0

### 2016 වර්ෂයේ දී ද පහත සඳහන් කටයුතු නිම කිරීමට අධිකාරියේ මුදල් අංශයට හැකි වී ඇත.

- අරමුදල් කළමනාකරණය සහ සංවර්ධන ව්‍යාපෘති යන වැඩසටහන් පිළිබඳ මූල්‍ය වාර්තා සැපයීම.
- මෝල් සංවර්ධන අරමුදලේ දිසිදි පොල් මෝල් හිමියන් නමින් පවත්වාගෙන යන ආරක්ෂිත ඇප තැන්පත් කේවල ගිණුම් සඳහා මාසිකව අපනයන දිසිදි නිෂ්පාදන මත මුදල් බැර කිරීම.
- පොල් තෙල් මිළ ස්ථායීකරණ අරමුදල උපයෝගී කර ගනිමින් පොල් කර්මාන්තයේ නියුතු ව්‍යවසායකයින් සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට මහජන බැංකුව හා එක්ව ‘‘කප්රුක නිපැයුම් දිරිය ණය යෝජනා ක්‍රමය‘‘ සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ එක්ව ‘‘කප්රුක ජය ඉසුර‘‘ ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සහය වීම.

- පොල් සංවර්ධන අධිකාරියේ සේවක අර්ථසාධක අරමුදලේ මුදල් නිසි පරිදි කළමනාකරණය කිරීම, සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින්ට ණය මුදල් ගෙවීම් කටයුතු කිරීම හා අවුරුදු 55 ඉක්ම වූ සේවකයින්ගේ ඉල්ලීම මත 75% සීමාවට යටත්ව සාමාජික මුදල් නිදහස් කිරීම.
- මනා කළමණාකාරිත්වයකින් යුතුව අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල සහ බැඳුම්කරවල ආයෝජනය කිරීම. මෝල් සංවර්ධන අරමුදලෙහි ඇති අරමුදල් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ එක් එක් මෝල් හිමියන්ගේ නමින් විවෘත කර ඇති කේවල ඉතිරි කිරීමේ ගිණුම්වල මනා කළමනාකාරිත්වයකින් යුතුව පවත්වාගෙන යෑම.

වර්ෂය අවසානයේ දී මෙම අරමුදල් ශේෂය පහත සඳහන් පරිදි වේ. (රු. මිලියන)

| | | |
|---|---|---|
| අ) | ප්‍රාග්ධන සංවර්ධන අරමුදල | -33.85 |
| ආ) | මෝල් සංවර්ධන අරමුදල | - 80.90 |
| ඇ) | පොල්තෙල් ස්ථායීකරණ අරමුදල | -259.53 |
| ඈ) | සාමාන්‍ය මෙහෙයුම් කටයුතු | -220.48 |
| ඉ) | එන්.ආර්.එයි. අරමුදල | -0.19 |
| | | - **594.95** |
| ඊ) | සේවක අර්ථ සාධක අරමුදල | - 40.90 |

(මෙය පෞද්ගලික අර්ථසාධක අරමුදලක් බැවින් සේවක අර්ථසාධක අරමුදල් ගිණුම වෙනම පවත්වාගෙන යනු ලැබේ.)

මුදල් අංශය විසින් වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික අවසාන ගිණුම් ප්‍රකාශ, මාසික මූල්‍ය ප්‍රගති වාර්තා සහ අනෙකුත් සංඛ්‍යාලේඛණ තොරතරු සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලය, අමාත්‍යාංශය, භාණ්ඩාගාරය, රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව සහ අනෙකුත් අදාළ ආයතන වෙත නියමිත කාලසීමාවන් තුළ ඉදිරිපත් කිරීමෙන් එහි වගකීම ඉටුකර ඇත.

## පොල් සංවර්ධන අධිකාරිය

### 2016.12.31 දින වන විට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව වාර්තාව (සාරාංශ ගත කරන ලද)

| | 2016.12.31 දින වන විට | 2015.12.31 දින වන විට |
|---|---|---|
| | රු. | රු. |
| **වත්කම්** | | |
| ස්ථාවර වත්කම් | 511,512,242 | 511,623,938 |
| ***මුළු ජංගම නොවන වත්කම්*** | **120,597,938** | **126,938,070** |
| | | |
| ***ජංගම වත්කම්*** | | |
| ඉන්වෙන්ටරිය/භාණ්ඩ තොග | 11,383,781 | 11,141,167 |
| වෙළඳ හා අනෙකුත් ලැබීම් | 627,332,050 | 535,839,280 |
| පූර්ව ගෙවීම් | 6,460,829 | 3,809,007 |
| ලැබිය යුතු පරීක්ෂා කිරීමේ සහ පිරිසැකසුම් කිරීමේ ගාස්තු | 697,982 | 2,639,590 |
| මුදල් හා මුදල් සාම්‍යතා | 28,561,302 | 27,232,620 |
| අන්තර් ජංගම ගිණුම | 6,396,556.00 | 7,386,481.00 |
| **මුළු ජංගම වත්කම්** | **680,832,500** | **588,048,145** |
| **මුළු වත්කම්** | **1,312,942,680** | **1,226,610,153** |
| | | |
| ***ජංගම නොවන වගකීම්*** | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | (43,350,565) | (45,375,670) |
| | | |
| ***ජංගම වගකීම්*** | | |
| ගෙවිය යුතු මුදල් | (33,843,392) | (52,161,353) |
| උපචිත වියදම් | (4,464,219) | (4,712,123) |
| | **(38,307,610)** | **(56,873,477)** |
| | | |
| | **1,231,284,505** | **1,124,361,006** |
| ***හිමිකම් හා වගකීම්*** | | |
| ප්‍රාග්ධන සංචිත | 448,790,776 | 448,790,777 |
| රාජ්‍ය ප්‍රදාන | 117,406,620 | 116,827,127 |
| ප්‍රාග්ධන සංවර්ධන අරමුදලේ ප්‍රදාන | 77,652,767 | 77,652,767 |
| සමුච්චිත අරමුදල | 587,434,342 | 481,090,335 |
| | | |
| **මුළු හිමිකම් ප්‍රාග්ධනය සහ වගකීම්** | **1,231,284,505** | **1,124,361,006** |

ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 11 සහ 12 අන්තර්ගත කර ඇති අතර මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් පිටු අංක 13 සිට 21 දක්වා අන්තර්ගත කර ඇති අතර ඒවා මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍යක කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබන ලදී.

| | | |
|---|---|---|
| එම්. පී. සන්ධ්‍යා කාන්ති | එච්. කේ.යූ. කේ. රූපසිංහ | ඒ.එච්.එල්.ඩී. ගාමිණී විජේසිංහ |
| **අධ්‍යක්ෂ (මුදල්)** | සභාපති | අධ්‍යක්ෂ ජනරාල් |

## පොල් සංවර්ධන අධිකාරිය

## 2016.12.31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | සටහන් අංකය | 2016.12.31 දිනට | 2015.12.31 දිනට |
|---|---|---|---|
| | | රු. | රු. |
| **ස්ථාවර වත්කම්** | | | |
| ස්ථාවර වත්කම් | 1 | 701,633,548 | 683,425,059 |
| අඩු කළා: සමුච්චිත ක්ෂය කිරීම් | | (190,121,306) | (171,801,121) |
| | | **511,512,242** | **511,623,938** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| **මළාපවහන පද්ධතිය** | | **6,000,000** | **8,475,486** |
| කාර්ය මණ්ඩල ණය ගැතියන් | 5 | **17,364,308** | **13,178,759** |
| බී.සී.සී. ආයතනය වෙත ලබා දෙන ලද ණය මුදල් | 6 | 59,715,037 | 59,715,037 |
| බී.සී.සී. ආයතනයෙන් ලැබිය යුතු ණය මුදල් | | **36,104,481** | **32,092,871** |
| අඩමාන ණය ගැතියන් සඳහා ප්‍රතිපාදන | | **(36,104,481)** | **(32,092,871)** |
| කප්රුක ණය යෝජනා ක්‍රමය සඳහා ලබා දෙන ලද ණය මුදල් | 7 | **37,518,593** | **45,568,787** |
| | | **120,597,938** | **126,938,069** |
| **ජංගම වත්කම්** | | | |
| ***ඉන්වෙන්ටරි / තොග*** | | | |
| ***තොග*** | 2 | 11,383,781 | 11,141,167 |
| | | **11,383,781** | **11,141,167** |
| ***වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල්*** | | | |
| ලාහෝර් ආර්යා ණය අරමුදල | | 323,950 | 764,165 |
| කාර්ය මණ්ඩල ණය ගැතියන් | 5 | 4,574,540 | 3,966,012 |
| විවිධ ණය ගැතියන් | | 22,606,909 | 14,764,286 |
| විවිධ අත්තිකාරම් | 8 | 382,366 | 302,082 |
| කප්රුක ණය යෝජනා ක්‍රමය සඳහා ලබා දෙන ලද අත්තිකාරම් | | 4,070,000 | 4,070,000 |
| විවිධ තැන්පතු | 9 | 408,685 | 429,727 |
| බැංකු තැන්පතු | 10 | 499,218,427 | 394,289,796 |
| භාණ්ඩාගාර බිල්පත් | 10 | 95,747,173 | 117,253,213 |
| | | 627,332,050 | 535,839,281 |
| | | | |
| ***පූර්ව ගෙවීම්*** | 11 | 6,460,829 | 3,809,006 |
| ලැබිය යුතු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ පිරිසැකසුම් කිරීමේ ගාස්තු | 12 | 697,982 | 2,639,589 |
| | | | |
| ***මුදල් හා මුදල් සමානතා*** | | | |
| සුළු මුදල් - මහනුවර | | .- | 2,033 |
| බැංකුවේ ඇති මුදල් | 13 | 28,532,323 | 27,204,577 |
| මුද්දර ගාස්තු අග්‍රිමය | | .- | 407 |
| මුද්දර ප්‍රාංකන යන්ත්‍රය | | 28,979 | 25,603 |
| | | 28,561,302 | 27,232,620 |
| | | | |
| | | | |
| අන්තර් ජංගම ගිණුම (ප්‍රාග්ධන සංවර්ධන අරමුදල) | | **6,396,556** | **7,386,481** |
| **මුළු ජංගම වත්කම්** | | **680,832,500** | **588,048,145** |
| | | **1,312,942,680** | **1,226,610,153** |

| | | | |
|---|---|---|---|
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | **(43,350,565)** | **(45,375,670)** |
| **ජංගම වගකීම්** | | .- | .- |
| ***ගෙවිය යුතු මුදල්*** | | .- | .- |
| විවිධ ණය හිමියන් | ***14*** | (14,919,344) | (25,020,326) |
| ගෙවිය යුතු පරීක්ෂා කිරීමේ සහ පිරිසැකසුම් කිරීමේ ගාස්තු | ***15*** | (1,951,279) | (3,346,670) |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | ***16*** | (1,466,357) | (3,223,951) |
| කලින් ලැබුණු මුදල් | ***17*** | (367,200) | (4,440,272) |
| කප්රුක ණය යෝජනා ක්‍රමය සඳහා ලබා දෙන ලද අත්තිකාරම් | | (8,742,656) | (8,742,656) |
| උපචිත වියදම් | ***18*** | (4,464,219) | (4,712,123) |
| අන්තර් ජංගම ගිණුම් ශේෂය | | (6,396,556) | (7,387,481) |
| **මුළු ජංගම වගකීම්** | | **(38,307,610)** | **(56,873,479)** |
| | | **1,231,284,505** | **1,124,361,006** |
| **මූල්‍යනය කරන ලද** | | | |
| ප්‍රාග්ධන සංචිත | | 6,970,409 | 6,970,409 |
| විදේශාධාර | | 4,102,257 | 4,102,257 |
| ඉඩම් සඳහා ප්‍රත්‍යාගණන සංචිත | | 226,702,909 | 226,702,909 |
| ගොඩනැගිලි සඳහා ප්‍රත්‍යාගණන සංචිත | | 164,965,219 | 164,965,219 |
| මෝටර් වාහන සඳහා ප්‍රත්‍යාගණන සංචිත | | 46,049,983 | 46,049,983 |
| | | **448,790,776** | **448,790,777** |
| ප්‍රදාන සහ දායක මුදල් | | 77,870,555 | 77,870,555 |
| රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධනය | ***19*** | 39,536,065 | 38,956,572 |
| | | **117,406,620** | **116,827,127** |
| ප්‍රාග්ධන සංවර්ධන අරමුදලේ ප්‍රදාන | ***20*** | **77,652,767** | **77,652,767** |
| සමුච්චිත අරමුදල | ***21*** | **511,701,352** | **479,558,049** |
| සමුච්චිත අතිරික්තය | ***21*** | **75,732,990** | **1,532,286** |
| | | **1,231,284,505** | **1,124,361,006** |

ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 11 සහ 12 අන්තර්ගත කර ඇති අතර මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් පිටු අංක 13 සිට 21 දක්වා අන්තර්ගත කර ඇති අතර ඒවා මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍යක කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබන ලදී.

| | | |
|---|---|---|
| එම්. ජ. සන්ධ්‍යා කාන්ති | එච. කෙ.යු. කෙ. රූපසංහ | ඒ.එච්.එල්.ඩී. ගාමිණි විජේසිංහ |
| අධ්‍යක්ෂ (මුදල්) | සභාපති | අධ්‍යක්ෂ ජනරාල් |
| 2017.05.10 | | |

# පොල් සංවර්ධන අධිකාරිය

## 2016.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (අරමුදල් අනුව විශ්ලේෂණය කරන ලද)

| | සටහන් අංක | මණ්ඩලයේ සාමාන්‍ය මෙහෙයුම් කටයුතු | ප්‍රාග්ධන සංවර්ධන අරමුදල | පො.සං.අ. සඳහා වන බී. ස්. යෝ. ක්‍රමය | මෝල් සංවර්ධන අරමුදල | ජා.ෂ.අ. ව්‍යාපෘති අරමුදල | මුළු මුදල |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ස්ථාවර වත්කම් | | | | | | | |
| ස්ථාවර වත්කම් | 1 | 653,575,214.29 | 48,037,146.08 | 21,187.50 | | | 701,633,547.87 |
| අඩු කළා: සමුච්චිත ක්ෂය කිරීම් | | (184,836,121.53) | (5,264,006.69) | (21,177.50) | | | (190,121,305.72) |
| | | | | | | | |
| | | **468,739,092.76** | **42,773,139.39** | **10.00** | - | - | **511,512,242.15** |
| ජංගම නොවන වත්කම් | | | | | | | |
| මළාපවහන පද්ධතිය | | 6,000,000.00 | | | | | **6,000,000.00** |
| කාර්ය මණ්ඩල ණය ගැතියන් | 5 | 17,364,308.20 | | | | | **17,364,308.20** |
| බී.සී.සී. ආයතනය/හිරියාල වෙත ලබා දෙන ලද ණය මුදල් | 6 | | 33,000,000.00 | 26,715,037.40 | | | **59,715,037.40** |
| බී.සී.සී. ආයතනයෙන් ලැබිය යුතු ණය මුදල් | | | | 36,104,480.73 | | | **36,104,480.73** |
| අඩමාන ණය ගැතියන් සඳහා ප්‍රතිපාදන | | | | (36,104,480.73) | | | **(36,104,480.73)** |
| කප්රුක ණය යෝජනා ක්‍රමය සඳහා ලබා දෙන ලද ණය මුදල් | 7 | | | 27,927,004.42 | 9,591,588.13 | | **37,518,592.55** |
| | | **23,364,308.20** | **33,000,000.00** | **54,642,041.82** | **9,591,588.13** | - | **120,597,938.15** |
| ජංගම වකම් | | | | | | | |
| *ඉන්වෙන්ටරි/ තොග* | | | | | | | |
| තොග | 2 | 11,383,781.26 | | | | | **11,383,781.26** |
| | | **11,383,781.26** | - | - | - | - | **11,383,781.26** |
| *වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල්* | | | | | | | |
| ලාහෝර් ආර්යා ණය අරමුදල | 3 | 323,949.87 | | | | | 323,949.87 |
| විවිධ ණය ගැතියන් | 4 | 9,017,548.18 | 501,889.11 | 10,386,891.22 | 2,698,573.43 | 2,006.64 | 22,606,908.58 |
| කාර්ය මණ්ඩල ණය ගැතියන් | 5 | 4,574,540.30 | | | | | 4,574,540.30 |
| විවිධ අත්තිකාරම් | 8 | 86,765.60 | 295,600.00 | | | | 382,365.60 |
| කප්රුක ණය යෝජනා ක්‍රමය සඳහා දෙන ලද අත්තිකාරම් | | | 4,070,000.00 | | | | 4,070,000.00 |
| විවිධ තැන්පතු | 9 | 408,684.51 | | | | | 408,684.51 |
| භාණ්ඩාගාර බිල්පත් | 10 | 6,934,080.80 | 886,576.89 | 87,739,414.64 | | 187,100.97 | 95,747,173.30 |
| බැංකු තැන්පතු | 10 | 213,544,840.63 | 32,976,163.16 | 171,794,401.00 | 80,903,022.64 | | 499,218,427.43 |
| | | **234,890,409.89** | **38,730,229.16** | **269,920,706.86** | **83,601,596.07** | **189,107.61** | **627,332,049.59** |
| | | | | | | | - |
| *පූර්ව ගෙවීම්* | 11 | 3,874,606.23 | 2,586,222.50 | | | | **6,460,828.73** |
| *පරීක්ෂා කිරීම් සහ ලැබිය යුතු පිරිසැකසුම් ගාස්තු* | 12 | 697,981.50 | | | | | **697,981.50** |
| *මුදල් සහ මුදල් සමානතා* | | | | | | | |
| සුළු මුදල් - මහනුවර | | | | | | | |
| බැංකුවේ ඇති මුදල් | 13 | 17,037,309.23 | 11,495,014.12 | | | | **28,532,323.35** |
| මුද්දර ගාස්තු අග්‍රිමය | | | | | | | - |
| මුද්දර ප්‍රාංකන යන්ත්‍රය | | 28,979.00 | | | | | **28,979.00** |
| | | **17,066,288.23** | **11,495,014.12** | - | - | - | **28,561,302.35** |
| අන්තර් ජංගම ගිණුම (ප්‍රාග්ධන සංවර්ධන අරමුදල) / GBO | | (4,633,189.03) | 4,633,189.03 | | 6,396,556.28 | | 6,396,556.28 |
| මුළු ජංගම වත්කම් | | 263,279,878.08 | 57,444,654.81 | 269,920,706.86 | 89,998,152.35 | 189,107.61 | 680,832,499.71 |
| | | **755,383,279.04** | **133,217,794.20** | **324,562,758.68** | **99,589,740.48** | **189,107.61** | **1,312,942,680.01** |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ජංගම නොවන වගකීම් | | | | | | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | (43,350,565.00) | | | | | **(43,350,565.00)** |
| | | | | | | | |
| ජංගම වගකීම් | | | | | | | |
| *ගෙවිය යුතු මුදල්* | | | | | | | |
| විවිධ ණය හිමියන් | *14* | (8,267,836.55) | (6,651,207.19) | | (300.00) | | **(14,919,343.74)** |
| ගෙවිය යුතු පරීක්ෂා කිරීමේ සහ පිරිසැකසුම් කිරීමේ ගාස්තු | *15* | (1,951,278.80) | | | | | **(1,951,278.80)** |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | *16* | (1,466,356.86) | | | | | **(1,466,356.86)** |
| කලින් ලැබුණු මුදල් | *17* | (367,200.00) | | | | | **(367,200.00)** |
| කප්රුක ණය සඳහා දෙන ලද අත්තිකාරම් (පොල්තෙල් ස්ථායිකරරණ ණය යෝජනා ක්‍රමයේ ගිණුම) | | | | (4,070,000.00) | (4,672,656.04) | | **(8,742,656.04)** |
| උපචිත වියදම් | *18* | (4,288,198.21) | (176,020.40) | | | | **(4,464,218.61)** |
| අන්තර් ජංගම ගිණුම | | | (6,396,556.28) | | | | **(6,396,556.28)** |
| | | | | | | | - |
| 108 | බටුළුඔය දිසිදි පොල් මෝල, පුත්තලම් පාර | 18,750.00 | | | |
| 111 | කුඩුඉරිප්පු දිසිදි පොල් නිෂ්පාදකයෝ (පුද්) සමාගම | 18,750.00 | | | |
| 113 | බැලුම් මහර දිසිදි මිල්ස්, බැලුම්මහර | 75,000.00 | | | |
| 114 | දෙව්මිනි පොල් නිෂ්පාදකයෝ (පුද්) සමාගම | 59,728.26 | | | |
| 115 | බෝගමුව දිසිදි පොල් මෝල, අළුත්ගම | 30,000.00 | | | |
| 119 | මාතම්මන දිසිදි පොල් මෝල, මිනුවන්ගොඩ | 20,000.00 | | | |
| 120 | ෆාතිමා දිසිදි පොල් සහ තෙල් මෝල්, නයිනමඩම | 20,000.00 | | එකතුව | **200,913.59** |

| | |
|---|---|
| ගෙඩි පොල් සහ කොප්පරා තොග ගාස්තු | |
| 2016.12.31 දින වන විට ණයගැතියෝ | |
| | |
| කොප්පරා | මුදල (රු) |
| | |
| **කොප්පරා තොග මුදල්** | |
| බී.පී. ඇන්ඩ් ඩේවිඩ් සමාගම | (1,361.25) |
| ජී ඇන්ඩ් ජේ මැතිව් සහ කම්පැණි (පුද්) සමාගම | 43,081.44 |
| එල්.එස්.ටී. ද එස් විජේරත්න සහ සමාගම | 7,208.50 |
| | |
| ගෙඩි පොල් වෙන්දේසි ගාස්තු | |
| ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | 164,953.08 |
| හලාවත වැවිලි පුද්ගලික සමාගම | 243,804.72 |
| පොල් පර්යේෂණ ආයතනය | 31,902.51 |
| පොල් වගා කිරීමේ මණ්ඩලය | 210,699.46 |
| සී සී ගුණසේකර මිය | (4,936.39) |
| ලාලන් රබර් (පුද්) සමාගම | 33,854.39 |
| කුරුණෑගල වැවිලි පුද්ගලික සමාගම | 28,942.35 |
| ඇල්කඩුව වැවිල් පුද්ගලික සමාගම | 123,222.76 |
| එච් එල් ද මෙල් සහ කම්පැණි (පුද්) සමාගම | 29,109.32 |
| සී දිපාල් මැතිව් මහතා | 1,397.71 |
| චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග | (5,364.10) |
| කෑගල්ල වැවිලි පුද්ගලික සමාගම | (1,875.75) |
| එජ් ව් ඒ සුමනපාල | (1,142.40) |
| පොල් කනත්ත වත්ත | 252.00 |
| වයිග්‍රෝ (පුද්) සමාගම | 1,597.74 |
| පියල් වඩනාම්බි (දිද්ගලී සහ නිකමඩවත්ත) | 1.00 |
| ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන සමාගම | 3,363.75 |
| | **908,710.84** |

| | පොල් සංවර්ධන අධිකාරිය | | |
|---|---|---|---|
| | පුනරාවර්තන වියදම් | | |
| 2015 | විස්තරය | එකතුව | 2016 එකතුව |
| | පුද්ගල පඩිනඩි | | |
| 41,525,903.00 | වැටුප් හා වේතන | 47,768,079.96 | |
| 45,479,619.00 | ජීවන වියදම් දීමනාව සහ වෙනත් දීමනා | 41,778,020.01 | |
| 34,523,576.00 | සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල | 11,689,593.40 | |
| 3,642,288.00 | අතිකාල සහ නිවාඩු දින ගෙවීම් | 5,348,151.94 | |
| 57,345.00 | සභාපතිවරයාගේ සංග්‍රහ දීමනා | 113,626.28 | |
| 743,231.00 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සඳහා දීමනා | 1,607,505.89 | |
| 329,253.00 | පුහුණු සහ සම්මන්ත්‍රණ | 1,559,505.96 | |
| 126,301,215.00 | | | 109,864,483.44 |
| | | | |
| 2,779,350.00 | සුභසාධන වියදම් | 2,615,105.00 | 2,615,105.00 |
| **129,080,565.00** | | | **112,479,588.44** |
| | ගමන් වියදම් | | |
| 3,180,000.00 | ගමන් වියදම් (දේශීය) | 5,325,008.21 | |
| 195,620.00 | බිම් කුලී හා කුලී ගාස්තු | | |
| 822,328.00 | වෙළඳපොළ ප්‍රවර්ධනය | 2,586,360.47 | |
| **4,197,948.00** | | | **7,911,368.68** |
| | සැපයුම් සහ අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය | | |
| 4,772,115.00 | ලිපිද්‍රව්‍ය සහ වෙනත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය | 8,305,120.25 | |
| 4,099,219.00 | ඉන්ධන සහ ලිහිසි තෙල් | 5,178,298.29 | |
| 418,372.00 | නිල ඇඳුම් | 408,967.50 | |
| | පොත් සහ වාර සඟරා | | |
| 4,740,044.00 | (රසායනාගාර සඳහා රසායනික ද්‍රව්‍ය) විදුරු භාණ්ඩ සහවෙනත් පාරිභෝගික ද්‍රව්‍ය | 5,259,330.78 | |
| 63,135.00 | වෙනත් අවශ්‍යතා | 127,805.00 | |
| **14,092,885.00** | | | **19,279,521.82** |
| | අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු | | |
| 569,207.00 | ව්‍යුහ / ගොඩනැගිලි | 4,943,407.90 | |
| 2,235,385.00 | යන්ත්‍රෝපකරණ / කාර්යාල උපකරණ සහ ලී බඩු | 1,988,279.28 | |
| 4,212,145.00 | වාහන | 6,775,529.46 | |
| **7,016,737.00** | | | **13,707,216.64** |
| | | | |
| | ප්‍රවාහණය, සන්නිවේදන, උපයෝගිතා සහ වෙනත් සේවා | | |
| 2,700,549.00 | සන්නිවේදනය | 3,974,806.61 | |
| 1,404,608.00 | ප්‍රවාහන | 1,746,847.72 | |
| 5,692,286.00 | රක්ෂණය | 5,987,692.58 | |
| 957,710.00 | ආරක්ෂක සේවා | 2,280,325.00 | |
| 1,307,759.00 | පවිත්‍ර කිරීමේ සේවා | 1,659,264.77 | |
| 5,891,063.00 | විදුලිය සහ ජලය | 6,925,350.40 | |
| 1,025,846.00 | වරිපනම් සහ බදු | 2,499,988.00 | |
| 80,000.00 | නෛතික ගාස්තු | 23,796.43 | |
| 364,792.00 | කැපැල් හා මුද්දර ගාස්තු | 484,527.86 | |
| 300,000.00 | විගණන ගාස්තු | 300,000.00 | |
| 33,163.00 | බැංකු ගාස්තු | 40,744.80 | |
| | ආර්ථික සේවා ගාස්තු | 225,000.00 | |
| | මුද්දර ගාස්තු | 12,375.00 | |
| 19,757,774.00 | | | 26,160,719.17 |
| | | | |
| **174,145,908.00** | මුළු වියදම | | **179,538,414.75** |

## මෝල්කරුවන්ගේ ඉතිරුම් ගිණුම් - ජාතික ඉතිරි කිරීමේ බැංකුව

| මෝල් අංකය | ගිණුම් අංකය | මෝලෙහි නම | 2016.01.01 දිනට ශේෂය | 2016 තැන්පතු | 2016 පොළිය | මුදල් තැන්පතු | 2016 | 2016.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|
| එම් 62 | 1-0065-30-0926-2 | ඩෙසිකෝ ලංකා (පුයිවට්) ලිමිටඩ් | 509,983.24 | 160,764.96 | 22,105.93 | | 486,700.00 | 206,154.13 |
| එම් 63 | 1-0065-30-0928-9 | විලව් ඩී.සී. ඇන්ඩ් ඔයිල් මිල්ස් | 2,074,613.67 | 225,808.91 | 108,891.98 | | | 2,409,314.56 |
| එම් 64 | 1-0065-30-0929-7 | රත්කාරව්ව ඩී.සී. ඇන්ඩ් ඔයිල් මිල්ස් | 1,162,015.84 | 115,215.00 | 61,877.71 | | | 1,339,108.55 |
| එම් 67 | 1-0065-30-0932-7 | මාරවිල සී.පී.එස්. සමාගම | 3,899,077.06 | 295,263.68 | 201,647.96 | | | 4,395,988.70 |
| එම් 69 | 1-0065-30-0923-5 | බදුවත්ත මිල්ස් | 981,606.73 | 179,738.96 | 54,787.44 | | | 1,216,133.13 |
| එම් 71 | 1-0065-31-8518-4 | මාදම්පේ මිල්ස් (පුද්) සමාගම | 1,488,438.38 | 204,068.06 | 78,848.11 | | | 1,771,354.55 |
| එම් 72 | 1-0065-30-0935-1 | ශාන්ත ජෝසප් ඩී.සී. මනුෆැක්චර්ස් (පුද්) සමාගම | 412,873.38 | 190,106.04 | 26,653.39 | | | 629,632.81 |
| එම් 75 | 1-0065-30-0936-0 | සිරියංගමනී ඩී.සී. ඇන්ඩ් ෆයිබර් මිල්සි | 1,400,489.27 | 242,053.60 | 76,155.62 | | | 1,718,698.49 |
| එම් 76 | 1-0065-30-0937-8 | එස්.ඒ. සිල්වා සහ පුත්‍රයෝ ලංකා (පුද්) සමාගම | 1,684,685.62 | 1,322,260.87 | 118,556.94 | | | 3,125,503.43 |
| එම් 77 | 1-0065-30-0938-6 | ශාන්ත ඇනිස් ඩී.සී. කර්මාන්ත ශාලාව | 579,048.26 | 358,126.76 | 37,552.81 | | | 974,727.83 |
| එම් 79 | 1-0065-30-0939-4 | ෆාතිමා මිල්ස් සමාගම | 119,091.44 | 200,519.46 | 11,005.97 | | | 330,616.87 |
| එම් 80 | 1-0065-30-0940-8 | දූනගහ සී.පී.එස් ලිමිටඩ් | 3,320,854.87 | 314,730.20 | 173,768.15 | | | 3,809,353.22 |
| එම් 84 | 1-0065-30-2204-8 | සොනික් එක්ස්පෝ (පුද් ) සමාගම | 862,221.39 | 282,467.78 | 51,342.02 | | | 1,196,031.19 |
| එම් 85 | 1-0065-30-0941-6 | මොඩර්න් ෆුඩ් ෆැක්ටරි | 394,116.84 | 152,599.95 | 22,576.91 | | | 569,293.70 |
| එම් 86 | 1-0065-30-0942-4 | ජේ.පී.එම්. පින්ටෝ ඇන්ඩ් කම්පැනි (පුද්) සමාගම | 296,512.22 | 232,722.76 | 21,106.11 | | | 550,341.09 |
| එම් 87 | 1-0065-30-0943-2 | ශාන්ත වැලන්ටයින් ඩී.සී. මිල්ස් | 345,833.90 | 90,755.34 | 20,102.97 | | | 456,692.21 |
| එම් 88 | 1-0065-30-0945-9 | ශාන්ත ක්‍රිස්ටෝපර් ඩී.සී. මිල්ස් | 610,187.38 | 172,066.91 | 35,259.08 | | | 817,513.37 |
| එම් 89 | 1-0065-30-0946-7 | කුඩාවැව මිල්ස් | 1,456,537.46 | 186,706.20 | 32,412.71 | | 964,867.00 | 710,789.37 |
| එම් 90 | 1-0065-30-0947-5 | නැදුන්ගමුව මිල්ස් | 1,979,252.07 | 253,324.20 | 72,717.90 | | 672,169.00 | 1,633,125.17 |
| එම් 91 | 1-0065-30-0948-3 | සදලංකා සීපීසීඑස් ලිමිටඩ් | 277,849.93 | 82,424.87 | 17,012.62 | | | 377,287.42 |
| එම් 93 | 1-0065-30-0949-1 | ග්‍රීන් පාම් ඩීසී මිල්ස් | 2,179,181.07 | 213,336.80 | 114,077.38 | | | 2,506,595.25 |
| එම් 94 | 1-0065-30-0950-5 | සිරිකත ඩී සී මිල්ස් | 666,642.38 | 102,423.40 | 36,468.22 | | | 805,534.00 |
| එම් 95 | 1-0065-30-0951-3 | බෙලිගහ පොල් නිෂ්පාදකයෝ (පුද්) සමාගම | 1,123,367.83 | 335,291.26 | 64,465.56 | | | 1,523,124.65 |
| එම් 98 | 1-0065-30-0953-0 | එච් සීර් සොයිසා ඇන්ඩ් කම්පැනි | 1,309,045.88 | 193,536.80 | 68,780.27 | | | 1,571,362.95 |
| එම් 102 | 1-0065-34-3528-8 | නාරා කොකෝ (පුද්) සමාගම | | 79,715.84 | 269.05 | 100.00 | | 80,084.89 |
| එම් 103 | 1-0065-30-0957-2 | ශාන්ත ටෙනසේරා ඩී සී මිල්ස් | 1,885,705.53 | 308,572.84 | 101,882.51 | | | 2,296,160.88 |
| එම් 105 | 1-0065-30-0959-9 | ඩයි ඇන්ඩ් ඩූ රාජපක්ෂ (හේනේගම මිල්ස්) | 1,279,845.51 | 181,629.74 | 68,338.61 | | | 1,529,813.86 |
| එම් 107 | 1-0065-30-0960-2 | චන්ද්‍රා ඩී.සී. මිල්ස් | 179,494.09 | 108,319.20 | 12,006.16 | | | 299,819.40 |
| එම් 108 | 1-0065-30-0962-9 | බත්තුලුඔය මිල්ස් | 312,016.90 | 170,134.00 | 20,188.74 | | | 502,339.64 |
| එම් 110 | 1-0065-30-0964-5 | උනගහදෙනිය මිල්ස් | 370,331.83 | | 18,950.57 | | | 389,282.40 |
| එම් 111 | 1-0065-30-0965-3 | කුඩ්රිප්පු ඩීසී මිල්ස් | 567,342.14 | 293,737.80 | 36,404.68 | | | 897,484.62 |
| එම් 113 | 1-0065-30-0967-0 | බැලුම්මහර ඩී.සී මිල්ස් | 626,970.69 | 299,636.41 | 40,276.33 | | | 966,883.43 |
| එම් 114 | 1-0065-30-1243-3 | නාත්තන්ඩිය මිලිස් (පුද්) සමාගම | 776,834.91 | 138,010.00 | 42,990.04 | | | 957,834.95 |
| එම් 115 | 1-0065-30-0968-8 | බොගමුව ඩී සී මිල්ස් | 284,781.43 | 274,913.40 | 21,579.45 | | | 581,274.28 |
| එම් 119 | 1-0065-30-0970-0 | මාකම්මන ඩී.සී. මිල්ස් | 526,848.99 | 452,243.32 | 38,367.26 | | | 1,017,459.57 |
| එම් 120 | 1-0065-30-0971-8 | ෆාතිමා ඩී සී ඇන්ඩ් ඔයිල් මිල්ස් | 374,477.38 | 217,805.40 | 24,970.13 | | | 617,252.91 |
| එම් 122 | 1-0065-30-0972-6 | ශාන්ත ජෝසප් ඩීසී ඇන්ඩ් ෆයිබර් මිල්ස් | 403,769.17 | 256,101.01 | 27,834.66 | | | 687,704.84 |

## 6. අභ්‍යන්තර විගණන අංශය

2016 වර්ෂයට අදාල අභ්‍යන්තර විගණන සැලැස්ම අධිකාරියේ ක්‍රියාකාරී අංශ වන සැකසුම් සංවර්ධන අංශය, අලෙවි සංවර්ධන හා ආර්ථික පර්යේෂණ අංශය සහ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයන්හි ක්‍රියාකාරී සැලැස්ම ආවරණය වන පරිදි සහ ඊට අමතරව පරිපාලන අංශය සහ මුදල් අංශ වල කටයුතු ආවරණය වන ආකාරයට විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සහ භාණ්ඩාගාරයේ නියෝජිත මහතාගේ උපදෙස් පරිදි සකස් කර ක්‍රියාත්මක කරන ලදි.

ඒ අනුව, අනුමත කළ විගණන සැලැස්ම පරිදි විගණන පරීක්ෂාවන් සිදුකර වාර්තාවන් 25 ක් ඉදිරිපත් කරන ලද අතර, ක්‍රියාකාරී අංශයන්හි 2016 ක්‍රියාකාරී සැලැස්ම ආවරණය වන පරිදි කරුණු 11 කට අදාලව සහ පාලන හා මූල්‍ය අංශ ආවරණය වන පරිදි කරුණු 09 කට අදාලවත් විගණන පරීක්ෂාවන් සිදුකර විගණන වාර්තාවන් ඉදිරිපත් කොට ඇත. මීට අමතරව, කළමනාකාරිත්වය විසින් පවරන ලද විශේෂ විමර්ශන 06 ක් සිදුකරන ලද අතර, ඉන් 03 ක් මූලික පරීක්ෂණයන්ය. මෙම විමර්ශණ වලට අදාල වාර්තා සියල්ලම වර්ෂය තුළ සිදුකර කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කර ඇත.

වර්ෂය තුල විගණන අංශයේ තනතුරු කිහිපයක් පුරප්පාඩුව පැවති බැවින් 2016 විගණන සැලැස්මේ අපේක්ෂිත ආකාරයට විගණන කාර්යයන් ඉටුකිරීමට නොහැකි වන බව 2016 දෙවන විගණන හා කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරන ලදි. ඒ අනුව, විගණන හා කළමනාකරණ කමිටුවේ උපදෙස් පරිදි තෝරාගත් විගණන වැඩසටහන් ප්‍රමාණයක් ආවරණය වන පරිදි විගණන කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබාදෙන ලදි. අදාල උපදෙස් පරිදි 2016 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අංශය විසින් අභ්‍යන්තර විගණන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

### 6.1 විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

#### 6.1.1 සංයුතිය සහ ගණපූර්ණය

රාජ්‍ය ආයතනවල යහපාලනයට අදාල මාර්ගෝපදේශ අත්පොත නමින් වූ 2003.06.02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 4.7.1 දරණ පරිච්ඡේදය සහ 2010.12.04 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/55 ප්‍රකාරව පොල් සංවර්ධන අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා, එම චක්‍රලේඛ විධිවිධාන අනුව එම කමිටුවේ කටයුතු පවත්වාගෙන යාම සිදුකෙරේ. විගණන හා කළමනාකරණ කමිටු මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. සමාලෝචනයට බඳුන්වන වර්ෂයෙහිදී පහත නම් සඳහන් අධ්‍යක්ෂවරුන් කමිටු සාමාජිකයන් ලෙස කටයුතු කරන ලදී.

**2016.02. 29 දින පැවති 2016/01 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම**

1. ආර්.එම්.පී.කේ නාමල් බණ්ඩාර මයා -භාණ්ඩාගාර නියෝජිත
2. එන්.එස් වනසිංහ මයා -අමාත්‍යංශ නියෝජිත
3. ඩබ්.එම්.වයි.ටී.ප්‍රනාන්දු මෙය -සාමාජික
4. එම්.ජී.එස්.සී. ජයරත්න මයා -සාමාජික

**2016.05.04 දින පැවති 2016/02 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම**

1. ආර්.එම්.පී.කේ නාමල් බණ්ඩාර මයා -භාණ්ඩාගාර නියෝජිත
2. එන්.එස් වනසිංහ මයා -අමාත්‍යංශ නියෝජිත
3. ඩබ්.එම්.වයි.ටී.ප්‍රනාන්දු මෙය -සමාජික
4. එම්.ජී.එස්.සී. ජයරත්න මයා -සාමාජික

**2016.09.27 දින පැවති 2016/03 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම**

1. ආර්.එම්.පී.කේ නාමල් බණ්ඩාර මයා -භාණ්ඩාගාර නියෝජිත
2. එන්.එස් වනසිංහ මයා -අමාත්‍යංශ නියෝජිත
3. ඩබ්.එම්.වයි.ටී.ප්‍රනාන්දු මෙය -සමාජික
4. එච්.ජී.එස්.සී.ජයරත්න -සමාජික

**2016.12.09 දින පැවති 2016/04 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම**

1. ආර්.එම්.පී.කේ නාමල් බණ්ඩාර මයා -භාණ්ඩාගාර නියෝජිත
2. එන්.එස් වනසිංහ මයා -අමාත්‍යංශ නියෝජිත
3. ඩබ්.එම්.වයි.ටී.ප්‍රනාන්දු මෙය -සමාජික
4. එච්.ජී.එස්.සී.ජයරත්න -සමාජික

විගණකාධිපතිවරායාගේ නියෝජිතයකු හා ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා රැස්වීම සඳහා සහභාගී වූහ. කමිටුවෙහි, කළමනාකරණය නියෝජනය කරන සාමාජිකයින් කිසිවෙකු නොමැත. අධ්‍යක්ෂ ජනරාල්වරයා ආරාධනයෙන් රැස්වීම සඳහා සහභාගි වේ.කළමනාකරණයේ අනෙකුත් සාමාජිකයින්ගේ සහභාගීත්වය කමිටුවට අවශ්‍ය වූ විට, රැස්වීම සඳහා සහභාගී වීමට ආරාධනා කරනු ලබයි.කමිටුවෙහි ගණපූර්ණය සාමාජිකයින් 03 කි.

## 6.2 කමිටුවෙහි කාර්යය භාරය

- පූර්ව අවසාන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව සමාලෝචනය කරමින් කමිටු උපදෙස් සහ නිර්දේශ නිසි පරිදි ක්‍රියාත්මක කිරීම පිළිබඳ විමසා බැලීම.

- ආකෘති සහ අන්තර්ගතය සමාලෝචනය කිරීම සහ පොල් සංවර්ධන අධිකාරියෙහි මූල්‍ය වාර්තාකරණ ක්‍රමයෙහි විශ්වසනීයත්වය අධීක්ෂණයට ලක් කිරීම.

- බාහිර සහ අභ්‍යන්තර විගණන කාර්යයෙහි විෂය මූලිකත්වය හා සඵලදායකත්වය සහතික කිරීම සඳහා යොදා ඇති ක්‍රියා මාර්ග නියාමනය හා සමාලෝචනය කිරීම.

- අභ්‍යන්තර පාලනයන්හි යෝග්‍යතාවය සහ සාර්ථකත්වය සමාලෝචනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

- අභ්‍යන්තර විගණන වාර්තා,බාහිර විගණන විමසුම් හා ඒ සඳහා ගන්නා ලද පියවර සමාලෝචනය කිරීම.

- නියාමන සහ මුල්‍ය වාර්තාකරණ අවශ්‍යතා සමඟ අනුගත වීම සහ අදාළ නියාමන අධිකාරීන් සමඟ පවත්නා සම්බන්ධතා සහතික කිරීම සඳහා වන ආචාර ධර්මානුකූල ප්‍රමිතීන් හා ක්‍රියාපරිපාටීන් පිළිබඳ සමාලෝචනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

## 6.3 රැස්වීම් සහ ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂය තුළහතරවරක්(04) කමිටුව හමුවන ලදී. රැස්වීම සඳහා කමිටු සාමාජිකයන්ගේ පැමිණීම පහත සඳහන් පරිදි වේ.

| අධ්‍යක්ෂවරයාගේ නම | සහභාගී වූ ගණන |
|---|---|
| ආර්.එම්.පී.කේ.නාමල් බණ්ඩාර මයා | 04 |
| එන්.එස් වනසිංහ මයා | 04 |
| ඩබ්.එම්.වයි.ටී.ප්‍රනාන්දු මිය | 04 |
| එච්.ජී.එස්.සී.ජයරත්න මයා | 04 |

සමාලෝචිත වර්ෂය කමිටුව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාවට නංවන ලදී.

### 6.3.1 අභ්‍යන්තර විගණනය

- අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු වලට අදාලව 2016 වර්ෂය සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිර්දේශයන්ද සැලකිල්ලට ගනිමින් පිළියෙළ කරනු ලැබූ අභ්‍යන්තර විගණන වැඩසටහන සහ විගණන සැලැස්ම සාකච්ඡාවට භාජනය කර, වැඩිදුරටත් විගණනයට භාජනය කලයුතු ක්ෂේත්‍රයන් පිළිබඳ උපදෙස් දීම සහ විගණන වැඩසටහන සහ විගණන සැලැස්ම මණ්ඩලීය අනුමැතිය සඳහා නිර්දේශ කිරීම.
- 2016 වර්ෂය සඳහා වන අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙහි සඵලදායකත්වය අධීක්ෂණයට ලක් කරන ලදී.
- අනාගතයේදී නැවත සිදුවීම් වළක්වනු පිණිස කාලීන නිරවද්‍ය පියවරයන් ගැනීමේ අරමුණින් යුතුව විශේෂ අභ්‍යන්තර විගණන සොයාගැනීම් හා ඒවා සඳහා කළමණාකරණයේ ප්‍රතිචාර සමාලෝචනයට ලක් කරන ලදී.
- ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා සැලකිල්ලට ගැනීමේදී, අධිකාරියේ සියළුම අංශ සම්බන්ධ වන පරිදි විධිමත් ආරක්ෂා සහිත දත්ත පද්ධතියක් අධිකාරියට අවශ්‍ය බවත්, ඒ මගින් වැරදි සහ වංචා සිදුවීම වැලැක්වීමටත්, ඵලදායීව හා කාර්යක්ෂව කටයුතු සිදුකිරීමටත් උපකාර වන බව විගණන හා කළමනාකරණ කමිටුව පෙන්වා දෙන ලදී.

### 6.3.2 බාහිර විගණනය

- 2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පොල් සංවර්ධන අධිකාරිය සම්බන්ධයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් වලට අදාලව කළමනාකරණය විසින් දක්වන ලද පිළිතුරු සමාලෝචනයට ලක් කරන ලද අතර, විශේෂයෙන් පෙන්වාදෙන ලද ගැටළු නැවත ඇති වීම වළක්වනු පිණිස කළමනාකරණය විසින් ගන්නා ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳව පසු විපරම් කරන ලදී.

### 6.3.3 මූල්‍ය වාර්තාකරණය

- වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණ හා නියාමන අධිකාරිය විසින් නියම කරන ලද අවශ්‍යතාවයන්ට හා අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇති බවට සහතික කිරීමේදී මණ්ඩලයට සහයවන ලදී.

### 6.3.4 රැස්වීම් වාර්තා/ මණ්ඩලයට වාර්තා කිරීම්

- කමිටු පැවැත්වීම පිළිබද යෝග්‍ය රැස්වීම් වාර්තා මණ්ඩලීය ලේකම් කාර්යාලයෙහි පවත්වාගෙන යනු ලැබේ.රැස්වීම්වල සියළුම වාර්තා සභාගත කරන ලද අතර, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සම්මත කර ගන්නා ලදුව කමිටුව විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලීය අනුමැතිය ලබා ගනු ලැබේ.ක්‍රමික පදනමක් මත කැපී පෙනෙන කරුණු සම්බන්ධයෙන් පසු පියවරයන් ගනු ලැබේ. අධිකාරියෙහි අනුගත රාමුවට සහ යෝග්‍ය අවස්ථාවන්හිදී ගන්නා ලද නිවැරදි කිරීමේ සහ වළක්වාලීමේ පියවරයන් සම්බන්ධයෙන් පසුවිපරම් සිදුකර ඇත.

අභ්‍යන්තර විගණන අංශය මගින් 2016.01.01 දින සිට 2016.12.31 දින දක්වා සිදුකල විගණන පරීක්ෂණ වලට අදාලව ඉදිරිපත් කරන ලද වාර්තාවල සාරංශගත වාර්තාව

| දිනය | විගණන පරීක්ෂණය හා අනාවරණය වූ කරුණු | ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|---|
| 2016.03.08 | **භෞතික මුදල් ආගණනයක් සිදු කිරීම - 2016.03.08**<br>පොල් සංවර්ධන අධිකාරියේ පවතින පහත ගිණුම් වලට අදාල අතැති මුදල් සම්බන්ධයෙන් භෞතික මුදල්/ චෙක්පත් හා ලිපිගොනු විගණන පරීක්ෂාවක් සිදුකරන ලදි.<br>- සුළු මුදල් අග්‍රිමය<br>- පොදු ගිණුම මුදල් ලැබීම්/ ගෙවීම්<br>- සෙස් ගිණුම මුදල් ලැබීම් | භෞතික ශේෂය සහ පොත්වල ශේෂය අතර වෙනස්කම් වාර්තා වී නොමැත. |
| 2016.04.07 | ගෙඩිපොල් අපනයනයට අදාලව අයකරන ලද රු:10/= ක මුදලින් රු:5/= ක මුදල් ආපසු ගෙවීම<br><br>ගෙඩිපොල් අපනයනය කරනු ලබන ආයතන දෙකක් සඳහා අදාල මුදල් ගෙවීමට සකස් කරන ලද වවුචර්පත්වල ගෙවීම් නිවැරදිතාවය පරීක්ෂා කිරීම | විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ වැරදි නිවැරදිකර අදාල මුදල් ගෙවීමට කටයුතු කර ඇත. |
| 2016.04.19 | **ගෙඩි පොල් අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම හා මෙහෙයුම් ගාස්තු අයකිරීම - 2015 මැයි සිට සැප්තැම්බර් දක්වා**<br>1. ගෙඩිපොල් අපනයනයකට අදාලව මෙහෙයුම් ගාස්තු අයකිරීමට අතපසු වීම.<br>2. පරිඝනක දත්ත පද්ධතියට දත්ත ඇතුලත් කිරීමේ දුර්වලතා පැවතීම.<br>3. අපනයනයට අදාල මූලික තැන්පතුව 25% ට වඩා අඩුවන අවස්ථා වලදී අපනයනකරුවන් වෙත ලිඛිතව දැනුම්දීමක් හෝ අපනයනය අත්හිටුවීමක් සිදුකොට නොතිබීම.<br>4. අධිකාරිය නිකුත්කල සහතිකපත් ව්‍යාජ ලෙස සකස්කොට අපනයනය සිදුකිරීම අනාවරණය විය. | - පරිඝණක දත්ත පද්ධතිය නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගැනීම.<br>- විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති ගාස්තු නිසි ලෙස අය නොවීම නිවැරදිව අයකර ගැනීමට කටයුතු කර ඇත..<br>- අපනයනකරුවන්ගෙන් වැඩියෙන් අයකර ගෙන ඇති මුදල් ආපසු ඔවුන් වෙත ගෙවීමට කටයුතු කර ඇත.<br>- මේ වනවිට කළමනාකාරිත්වය විසින් අධිකාරියේ විධිමත් දත්ත පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකරමින් පවතී. |

| දිනය | විගණන පරීක්ෂනය හා අනාවරණය වූ කරුණු | ගෙන ඇති ක්‍රියාමාර්ග |
| --- | --- | --- |
| 2016.05.27 | **ඩියුක් වීදිය ගොඩනැගිල්ලේ 03 වන මහලේ ප්‍රධාන දොර විවෘත කිරීම සම්බන්ධව සිදුකරන ලද විශේෂ පරීක්ෂණය**<br>1. මෙය කාර්යාල කාර්ය සහායක හෝ වෙනත් නිලධාරියෙකුගේ නොසැලකිල්ල මත හෝ හිතාමතා සිදුකල ක්‍රියාවක් බව අනුමාන කලහැකි වීම.<br>2. පරිඝණක යන්ත්‍රවල කේබල් ගැලවීම හැර වෙනත් හානියක් සිදුවී නොතිබීම.<br>මෙම සිදුවීම ඇතිවූ වහාම ආරක්ෂක අංශය වෙත දැනුම්දීමට අවශ්‍ය පියවර නොගැනීම. | - යතුරු විධිමත්ව ලබාගැනීම/ බාරදීමට අවශ්‍ය අවශ්‍ය උපදෙස් ලබාදීම. |
| 2016.06.08 | **භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථාවර තැන්පතු පරීක්ෂාව**<br>1. භාණ්ඩාගාර බිල්පත් නැවත ආයෝජනය සඳහා නිසි පරිදි අනුමැතිය ලබාගෙන නොතිබීම.<br>2. භාණ්ඩාගාර බිල්පත්, ආයෝජන ලෙජරයේ සටහන් නොවීම.<br>3. ස්ථාවර තැන්පතු ආයෝජනයේදී ලැබෙන පොලී ප්‍රතිශතය සහ බදු අයකිරීම සම්බන්ධයෙන් අවධානය යොමු නොකිරීම නිසා එකම දින බැංකු 2ක පොලී ප්‍රතිශතයන් දෙකක් යටතේ ආයෝජනය කිරීමක් නිරීක්ෂණය විය. | - නිසි පරිදි අනුමැතිය ලබාගෙන නැවත ආයෝජනය කිරීම, කල්පිරුණු පසු මුදල් ලබාගැනීම, වට්ටම් කර මුදල් ලබාගැනීම, සභාපති/අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ලිඛිත අනුමැතිය මත සිදුකරන ලෙස උපදෙස් ලබාදීම.<br>- ආයෝජනයේදී ලැබෙන පොලී ප්‍රතිශතය සම්බන්ධයෙන් සහ බදු අනුපාත පිළිබඳ සැලකිලිමත් වී ආයෝජන කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබාදීම. |
| 2016.07.05 | **භෞතික තොග ගණනයක් සිදුකිරීම- 2016.07.05** | තොග ඌණතාවයක් හෝ අතිරික්තයක් වාර්තා වී නොමැත. |
| | **භෞතික මුදල් ආගණනයක් සිදුකිරීම - 2016.07.05** | භෞතික ශේෂය සහ පොත්වල ශේෂය අතර වෙනස්කම් වාර්තා වී නොමැත. |

| දිනය | විගණන පරීක්ෂණය හා අනාවරණය වූ කරුණු | ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|---|
| 2016.07.12 | **කප්රුක නිපැයුම්දිරිය සහ කප්රුක ජය ඉසුර ණය යෝජනා ක්‍රම- ණය ලබාදීම සහ පොලී සහන ලබාදීම**<br>1. බැංකුව විසින් ණය මුදල් ලබා නොදීමට හේතුවූ කරුණු සම්බන්ධයෙන් බැංකුව වෙතින් විමසීම් කිරීම සඳහා අවධානය යොමුකිරීමට ප්‍රමාදවීම නිසා ණය මුදල් කඩිනමින් ලබාදීමට නොහැකි වීඹ.<br>2. ඇතැම් ණය නිදහස් කිරීම් වලට අදාල ලියකියවිලි පරිඝණක පද්ධතියට ඇතුලත් කර නොතිබීම.<br>3. ගිවිසුම ප්‍රකාරව ණය ඉල්ලුම්කරුවන්ගේ ව්‍යවසාය සංවර්ධන/ තාක්ෂණික/ ව්‍යාපාර කළමනාකරණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක නොවීම. | - බැංකුව වෙතින් විමසීම් කර අදාල නිවැරදිකිරීම් සිදුකිරීමට අදාල තහවුරුවක් බැංකුව වෙතින් ලබාගැනීමට කටයුතු කර ඇත.<br>- පරිඝණක දත්ත පද්ධතියට දත්ත ඇතුලත් කිරීමට පියවර ගෙන ඇත.<br>- පසුවිපරම් වාර්තා කඩිනමින් ලබාගැනීමට පියවර ගැනීම. |
| 2016.07.14 | **කප්රුක නිපැයුම්දිරිය සහ කප්රුක ජය ඉසුර ණය යෝජනා ක්‍රම- ණය ලබාදීම සහ පොලී සහන ලබාදීම**<br>1. 2016 වර්ෂයේදී මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදීමේ ප්‍රගතිය සහ මූල්‍ය ඉලක්කයන් කරා ළඟාවීම ඉතා පහල මට්ටමක පැවතීම.<br>2. පසු විපරම් වාර්තා ලබාගැනීමේ ප්‍රමාදයක් පැවතීම.<br>3. පරිඝණක පද්ධතියට දත්ත ඇතුලත් කිරීමේ අඩුපාඩු පැවතීම. | |
| 2016.08.09 | **ගෙඩිපොල් අපනයනය සඳහා තැන්පත් කර ඇති මුදල් නැවත ලබාදීම**<br>ගෙඩිපොල් අපනයනකරුවන් 3 දෙනෙකු වෙත මුදල් ගෙවීම සඳහා සකස් කරන ලද ගෙවීම් වවුචර්පත් වල ගණනය කිරීම් නිවැරදි නොවීම. | හඳුනාගත් වැරදි ගණනයකිරීම් නිවැරදි කර ගෙවීම් කිරීම සිදුකොට ඇත. |
| 2016.08.10 | **දිසිඳි පොල් ආදර්ශ/ කොහු හා කොහුබත් ආශ්‍රිත නිෂ්පාදන සඳහා තත්ත්ව සහතික/ අපනයන සහතික නිකුත්කිරීම**<br>අපනයනකරුගේ ඉල්ලීම මත සිදුකරනු ලබන දිසිඳි පොල් ආදර්ශ පරීක්ෂා කිරීමට අදාලව නිකුත්කරනු ලබන සහතිකය(ලිපි) අපනයනය සිදුකිරීමට අපේක්ෂිත දිනට පසුව නිකුත් කිරීම සහ අපනයනකරු විසින් අදාල සහතිකය ඉල්ලුම්කිරීම ප්‍රමාදව සිදුවීම. | පවතින ප්‍රමාද තත්ත්වයන් වළක්වා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදීම. |

| දිනය | විගණන පරීක්ෂණය හා අනාවරණය වූ කරුණු | ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|---|
| 2016.08.15 | **දිසිදි පොල් ආදර්ශ අධිකාරිය වෙත රැගෙන ඒම/ දිසිදි පොල් ආදර්ශ කොහු හා කොහුබත් ආශ්‍රිත නිෂ්පාදන සඳහා තත්ත්ව සහතික/ අපනයන සහතික නිකුත් කිරීම**<br>1. දිසිදි පොල් ආදර්ශ අධිකාරිය වෙත රැගෙන ඒමේදී ප්‍රමාදයන් පැවතීම.<br>2. කොහු හා කොහුබත් ආශ්‍රිත නිෂ්පාදන සඳහා නිකුත් කරනු ලබන තත්ත්ව සහතික විධිමත්/ සම්මත ආකෘතියකට අනුව නිකුත් නොකිරීම. | - අදාල කුරියර් සේවාව වෙත දන්වා ඇති අතර, මේ වන විට ප්‍රමාදවීම් අවමකර ගැනීමට කටයුතු කොට ඇත. |
| 2016.11.02 | **ජල ආදර්ශ සඳහා ISO 17025 සහතිකකරණය ලබාගැනීම**<br>1. රසායනාගාර නවීකරණ කටයුතු වලට සමගාමීව ISO 17025 සහතිකකරණය සඳහා වන නවීකරණ කටයුතුද සිදුකිරීමට සැලසුම් කර ඇති අතර, මේ දක්වා රසායනාගාර නවීකරණ කටයුතු සිදුවී නොමැති බැවින්, ජල ආදර්ශ සඳහා ISO 17025 සහතිකකරණය ලබාගැනීමේ කටයුතුද සැලසුම් කල ආකාරයට සිදු වී නොතිබීම.<br>2. ISO 17025 සහතිකකරණය ලබා ගැනීම සඳහා රසායනාගාර නවීකරණ කටයුතු සහ පුහුණු වැඩසටහන් සඳහා අඩු මූල්‍ය ප්‍රගතියක් පෙන්නුම් කිරීම.<br>3. ජල ආදර්ශ වෙනුවෙන් ISO 17025 සහතිකකරණය ලබා ගැනීමට අවශ්‍ය Method Manual සකස් කිරීම් කටයුතු 2016 ඔක්තෝම්බර් මාසය අවසන් වන විටත් අවසන්ව නොතිබීම. | අදාල කාර්තුවල සඳහන් ආකාරයට භෞතික සහ මූල්‍ය ප්‍රගතිය ලඟාකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබාදීම. |
| 2016.11.07 | **පොල්තෙල් කර්මාන්තයේ තත්ත්වය වැඩිදියුණු කිරීම**<br>1. රසායනාගාරය මගින් සිදු කරනු ලබන පොල්තෙල් ආදර්ශ පරීක්ෂා කිරීම සඳහා නිශ්චිත කාල පරාසයක් නොමැති වීම සහ පරීක්ෂණ ප්‍රතිඵල ලබාදීමට කල්ගත වීම.<br>2. රසායනාගාරය විසින් අධිකාරියේ ලියාපදිංචි සහ ලියාපදිංචි නොවූ තෙල්මෝල් වලින් ලබා ගන්නා ලද පොල්තෙල්, පුන්නක්කු සහ කොප්පරා වල ආදර්ශයන් පරීක්ෂා කිරීම් වලට අදාල පරීක්ෂණ වාර්තා සැකසුම් සංවර්ධන අංශය වෙත යොමු කිරීමට කල් ගත වීම.<br>3. අධිකාරියේ ලියාපදිංචි/ ලියාපදිංචි වී නොමැති පොල්තෙල් මෝල් වලින් ආදර්ශ ලබාගැනීම සිදුකර ඇති අතර, එම පොල්තෙල් මෝල් තෝරාගැනීමේදී ඒ සම්බන්ධ සැලසුම්ගත ක්‍රමවේදයක් නොමැතිවීම. | අප්‍රමාදව වාර්තා නිකුත්කිරීමට අවශ්‍ය පියවර ගැනීමට අධීක්ෂණ නිලධාරීන් වෙත උපදෙස් ලබාදීම. |

| දිනය | විගණන පරීක්ෂණය හා අනාවරණය වූ කරුණු | ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|---|
| 2016.11.08 | **භෞතික තොග ගණනය**<br>1. 2016.10.10 දින විගණන නිලධාරීන් අධිකාරියේ ගබඩාවේ පවතින තොගය භෞතික ආගණනය සඳහා ගබඩාව වෙත ගියද, ගබඩාවේ පරිඝණකය ක්‍රියාවිරහිත වී තිබීම.<br>2. කඩිනමින් ක්‍රියාකාරී තත්ත්වයට පත්කල යුතුව පවතින මෙවැනි ක්‍රියාවිරහිත පරිඝණක හා පරිඝණක පැකේජ සම්බන්ධව පාලන අංශය විසින් කඩිනමින් යථා තත්ත්වයට පත්කිරීමට අවශ්‍ය පියවර ගත යුතු වුවත් මේ සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු වී නොතිබීම. | - මෙම ගැටළුව නිසා තොග ආගණනයක් සිදුකිරීමට නොහැකි විය.<br>- ගබඩාවේ පරිඝණක පද්ධතිය අළුත්වැඩියා කිරීම කොට යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. |
| 2016.11.21 | **අධිකාරියේ ආරක්ෂක කටයුතු පිළිබඳ පරීක්ෂාව**<br>1. ආයතනයට පිටතින් පැමිනෙන පුද්ගලයින් හඳුනාගැනීමට භාවිතා කරන Visitors Pass නිකුත් කිරීමක් දැනට ක්‍රියාත්මක නොකිරීම.<br>2. ආරක්ෂක අංශය විසින් වාර්තා කරනු ලබන සමහර පොත්පත් (රෙජිස්ටර්ස්) වල තොරතුරු යාවත්කාලීන කර නොමැති අතර, සමහර ලිපිගොනු ටිපෙක්ස් භාවිතා කර වෙනස් කර තිබීම.<br>3. ආරක්ෂක අංශය විසින් රාජකාරි කටයුතු සඳහා භාවිතා කරනු ලබන සමහර රෙජිස්ටර් වල ආරක්ෂක නිලධාරීන් විසින් අත්සන් යෙදිය යුතු ස්ථාන වල අත්සන් යොදා යාවත්කාලීන කර නොමැති බව නිරීක්ෂණ විය.<br>4. ප්‍රධාන කාර්යාලයේ දොර යතුර වගකීමකින් විධිමත්ව භාරදීමට/ භාරගැනීමට වැඩපිළිවෙලක් නොමැතිවීම.<br>5. අධිකාරියේ නාරාහේන්පිට කාර්යාලයේ භාවිතා වන ගිනි නිවීමේ උපකරණ නැවත පිරවිය යුතු දිනය 2016.04.26 සටහන් කර ඇති අතර, මේ පිළිබඳව එම ආයතනය සමඟ දුරකථනය මගින් විමසීමේදී නැවත පිරවිය යුතු කාලය සඳහන් අදාල ස්ටිකර් ඇලවීමට අතපසු වී තිබීම.<br>6. කොටුව කාර්යාලයේ 3 වන මහලේ ස්ථානගත කර ඇති ගිනි නිවීමේ උපකරණ යලි පිරවිය යුතු දිනය 2009/12 ලෙසත්, 1 වන සහ බිම් මහලේ 2011/12 ලෙසත් සඳහන්ව ඇති බැවින් ගිනි නිවීමේ උපකරණ සම්බන්ධයෙන් කිසිදු අවධානයක් යොමුකර නොතිබීම. | - නව සභාපති /අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සනින් යුතුව Visitors Pass නිකුත් කිරීමටත්, ඒ සඳහා අළුතින් Visitors Pass සැකසීමට අවශ්‍ය පියවර ගැනීමට උපදෙස් ලබාදීම.<br>- ආරක්ෂක අංශය භාවිතා කරන පොත්/ රෙජිස්ටර්ස්/ ලිපිලේඛණ වල තොරතුරු ටිපෙක්ස් භාවිතා කර වෙනස් නොකරන ලෙසත්, වෙනස් කිරීමට අවශ්‍ය නම් අදාල වචනය තනි ඉරකින් කපා පැහැදිලිව ලියා වෙනස් කල ස්ථානයේ කෙටි අත්සන යෙදීමටත් උපදෙස් ලබාදීම.<br>- අධිකාරියේ පවතින ගිනි නිවීමේ උපකරණ සහ ආරක්ෂක උපකරණ යාවත්කාලීනව පවත්වාගැනීම සහ ඒවා කල් ඉකුත් වන දිනය සම්බන්ධව අවධානය යොමු කරමින් කටයුතු කිරීමට උපදෙස් ලබාදීම. |

| දිනය | විගණන පරීක්ෂණය හා අනාවරණය වූ කරුණු | ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|---|
| 2016.11.21 | **පොල් වෙන්දේසි පැවැත්වීම සහ අන්තර්ජාලය හරහා පොල් වෙන්දේසි පැවැත්වීම**<br>1. කොළඹ පොල් වෙන්දේසිය සිදුකිරීම 2016.08.30 දින ගිවිසුම අනුව පවරන ලද කේ.ජේ.එස්. ගුණවර්ධන මහතා විදේශගත වී ඇති බැවින් ඒ වෙනුවට ආර්.එස්. සමරසිංහ මහතා සිදුකරන ලද අතර, ඔහු පොල් වෙන්දේසියෙන් පොල් මිලදී ගන්නා අයෙකු බව නිරීක්ෂණය විය.<br>2. කුරුණෑගල වැවිලි සමාගම විසින් ප්‍රමාණාත්මකව අඩු පොල් ගෙඩි සංඛ්‍යාවක්ද (දොඩම්ගස්ලන්ද විජේපුර වත්තේ පොල්ගෙඩි 07 ක් සහ වැටුණු පොල්ගෙඩි 37 ක් වශයෙන් පොල්ගෙඩි 44 ක්) වෙන්දේසිය සඳහා ඉදිරිපත් කර තිබීම.<br>3. 2016.11.01 දින පැවති පොල් වෙන්දේසියේදී විකුණුම්කරුවන් විසින් පොල් තොග ඉදිරිපත් කලද online මගින් කිසිදු ගැණුම්කරුවකු ඒ සඳහා ප්‍රතිචාර දක්වා නොතිබීම.<br>4. විධිමත් අධ්‍යනයකින් තොරව මෙම වෙන්දේසි කටයුතු ආරම්භ කර තිබීම. | මේවන විට කොළඹ පොල් වෙන්දේසිය සඳහා ස්වාධීන පොල් වෙන්දේසිකරුවකු මගින් වෙන්දේසි කටයුතු සිදු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.<br>- |
| 2016.10.21 | **රාජකාරි පැවරීම පිළිබඳව දෝෂාරෝපනය කිරීම සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් පැවැත්වීම.** | |
| 2016.12.28 | **බැහැර රාජකාරියේ යොදවා තිබියදී එකී රාජකාරිය සඳහා බැහැර යාමට ප්‍රමාද වූ කරුණක් සම්බන්ධයෙන් රියදුරු මහතෙකු විසින් සිදුකරන ලද පැමිණිල්ල සම්බන්ධ මූලික පරීක්ෂණයක් සිදුකර ඇත.** | අදාල වාර්තාව කළමනාකාරිත්වය වෙත ඉදිරිපත්කොට ඇත. අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. |
| 2017.01.19 | **පොල්කටු සහ පොල්ලෙලි එකතුකිරීමේ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.**<br>1. 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව භෞතික ප්‍රගතිය ලභාකරගෙන ඇතත් මූල්‍ය ප්‍රගතිය පහල මට්ටමක පැවතිම.<br>2. අදාල වැඩසටහන් දිසුත්‍රික්ක 18 ක ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කලද දිස්ත්‍රික්ක 08 ක පමණක් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් මෙම කර්මාන්තය දීපව්‍යාප්තව සිදුවී නොතිබීම.<br>3. මෙම මධ්‍යස්ථාන වල ක්‍රියාකාරිත්වය ඇගයීමට එම තොරතුරු ලබාගැනිම සඳහා නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම.<br>4. පොල්කටු එකතුකිරීම සඳහා මිලදීගෙන තිබූ බෑග් 2016.12.31 දින වන විටත් බෙදාදී නොතිබීම සහ අදාල මධ්‍යස්ථාන සඳහා නාම පුවරු ලබාදීමට වෙන්කර තිබූ මුදල් 2016 වර්ෂය අවසාන වනවිටත් අදාල කාර්ය සඳහා යොදාගෙන නොතිබීම. | - අනෙකුත් දිස්ත්‍රික්ක තුලද මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමට උපදෙස් ලබාදීම.<br>- පිහිටුවා ඇති මධ්‍යස්ථානවල ක්‍රියාකාරිත්වය ඇගයීමටත්, මාසික නිෂ්පාදන තොරතුරු ලබාගැනීම සඳහාත් කඩිනම්නි පියවර ගැනීමට උපදෙස් ලබාදී ඇත.<br>- මේවන විට අදාල බෑග් බෙදාදීමටත්, නාමපුවරු සකස්කොට මධ්‍යස්ථාන වලස්ථාපිත කිරීමටත් කටයුතු සිදුකරමින් පවතී. |

| දිනය | විගණන පරීක්ෂණය හා අනාවරණය වූ කරුණු | ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|---|
| 2017.02.13 | **පොල් ආශ්‍රිත අපනයනකරුවන් ලියාපදිංචි කිරීම-2016**<br>1. අපනයනයකරුවකු ලෙස ලියාපදිංචිය සඳහා අවශ්‍ය පරීක්ෂණ වාර්තා ප්‍රමාදවීම සහ ලියාපදිංචි සහතික නිකුත්කිරීම ප්‍රමාදවීම.<br>2. නිෂ්පාදන කර්මාන්ත ලියාපදිංචි සහතිකයේ වලංගු කාල සීමාව පිළිබඳ සැළකිලිමත් නොවී වර්ෂය සඳහාම අපනයනය සඳහා අවසර ලබාදීම.<br>3. අපනයනකරුවකු ලෙස වාර්ෂික ලියාපදිංචිය සඳහා ඉල්ලුම්කිරීමේදී ලියාපදිංචි අයදුම්පත්‍රයේ සඳහන් නොවන ඇතැම් නිෂ්පාදනයන් අපනයනය සඳහා ලියාපදිංචි සහතිකය මගින් අවසර ලබාදී තිබීම. | - පරීක්ෂණ වාර්තා කඩිනමින් ලබාගැනීමට පියවර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.<br>- ලියාපදිංචි සහතිකයේ වලංගු කාල සීමාව සම්බන්ධයෙන් අවධානය යොමුකරමින් අපනයනය සඳහා අවසර ලබාදීමට අවශ්‍ය පියවර ගැනීමට උපදෙස් ලබාදීම. |
| 2017.02.13 | **අපනයනකරුවන් සඳහා සහන සැලසීම**<br>1. අපනයන බලපත්‍ර නිකුත්කිරීම් වලට අදාල රෙජිස්ටරය සහ No objection letters අනුව නිකුත්කර ඇති බලපත්‍රවල අනුක්‍රමික අංක පිළිවෙලෙහි අඩුපාඩු පැවතීම.<br>2. TIEP ක්‍රමය යටතේ අනුමැතීන් 06 ක් ලබාදීමට සැලසුම්කර ඇතත් වර්ෂය තුල බලපත්‍ර 4 ක් පමණක් නිකුත්කර තිබීම.<br>3. තාවකාලික අපනයන බලපත්‍ර මගින් දිගින් දිගටම අපනයනයන් සිදුකර තිබීම. | - අපනයන බලපත්‍රවල අනුක්‍රමික අංක කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් අනුක්‍රමිකව කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදීම.<br>- තාවකාලික අපනයන බලපත්‍ර මගින් අපනයනයන් සිදුකිරීම සීමා කිරීමට පියවර ගැනීමට උපදෙස් ලබාදීම. |
| 2017.02.13 | **අලෙවිකරණ තොරතුරු ලබාදීම**<br>1. සැලසුම් කර ඇති ආකාරයෙන් අදාල භෞතික ඉලක්කයන් සම්පූර්ණ කර ඇති බව නිරීක්ෂණය විය.<br>2. අලෙවිකරණ තොරතුරු භාහිර පාර්ශවයන් වෙත ලබාදීම සඳහා සකස්කරනු ලබන පොල් සංඛ්‍යාති වාර්තා කුමන ප්‍රමාණයක් 2016 වර්ෂය තුල මුද්‍රණය කර තිබේද යන්න ලිපිගොනු වලින් අනාවරණය නොවීම. | - වර්ෂය තුල මුද්‍රණය කරනු ලබන වාර්තා ප්‍රමාණය, අලෙවි වී ඇති වාර්තා ප්‍රමාණය සහ ඉතිරි වාර්තා ප්‍රමාණය පිළිබඳ තොරතුරු පැහැදිලිව අනාවරණය කරගැනීමට හැකිවන පරිදි වාර්තා පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීමට උපදෙස් ලබාදීම.<br>- අලෙවිකරණ තොරතුරු බාහිර පාර්ශවයන්ට ලබාදීම සඳහා අදාල වාර්තා අලෙවිය ඉහල නැංවීම සඳහා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශය පියවර ගැනීමට උපදෙස් ලබාදීම. |

මගේ අංකය / எனது இல. / My No. } පීඑල්ඒ/ඩී/සීඩීඒ /1/2016/02 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2017 අගෝස්තු 17 දින

සභාපති

පොල් සංවර්ධන අධිකාරිය

**පොල් සංවර්ධන අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

පොල් සංවර්ධන අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 43 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2017 අප්‍රේල් 06 දින නිකුත් කරන ලදි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනිම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින් වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට පොල් සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

(අ) ප්‍රමිතයේ 49 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය කිරීමේදී එම වත්කම අයත්වන දේපළ, පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතුය. එසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට වටිනාකම පිළිවෙලින් රු. 226,305,369 ක් හා රු. 274,738,714 ක් වූ ඉඩම් සහ ගොඩනැගිලි වලින් කොටුව ආදිපාද වීදියේ පිහිටි ඉඩම් හා ගොඩනැගිලි පමණක් 2012 වර්ෂයේ දී ප්‍රත්‍යාගණනයකර ගිණුම්වල ගලපා තිබුණි.

(ආ) ප්‍රමිතයේ 65වන වගන්තිය පරිදි ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 60,430,940 ක් වටිනා මෝටර් වාහන සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති කාර්යාල ලී බඩු උපකරණ ආරම්භක ශේෂය හා මිල දී ගැනීම් පිළිවෙලින් රු. 29,332,629 ක් හා රු. 2,929,930 ක් වූ අතර ස්ථාවර වත්කම් ලේඛනය අනුව ආරම්භක ශේෂය හා මිලදී ගැනීම් පිළිවෙලින් රු. 35,314,434 ක් හා රු. 2,749,920 ක් විය. මේ අනුව පිළිවෙලින් රු. 5,981,805 ක හා රු. 180,010 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

අධිකාරිය විසින් 2006 වර්ෂයේ දී ගොවි සමාගමකට ලබා දී ඇති රු. 2,000,000 ක මුදල ගිවිසුම් කොන්දේසි අනුව මාස 06 ක් ඇතුළත ආපසු ගෙවිය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානය වන විටද රු. 1,450,000 ක ලැබියයුතු ශේෂයක් පැවතිණි.

### 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 (2) වගන්තිය ප්‍රකාරව සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව අදාල කර නොගැනීම නිසා 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා සේවකයන් 207 ක් වෙනුවෙන් රු.5,914,009 ක අධිභාරයක් සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 96,418,633 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 169,146,980 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 72,728,347 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පරීක්ෂණ හා සැකසීම් ගාස්තු ආදායම රු. 91,587,176 කින් අඩුවීම හා පර්යේෂණ හා පුහුණු වියදම් රු. 18,669,679 කින් ඉහළයාම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ ඌනතාවයක් ඇති වී තිබුණ ද 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අතිරික්තයක් ඇති වී තිබුණි. කෙසේ වුව ද සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් හා රාජ්‍ය බදු සැලකීමේ දී 2012 වර්ෂයේ අධිකාරියේ දායකත්වය රු. 80,631,000 ක් වූ අතර එය 2015 වර්ෂය දක්වා ක්‍රමයෙන් වැඩි වී තිබුණි. 2016 වර්ෂයේ අධිකාරියේ දායකත්වය රු. 235,630,000 ක් විය. එය 2015 වර්ෂයට සාපේක්ෂව සියයට 27 ක පිරිහීමකි.

## 3.2 අධිකාරිය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

අධිකාරිය විසින් අධිකාරියට ලැබිය යුතු මුදල් සම්බන්ධයෙන් සමාගමකට සහ පුද්ගලයකුට එරෙහිව නඩු 2 ක් පවරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත අනුව අධිකාරියේ කාර්යයන් පහත දැක්වේ.

(අ) පොල් කර්මාන්තය සහ පොල් වගාවන් සිදු කරනු ලබන ඉඩම් ආර්ථික වශයෙන් ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් සංවර්ධන ප්‍රමුඛතා පිළිබඳව තීරණය කිරීම හා ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා අමාත්‍යවරයා වෙත සහාය ලබා දීම.

(ආ) එසේ තීරණය කරනු ලබන සංවර්ධන ප්‍රමුඛතාවලට අනුකූලව ව්‍යාපෘති හා යෝජනා ක්‍රම සකස් කිරීම හෝ සකස් කිරීම සඳහා සහාය වීම, ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා සහාය ලබාදීම, පනත යටතේ අමාත්‍යවරයා විසින් පිහිටුවා ඇති මණ්ඩලවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම, වාර්ෂික අයවැය අනුමත කිරීම හා ඔවුන් වෙත අරමුදල් ලබාදීම, නිසි කළමනාකරණ ගිණුම්කරණ පද්ධති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම සඳහා උපදෙස් ලබාදීම හා සහය ලබාදීම.

(ඇ) අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන සංවර්ධන ප්‍රමුඛතා හා ප්‍රතිපත්ති සම්බන්ධයෙන් මණ්ඩලවල ප්‍රගතිය ඇගයීම, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සමාන හිමිකම් හා කර්තව්‍ය ඉටුකරනු ලබන ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගීතාවයන්ට එළඹීම.

(ඇ) පොල් කර්මාන්තය හා එහි නිෂ්පාදන පිළිබඳ යම් අංශයක් හෝ පොල් වගාවන් සිදුකරනු ලබන ඉඩම් හා පොල් වගාවන් සඳහා ඉඩම් ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් විද්‍යාත්මක පර්යේෂණ සිදු කරනු ලබන යම් තැනැත්තෙකුට හෝ පුද්ගල මණ්ඩලයකට මූල්‍ය හා වෙනත් යම් ආකාරයක සහාය ලබාදීම හා එවැනි පර්යේෂණ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

(ඉ) පොල් කර්මාන්තය කෙරෙහි බලපාන හෝ අදාළ සියලු කාරණා පිළිබඳව අමාත්‍යවරයා වෙත උපදෙස් ලබාදීම සහ

(ඊ) පොල් කර්මාන්තය සංවර්ධනය කිරීම හා යළි පනගැන්වීම සඳහා අවශ්‍යයැයි අධිකාරියේ මතය වන යම් සියලු පියවර ගැනීම.

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ආයතනයේ අරමුණින් බැහැර ක්‍රියාකාරමක් ලෙස 1985 වර්ෂයේ දී පෞද්ගලික සමාගමක් වෙත ලබා දී තිබූ රු. 26,715,037 ක ණය මුදල වෙනුවෙන් ගෙවිය යුතු පොලී මුදල් සහ ණය වාරික ගෙවා නොතිබියදීත් එම සමාගම් වෙත නැවත පොලී රහිතව 2002 වර්ෂයේදී රු. 25,000,000 ක් හා 2004 වර්ෂයේදී රු. 6,600,000 ක් බැගින් රු. 31,600,000 ක ණය මුදලක් ලබා දී තිබූ අතර ඉන් රු. 31,550,000 ක් මේ දක්වාම අධිකාරියට අයනොවී පැවතුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්
------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් ලියාපදිංචිය අවලංගු කරන ලද දිසිදි මෝල්වල සංවර්ධන අරමුදල ජය ඉසුරු යෝජනා ක්‍රමයට යොදාගනු ලැබුවත් යම් දිසිදි මෝලක් නැවත ක්‍රියාත්මක කළහොත් එම මෝලට අදාල අරමුදල ප්‍රතිපූර්ණය කිරීම කළ යුතුය. නමුත් අක්‍රිය කරන ලද මෝල් සමාලෝචිත වර්ෂයේදී නැවත නිෂ්පාදනය අරඹා තිබුණද එම අරමුදල් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් දිසිදි නිෂ්පාදන සඳහා අයකරන කිලෝ ග්‍රෑමයකට ශත 20 බැගින් වූ මුදල වර්ෂ 40 කට පෙර සිට තීරණය කළ අතර කාලානුරූපව එම මුදල සංශෝධනය කිරීමට ක්‍රියාකර නොතිබුණි.

(ඇ) පොල් කිරි, පොල් කිරිපිටි, පොල් ක්‍රීම්, පාරිභෝගික ජනතාව අතර ප්‍රචලිත කිරීමේ වැඩසටහන වෙනුවෙන් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට රු.3,936,228 ක් හා රූපවාහිනී සංස්ථාවට රු. 9,344,832 ක් එකවර ගෙවා තිබූ නමුත්, පවත්වා තිබූ වැඩසටහන්වල පිරිවැය පිළිවෙලින් රු. 3,799,258 ක් හා රු. 2,284,800 ක් විය. ඒ අනුව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව හා රූපවාහිනී සංස්ථාව සතුව පිළිවෙලින් රු. 136,970 ක් හා රු. 7,060,032 ක් ඉතිරිව පැවතුණු අතර එම මුදල අයකර ගැනීමට හෝ ඒ වෙනුවට වෙනත් වැඩසටහන් පැවැත්වීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව අධිකාරිය විසින් ජංගම රසායනාගාර රථයක් රු. මිලියන 20 කට මිලදී ගැනීමට ඇස්තමේන්තුගත කර තිබූ අතර එම රථය මිලදී ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2014 ජූලි 30 දින ලැබී තිබුණද මිලදී ගැනීමේ කටයුතු මේ දක්වාම සිදුකර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ, පොල් නිෂ්පාදන සම්බන්ධ අපනයනකරුවන් ලියාපදිංචි වුව ද දීසිදී පොල් හැරුණු විට අනෙක් නිෂ්පාදන සඳහා තත්ත්ව පරීක්ෂාවක් අධිකාරිය විසින් සිදු කරනු නොලබන අතර අපනයනකරුගේ ඉල්ලීම මත පමණක් එවැනි පරීක්ෂාවක් සිදු කරයි.

(ආ) අධිකාරිය විසින් සැල්මොනෙල්ලා විෂගතවීම් පරීක්ෂා කිරීම සඳහා ISO තත්ත්ව සහතිකය ලැබී තිබුණද ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් අධිකාරියේ රසායනාගාරයේ තිබිය යුතු අත්‍යවශ්‍ය පරීක්ෂණ උපකරණ නොමැති වීම සහ අදාල විෂය අනුබද්ධ විශ්ලේෂකයන් නොමැති වීම නිසා වෙනත් පිළිගත් ආයතනයකින් දෙවන පරීක්ෂාවක් කරගැනීමට අධිකාරියට සිදු වී තිබුණි.

## 4.4 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් රු. 1,068,886 ක මුදලක් වියදම් කර 2014 ඔක්තෝබර් සවිකර ඇති සීසීටීවී කැමරා පද්ධතියේ කැමරා 32 කින් 19ක්ම ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි.

(ආ) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය අවසානයට බැංකු ජංගම ගිණුම්වල රු. 28,594,785 ක මුදලක් රඳවාගෙන තිබුණි.

## 4.5 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ කොටුව කාර්යාලයේ රාජකාරී කටයුතු සඳහා භාවිතා කරන ඩයලොග් දුරකථන දෝෂ සහගත සහ අක්‍රිය වී ඇති නිසා එවා විසන්ධි කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2016 ජනවාරි 28 දින ඉල්ලා තිබුණ ද ඒවා විසන්ධි කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2015 සැප්තැම්බර් 29 දින සිට 2016 පෙබරවාරි 29 දක්වා ඩයලොග් ආයතනයට රු. 529,907 ක් ගෙවා තිබුණි. තවද අධිකාරිය විසින් 2015 සැප්තැම්බර් ඩයලොග් දුරකතන සම්බන්ධතා ලබාගැනීමෙන් පසු භාවිතයෙන් ඉවත් කර තිබූ ටෙලිකොම් දුරකථන සම්බන්ධතා විසන්ධි නොකිරීම හේතුවෙන් දුරකථන සම්බන්ධතා 32 ක් වෙනුවෙන් 2015 වර්ෂය වෙනුවෙන් රු. 91,200 ක් ද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. 304,000 ක් ද වශයෙන් රු. 395,200 ක් ගෙවා තිබුණි.

(ආ) අධිකාරියේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් පරිබාහිර ආයතනයක් වෙත ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව එකක් රු.1.70 බැගින් ස්ටිකර් 1,625,000 ක් සහ ඒ එකක් රු. 1.85 බැගින් ස්ටිකර් 3,875,000 ක් මුද්‍රණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 9,931,250 ක වටිනාකම ඇති ඇණවුම් දෙකක් පෞද්ගලික ආයතනයකට ලබා දී තිබුණි. ඒ අනුව පිළිවෙලින් 2016 නොවැම්බර් 24 හා 2017 පෙබරවාරි 13 දින ලැබී තිබුණු මුළු ස්ටිකර් 5,500,000 ක තොගයෙන් 2017 මාර්තු 14 දින වන විට නිකුත් කර තිබුණේ ස්ටිකර් 375,000 ක් පමණි.

## 4.6 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 වසරේ සිට 2012 වසර දක්වා වූ කාලය තුළ සේවක අර්ථසාධක අරමුදල් සඳහා දායක මුදල් ගෙවීමේදී ජීවන වියදම් දීමනාව අදාල කර නොගැනීම නිසා ඒ අවස්ථාවේදී සේවකයන් විසින් ගෙවිය යුතුව තිබූ ජීවන වියදම් දීමනාවට අදාල සියයට 10 ක අර්ථසාධක අරමුදල් දායකය වන රු. 1,182,802 ක මුදල අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(ආ) සේවක භාරකාර අරමුදල් ගෙවීම් ප්‍රමාද වීම් මත හිඟ දායක මුදලින් සියයට 50 ක් අධිභාර ලෙස ගෙවිය යුතු වේ. ඒ අනුව අධිකාරිය විසින් විගණිත දිනය වන 2017 ජනවාරි 05 දින දක්වාම ගෙවා නොමැති සේවක භාරකාර අරමුදල් දායක වෙනුවෙන් ගෙවිය යුතු අධිභාරය රු. 708,624 ක් වේ.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය 258 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 193 ක් විය.

(ආ) 2009 වර්ෂයේ සිට විවිධ අමාත්‍යාංශ වෙත තාවකාලිකව නිදහස් කොට තිබුණු අධිකාරියේ කාර්යාල කාර්ය සහායකවරයෙක් වෙත ලබා දී ඇති රු. 204,886 ක ණය මුදල් ද අය කර ගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 අයවැය ලේඛනමය පාලනය

පසුගිය වර්ෂයේ තථ්‍ය වියදම් සමඟ සංසන්දනය කළ හැකි වන පරිදි අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩලය පරිපාලනය | අවශ්‍ය බඳවා ගැනීම් කටයුතු සිදු නොකිරීම. |

| | | |
|---|---|---|
| (ආ) | මෙහෙයුම් පාලනය | මෙහෙයුම් පාලනය අකාර්යක්ෂම වීම හේතුවෙන් අධිකාරියට ලැබිය යුතු ආදායම් අහිමි වී තිබීම. |
| (ඇ) | ගිණුම්කරණය | ගබඩා කටයුතු සඳහා භාවිතා කරන ගිණුම්කරණ පද්ධතිය නවීකරණය නොකිරීම. |
| (ඈ) | ලැබිය යුතු ගිණුම් | දිගුකාලීන ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඉ) | වත්කම් උපයෝජනය | වත්කම් කාර්යක්ෂම ලෙස භාවිතා නොකිරීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති